57 වන කාණ්ඩය
10 වන කලාපය

අඟහරුවාද
1964 සැප්තැම්බර් 1

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2157]

පෞද්ගලික මන්ත්‍රීගේ කෙටුම්පත් පනත [තී. 2173] :

**Oriental Studies Society, Colombo (Incorporation) Bill—**
[පී. බී. බාලසූරිය මයා.]

පළමුවන වර කියවන ලදි.

විසර්ජන කෙටුම්පත් පනත, 1964-65 [දහසයවන වෙන් කළ දිනය] [තී. 2174] :

ශීර්ෂ 72-81 සහ 82 වන ශීර්ෂය කාරක සභාව විසින් සලකා බලන ලදි.

පරිපූරක ඇස්තමේන්තු [තී. 2376]

විදුලි දෙපාර්තමේන්තු සංචිත අරමුදල [තී. 2384]

කල් තැබීමේ යෝජනාව [තී. 2385]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 10

செவ்வாய்க்கிழமை,
1 செப்ரெம்பர், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகாரபூர்வமான அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

விளுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2157]

தனி அங்கத்தவர் மசோதா [ப. 2173] :

Oriental Studies Society, Colombo (Incorporation) Bill—[திரு. பீ. பி. பாலசூரிய]:

முதன்முறை மதிப்பிடப் பெற்றது.

ஒதுக்கீட்டு மசோதா, 1964–65 [*ஒதுக்கப்பட்ட பதினாறும் நாள்*] [ப. 2174] :

குழுவில் ஆராயப்பெற்றது.

தலைப்பு 72–81 ; 88

குறை நிரப்பும் தொகை [ப. 2376]

அரசினர் மின்சாரத் திணைக்களத்திற்கு நிதியொதுக்கல் [ப. 2384]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2385]

---

Volume 57
No. 10

Tuesday,
1st September, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**ORAL ANSWERS TO QUESTIONS** [c. 2157]

**PRIVATE MEMBER'S BILL** [c. 2173] :

**Oriental Studies Society, Colombo (Incorporation) Bill**—[Mr. P. B. Balasuriya] :

**Read the First time.**

**APPROPRIATION BILL, 1964-65** [*Sixteenth Allotted Day*] [c. 2174] :

**Considered in Committee**

**Heads 72-81 ; 88**

**SUPPLEMENTARY SUPPLY** [c. 2376]

**FINANCIAL RESERVE FOR DEPARTMENT OF GOVERNMENT ELECTRICAL UNDERTAKINGS** [c. 2384]

**ADJOURNMENT MOTION** [c. 2385]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

**1964 සැප්තැම්බර් 1 වන අඟහරුවාදා**

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

## PAPERS PRESENTED

1963-64 අංක 39 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[ගරු පී. බී. ජී. කලුගල්ල]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1963-64 අංක 35 සහ 38 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[ගරු ඩී. එස්. ගුණසේකර]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1. (53 වන අධිකාරය වන) පොලිස් ආඥා පනතේ 28 අ වගන්තිය යටතේ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් සම්පාදනය කරන ලද නියෝග මාලාවක්.

2. 1963-64 අංක 36 සහ 37 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති හා රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට, ගරු ටී. බී. ඉලංගරත්න]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

## ORAL ANSWERS TO QUESTIONS

### විශ්‍රාම ලැබූ ටී. එම්. එස්. තෙන්නකෝන් ගුරු මහතාට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙන් ලැබිය යුතු දායක මුදල්

*திரு. ரி. எம். எஸ். தென்னக்கூன், இளைப்பாறிய ஆசிரியர் : அ. சே. ச. நி. சந்தா*

**MR. T. M. S. TENNAKOON, RETIRED TEACHER : P.S.P.F. CONTRIBUTION**

1. **ඩී. ජී. එච්. සිරිසේන මයා.** (අකුරන පළමුවන මන්ත්‍රී)

*(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*

(Mr. D. G. H. Sirisena—First Akurana)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අකුරන ඡන්දදායක කොට්ඨාශයේ මහ/කිරිවානාකැටිය පාසලේ සේවය කර 1964 ජූනි මස 30 වැනි දින විශ්‍රාම ලැබූ ටී. එම්. එස්. තෙන්නකෝන් මහතා (ලියාපදිංචි අංකය 11136) 1945 සිට 1961 දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවූ බව එතුමා දන්නවාද ? (ආ) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවූ දායක මුදල් ඔහුට ආපසු ගෙවන්නේ කවදාද ?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) அக்குறணைத் தேர்தற் றொகுதியில் உள்ள K/கிரிவானக் கெற்றியப் பாடசாலையில் கடமையாற்றி 1964, ஜூன் 30 ஆம் தேதியன்று இளைப்பாறிய திரு. ரி. எம். எஸ். தென்னக்கூன் (பதிவு இல. 11136) 1945 முதல் 1961 வரை அரசாங்க சேவைச் சகாயநிதிக்குப் பணஞ் செலுத்தியுள்ளாரென்பதை அவர் அறிவாரா? (ஆ) அரசாங்க சேவைச் சகாயநிதிக்கு அவர் செலுத்திய உதவு தொகைகள் எப்பொழுது அவருக்குத் திருப்பிக் கொடுக்கப்படும்?*

asked the Minister of Education: (*a*) Is he aware that Mr. T. M. S. Tennakoon (Regd. No. 11136) who was working at K/Kiriwanaketiya School in the Akurana electorate and who retired on the 30th June, 1964, contributed to the P.S.P. Fund from 1945 to 1961? (*b*) When will his P.S.P.F. contributions be refunded to him?

**ගරු පී. බී. ජී. කලුගල්ල** (අධ්‍යාපන ඇමති)

*(கௌரவ பி. பி. ஜீ. கலுகல்ல—கல்வி அமைச்சர்)*

(The Hon. P. B. G. Kalugalla—Minister of Education)

(අ) එසේය. (ආ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආපසු ලබාගැනීමට තෙන්නකෝන් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත අනුමැතිය සඳහා 64.5.21 වැනි දින භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අනුමැතිය ලත් වහාම මුදල් ආපසු ගෙවනු ලැබේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. විජයවර්ධන මහතා, මහ/යටිහලගල-උඩගම විද්‍යාලය**

*திரு. எஸ். விஜயவர்த்தன, கே/யட்டிகெலகல-உடகம வித்தியாலயம்*

**MR. S. WIJAYAWARDENA, K/YATIHELAGALA-UDAGAMA VIDYALAYA**

2. **සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහ/යටිහලගල-උඩගම විද්‍යාලයීය ගුරු මණ්ඩලයේ එස්. විජයවර්ධන මහතා දරණ ගුරු සහතිකය කුමක්දැයි එතුමා සඳහන් කරනවාද? (ආ) ඔහු 1963.1.1 වැනි දින සිට පළමු පෙළට උසස් කළ යුතුව තිබුණු බව එතුමා දන්නවාද? (ඉ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කරන ලද වරදකට, ඔහුට හිමි උසස් වීම් නොදීමත් වැටුප් වැඩිවීම් නැවැත්වීමත් අසාධාරණ බව එතුමා දන්නවාද? (ඊ) ඔහුගේ සාධාරණ ඉල්ලීම් ලබා දී යුක්තිය ඉටු කිරීමට එතුමා කටයුතු කරනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) கே/யட்டிகெலகல-உடகம வித்தியாலயத்தில் ஆசிரியராயுள்ள திரு. எஸ். விஜயவர்த்தன எத்தகைய ஆசிரியர் தராதரப்பத்திரத்தைக் கொண்டுள்ளாரென்பதை அவர் கூறுவாரா? (ஆ) 1.1.1963 இல் இருந்து அவருக்கு முதலாந்தரத்திற்குப் பதவியுயர்ச்சி யளிக்கப்பட்டிருக்க வேண்டுமென்பதை அவர் அறிவாரா? (இ) கல்வித் திணைக்கள உத்தியோகத்தர்களால் செய்யப்பட்ட தவறுகளின் விளைவாய் அவருக்குரிய பதவியுயர்ச்சியைக் கொடாது விடுவதும் சம்பள உயர்ச்சிகளை நிறுத்துவதும் நியாயமல்ல வென்பதை அவர் அறிவாரா? (ஈ) அவரது நியாயமான கோரிக்கைகளை வழங்குவது மூலம் நீதிவழங்குவதற்கு அவர் நடவடிக்கை யெடுப்பாரா?*

asked the Minister of Education: (*a*) Will he state the nature of Teacher's Certificate held by Mr. S. Wijayawardena attached to the tutorial staff of K/Yatihelagala-Udagama Vidyalaya? (*b*) Is he aware that he should have been promoted to Class I with effect from 1.1.1963? (*c*) Is he aware that it is not fair to deprive him of his due promotion and stop his increments as a result of the mistake made by the officers of the Education Department? (*d*) Will he take action to grant his reasonable requests and do justice?

**ගරු කලුගල්ල**
*(கௌரவ கலுகல்ல)*
(The Hon. Kalugalla)

(අ) දෙවැනි පෙළ පුහුණු ගුරු සහතික පත්‍රය. (ආ) ඔව්. (ඉ) නැත. ගුරු සහතික පත්‍රය උසස් කිරීම පමාවී ඇත්තේ, ගුරු මහතා විසින් ඔහු ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි කිරීමේ කාර්‍යය සඳහා අදාළ ලිපි ලේඛනාදිය ඉදිරිපත් කිරීම ප්‍රමාද කර ඇති බැවිනි. (ඊ) ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි කිරීමට අදාළ සියළුම ලිපි ලේඛන දැන් සම්පූර්ණව ඇති නිසා, ඔහුගේ සහතික පත්‍රය උසස් කිරීමට කටයුතු කර ගෙනු යනු ලැබේ.

**ගුරුවරුන්ගේ වැටුප්: මහජන බැංකුවට යැවීම**

*ஆசிரியர் சம்பளம்: மக்கள் வங்கியில் பற்றுவைத்தல்*

**TEACHERS' SALARIES: CREDITING TO PEOPLE'S BANK**

3. **පී. පී. වික්‍රමසූරිය මයා.** (දෙවිනුවර)
*(திரு. பீ. பீ. விக்ரமசூரிய—தெவிநுவர)*
(Mr. P. P. Wickramasuriya—Devinuwara)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වෙනත් රජයේ සේවකයින් මෙන් ගුරුවරුන් ඔවුන්ට ණය මුදල් ලබා ගත හැකි වන පරිදි තමන්ගේ වැටුප් මුදල් මහජන බැංකුවට යවන ලෙස ඉල්ලීම් කර තිබේද? (ආ) වෙනත් දෙපාර්තමේන්තු වල රජයේ සේවකයින්ට මේ ඉල්ලීමට ඉඩ දී තිබේ? (ඉ) එතුමා මෙම අනුග්‍රහය ගුරුවරුන්ටත් දෙනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஏனைய அரசாங்க ஊழியர்களைப் போன்று, ஆசிரியர்களும், கடன்களைப் பெறுவதற்குத் துணைசெய்யுமுகமாகத் தங்கள் சம்பளங்களை மக்கள் வங்கிக்கு அனுப்பிவைக்கும்படி வேண்டிக்கொண்டார்களா? (ஆ) ஏனைய திணைக்களங்களிலுள்ள அரசாங்க ஊழியர்களுக்கு இக்கோரிக்கை வழங்கப்பட்டுள்ளதா? (இ) ஆசிரியர்களுக்கும் இச்சலுகையை அவர் வழங்குவாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

asked the Minister of Education: (*a*) Have teachers, like other Government servants, made requests that their salaries be paid to the People's Bank to enable them to draw loans? (*b*) Has this request been granted in the case of Government servants in other departments? (*c*) Will he give this concession to teachers also?

**ගරු කලුගල්ල**

*(கௌரவ கலுகல்ல)*

(The Hon. Kalugalla)

(අ) ගුරුවරු පිට දෙනෙක් එසේ ඉල්ලා තිබේ. (ආ) නොදනිමි. (ඉ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමුපකාර සමිතිය මාර්ගයෙන් වාර මුදල් ගෙවා ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සලසා ඇති බැවින් මෙම අවශ්‍යතාව පැන නොනගී.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)

*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*

(Mr. K. M. P. Rajaratna—Welimada)

අතුරු ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමා දැන් ප්‍රකාශ කළා, ගුරුවරුන්ට, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සමුපකාර සමිතිය මගින් ණය මුදල් ලබා ගන්ට පුළුවන්ය කියා. කොළඹ නගරයෙන් හැතැප්ම සිය ගණන් ඈත පළාත්වල සිටින ගුරුවරුන්ට මේ සමුපකාර සමිතිය මාර්ගයෙන් ණය මුදල් ලබා ගැනීමට කටයුතු කිරීමේ ලොකු අමාරුවක් තිබෙනවා. වෙනත් දෙපාර්තමේන්තුවල සේවකයන්ට ඉඩ දී තිබෙනවා, තමන්ගේ වැටුප බැංකුවට හරවා ඒ මගින් වාර මුදල් කපා ගැනීමට සලස්වන්න. ගුරුවරුන් අපට නිතරම කරන පැමිණිල්ලක් තමයි, වෙනත් දෙපාර්තමේන්තුවල සේවකයන්ට ලැබෙන ඒ පහසුව ගුරුවරුන්ට ලැබෙන්නෙ නැතැයි කියන එක. අධ්‍යාපන ඇමතිතුමා මේ ගැන කල්පනා කර බලා වෙනත් දෙපාර්තමේන්තුවල සේවකයන්ට දී තිබෙන මෙම වරප්‍රසාදය, සමුපකාර සමිතිය ගැන අමතක කර දමා, ගුරුවරුන්ටත් ලබා දෙනවද? තනි ගුරුවරයෙකුට වුණත් ණයක් අනුමත කරනවා නම් ඔහුගේ පඩිය බැංකුවට හරවා වාර මුදල් කපා ගැනීමට හැකිවන අන්දමට කටයුතු යොදනවද?

**ගරු කලුගල්ල**

*(கௌரவ கலுகல்ல)*

(The Hon. Kalugalla)

ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් මා දැනටමත් ලියා තිබෙනව. රජයේ අනිකුත් නිලධාරීන්ට ලැබෙන සියලුම වරප්‍රසාද ගුරුවරුන්ට සැලැස්වීමටත්, ඒ වාගේම මේ ණය මුදල් මහජන බැංකුවෙන් ලබා ගෙන නියමිත මුදල මාසික වේතනයෙන් කපා ගැනීමටත් මා ලියා තිබෙනවා.

**මඩකලපු දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර් කාර්යාලය : කොඩිකාර මහතාගේ පුත්‍රයාට දෙමළ භාෂාවෙන් උප්පැන්න සහතිකයක් නිකුත් කිරීම**

*மட்டக்களப்பு மாவட்டப் பதிவாளர் அலுவலகம் : சிங்களவர்களுக்குத் தமிழில் பிறப்புச் சாட்சிப் பத்திரம் வழங்கல்*

**DISTRICT REGISTRAR'S OFFICE, BATTICALOA: ISSUE OF BIRTH CERTIFICATES TO SINHALESE IN TAMIL**

4. **කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්වරියගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) හැටන් මහ වීදියේ අංක 36 දරණ ස්ථානයේ පදිංචි ධර්මසේන කොඩිකාර මහතාගේ පුත්‍රයාට මඩකලපු දිස්ත්‍රික්කයේ රෙජිස්ත්‍රාර් කාර්යාලයෙන් අංක 2344 දරණ උප්පැන්න සහතිකය දෙමළ භාෂාවෙන් නිකුත් කර තිබෙන බව එතුමිය දන්නවාද? (ආ) සිංහල දෙමාපියන්ගේ දරුවන්ට උප්පැන්න සහතික දෙමළෙන් නිකුත් කිරීම රජයේ ප්‍රතිපත්තියද? (ඉ) නොඑසේ නම්, මෙම උප්පැන්න සහතිකය කුමන හේතුන් උඩ දෙමළෙන් නිකුත් කරන ලද්දේද? (ඊ) මෙම උප්පැන්න සහතිකය සිංහලෙන් නිකුත් කරන ලෙස ඉල්ලමින්, 1964.2.5 වැනි දින කොඩිකාර මහතා රු. 1.75ක මුද්දරත් සමග අංක 675397 දරණ ලියාපදිංචි කළ ලිපිය යැවූ නමුත් නැවතත් එය දෙමළෙන් නිකුත් කර ඇති බව එතුමිය දන්නවාද? (උ) මෙය 1956 අංක 33 දරණ සිංහල පමණක් පනත උල්ලංඝනය කිරීමක් නිසා මඩකලපුවේ දිස්ත්‍රික්ක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව එතුමිය විනයානුකූලව ක්‍රියා කරනවාද? (ඌ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද? (එ) මෙම උප්පැන්න සහතිකය සිංහලෙන් නිකුත් කිරීමට එතුමිය වහා ක්‍රියා කරනවාද?

உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினு: (அ) ஹற்றன், பிரதான வீதி 36 ஆம் இலக்கத்தில் வதியும் திரு. தர்மசேன கொடிக்கார என்பவரது மகனுக்கு மட்டக்களப்பு, மாவட்டப் பதிவு காரியஸ்தர் அலுவலகம் 2344 ஆம் இலக்கத்தினையுடைய பிறப்பு அத்தாட்சிப் பத்திரத்தைத் தமிழில் வழங்கியதென்பதை அவர் அறிவாரா? (ஆ) சிங்களப் பெற்றோர்களின் பிள்ளைகளுக்கு தமிழில் பிறப்பு அத்தாட்சிப் பத்திரங்களை வழங்குவதுதான் அரசாங்கத்தின் கொள்கையா? (இ) இல்லையெனில், எக்காரணத்திற்காக அப்பிறப்பத்தாட்சிப் பத்திரம் தமிழில் வழங்கப்பட்டது? (ஈ) சிங்களத்தில் பிறப்பு அத்தாட்சிப்பத்திரம் வழங்கும்படி கேட்டு ரூபா 1.75 பெறுமதியான முத்திரையுடன் 5.2.64 ஆம் தேதியிடப்பட்ட 675397 ஆம் இலக்கப் பதிவுக் கடிதமொன்றினைத் திரு. கொடிக்கார அனுப்பிய போதிலும் மீண்டும் அவர்கள் அப்பிறப்பத்தாட்சிப்பத்திரத்தைத் தமிழிலேயே வழங்கினுர்களென்பதை அவர் அறிவாரா? (உ) இந் நடவடிக்கை 1956 ஆம் ஆண்டின் 33 ஆம் இலக்கச் சிங்களம் மட்டும் சட்டத்திற்கு முரணுனதாகையால் மட்டக்களப்பு மாவட்டப் பதிவாளருக்கு எதிராய் அவர் ஒழுங்கு நடவடிக்கை எடுப்பாரா? (ஊ) ஆமெனில், எப்பொழுது? இல்லையெனில், ஏன்? (எ) சிங்களத்தில் பிறப்பு அத்தாட்சிப் பத்திரம் வழங்குவதற்கு அவர் உடனடியாய் நடவடிக்கை எடுப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs: (*a*) Is she aware that the District Registrar's Office, Batticaloa, has issued the birth certificate No. 2344 in Tamil to the son of Mr. Dharmasena Kodikara, residing at No. 36, Main Street, Hatton? (*b*) Is it the policy of the Government to issue birth certificates in Tamil to children of Sinhalese parents? (*c*) If not under what circumstances was this birth certificate issued in Tamil? (*d*) Is she aware that in spite of the fact that Mr. Kodikara wrote to them on 5.2.1964 under Registration No. 675397 enclosing stamps to the value of Rs. 1.75 requesting that the birth certificate be issued in Sinhala, they have once again issued it in Tamil? (*e*) As this is a contravention of the Sinhala Only Act, No. 33 of 1956, will she take disciplinary action against the District Registrar, Batticaloa? (*f*) If so, when, and if not why? (*g*) Will she take immediate action to issue the birth certificate in Sinhala?

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

(අ) ඔව්. (ආ) මුල් ලේඛනය තබා ඇති භාෂාවෙන් පමණක් උප්පැන්න සහතික නිකුත් කළ හැකිව ඇති බැවින් මෙම ප්‍රශ්නය පැන නොනඟී. (ඉ) ලියා පදිංචි කිරීමේ සටහන දෙමළ භාෂාවෙන් තබා ඇති හෙයින් උප්පැන්න සහතිකය දෙමළ භාෂාවෙන් නිකුත් කර තිබේ. (ඊ) උප්පැන්න සහතිකය සඳහා කොඩිකාර මහතා ගෙන් ලැබී ඇති බවට සොයාගත හැකිව තිබෙන්නේ එක් ඉල්ලුම් පත්‍රයක් පමණකි. ලේඛනය තබා ඇති භාෂාව වන දෙමළ භාෂාවෙන් ඒ මත සහතිකය නිකුත් කර තිබේ. (උ) (ඉ) දරන ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ පිළිතුරු නිසා පැන නොනඟී. (ඌ) පැන නොනඟී. (එ) පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### ගිලීමලේ ග්‍රාමීය ආරෝග්‍යශාලාව : අඩුපාඩු සපුරාලීම

### கிலிமலே கிராம வைத்தியசாலை : சீர்திருத்தம்

### GILIMALE RURAL HOSPITAL : IMPROVEMENTS

5. ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්නපුරය)

(திரு. டீ. பீ. ஆர். வீரசேகர—இரத்தினபுரி)

(Mr. D. P. R. Weerasekera—Ratnapura)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගිලීමලේ ග්‍රාමීය ආරෝග්‍යශාලාවේ පහත දැක්වෙන අඩුපාඩු සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීමට එතුමා ඉක්මනින් ක්‍රියා කරනවාද ? :—(i) උණ හා පාචන රෝගීන් සහ රෝගී දරුවන් ඇතුළු මාතෘ හා වෙනත් රෝගීන් එකම කුඩා වාට්ටුවක නැවතී සිටීම ; (ii) ආරෝග්‍යශාලාවේ විශාල තදබදයක් පවතින අතර අළුත් වාට්ටුවක් අවශ්‍ය වීම ; (iii) වහලේ බෑවුම ප්‍රමාණවත් නොවන හෙයින්, මෙම ප්‍රදේශයට අධික වර්ෂාපතනයක් ඇති නිසා යටත්පිරිසෙයින් අවුරුද්දේ හය මාසයක් තුළ මුළු වාට්ටුවම තෙමීම ; (iv) මෙහි සිටින එකම වින්නඹු මාතාව දවසේ පැය 24ක්ම රාජකාරියේ යෙදී සිටීම ; (v) සපයනු ලබන ආහාර නිරස වීම, වැලි සහ අපවිත්‍ර ද්‍රව්‍ය කවලම් වීම හා කිසිම දිනක මාලු නොදීම. (ආ) එතුමා මේ සම්බන්ධයෙන් ගැනීමට අදහස් කරන ක්‍රියා මාර්ගය හා එසේ කරන්නේ කවදාද යන වග එතුමා මෙම සභාවට දන්වනවාද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) கிலிமலே கிராம வைத்தியசாலையிலுள்ள கீழ்க்காணும் குறைகளை நிவிர்த்தி செய்வதற்கு அவர் விரைவில் நடவடிக்கைகள் மேற்கொள்வாரா: (i) காய்ச்சலினாலும் வயிற்றுளைவினாலும் பீடிக்கப்பட்டுள்ள நோயாளர்களுட்பட, நோயுற்ற குழந்தைகளும், பிரசவ நோயாளர்களும், ஏனைய நோயாளர்களும் ஒரு சிறிய சிகிச்சைக்களத்தில் ஒருமித்து வைக்கப்பட்டுள்ளமை, (ii) வைத்தியசாலையில் நோயாளர் நெருக்கம் பெருமளவிலிருக்கின்றமையும் புதிய சிகிச்சைக்களமொன்று தேவையாக விருக்கின்றமையும், (iii) இப்பகுதி பெரும் மழை வீழ்ச்சியுள்ள ஒன்றாகையால், கூரையின் சரிவு போதாததன் காரணமாக வருடத்தில் ஆறு மாதங்களுக்கு சிகிச்சைக்களம் முழுவதும் மழையால் நனைகின்றமை, (iv) இங்கு கடமையாற்றும் ஒரேயொரு மருத்துவத்தாதி நாளொன்றுக்கு 24 மணித்தியாலமும் கடமையாற்றுதல், (v) விநியோகிக்கப்படுகின்ற உணவு ருசியற்றதாகவும் மணலும் அழுக்கும் நிறைந்ததாகவும் இருக்கின்றமையும், மீன் ஒருபொழுதேனும் நோயாளிகளுக்குக் கொடுக்கப்படாதமையும். (ஆ) அவர் மேற்கொள்ள உத்தேசிக்கின்ற நடவடிக்கை என்னவென்பது பற்றியும், எப்பொழுது அந்நடவடிக்கையை மேற்கொள்வாரென்பதுபற்றியும் இச்சபைக்கு அவர் தெரிவிப்பாரா?

asked the Minister of Health: (*a*) Will he take early steps to remedy the following defects in the Gilimale Rural Hospital: (i) maternity and other patients including fever and dysentery cases and sick children are housed in the same small ward ; (ii) the hospital is badly overcrowded, needing a new ward ; (iii) as the slope of the roof is insufficient, the whole ward gets wet during at least six months of the year since this area has heavy rainfall ; (iv) the only midwife here is on duty 24 hours of the day ; (v) the food supplied is tasteless, full of sand and impurities and fish is never served? (*b*) Will he inform the House as to the action he proposes to take and when he will do so?

ගරු බදියුද්දීන් මහ්මූද් (සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ பதியுத்தீன் மஹ்மூது—சுகாதார அமைச்சர்)

(The Hon. Badiuddin Mahmud—Minister of Health)

(*a*) (i) this rural hospital has two wards of six beds each and an isolation room of two beds. Maternity cases are also admitted to the female ward as there is no maternity home or separate maternity ward. Cases of infectious diseases are treated in the isolation room. (ii) The hospital is not heavily over-crowded, but there has been very slight overcrowding. The daily average indoor patients has ranged between 15 and 19 during the last two years, as against a bed-strength of 14. The construction of a maternity ward of twelve beds is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු බදියුද්දීන් මහ්මූද්]

desirable and will be considered in order of priority, taking the other medical needs of the district into consideration. (iii) There is oozing of water through roof tiles during heavy and continuous rain. This has been brought to the notice of the Public Works Department and remedial action will be taken early. (iv) The average monthly deliveries range from 10 to 18 during the last two years. One midwife is adequate for the needs of the institution. She is resident in the duty room and is on duty 24 hours. However, she is relieved on her "off" days and when leave is required by her. (v) There have been no complaints about the quality or quantity of food supplied. On a few occasions when the contractor who supplies cooked meals has defaulted, the Apothecary has made suitable arrangements and supplied the meals. The contractor has been suitably punished on these occasions. Owing to a scarcity of fresh fish in this area, it has not been possible to supply fish diets to patients. (b) I consulted hon. Members of the House in October last and appointed Hospital Visitors. If the hon. Member for Ratnapura will suggest suitable persons to be appointed visitors to Gilimale, such visitors may, by surprise inspection, maintain a high quality in the food supplied to the hospital.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු ඇමතිතුමා කියන්න යෙදුනේ ගරු මන්ත්‍රීන් සමග සාකච්ඡා කර පරීක්ෂක වරුන් පත් කළ බවත්, ඒ පරීක්ෂක වරුන් හදිසියේ ගොස් පරීක්ෂා කර පැමිණිලි ඉදිරිපත් කරන විට ඒ ආරෝග්‍ය ශාලාවල කෑම ආදී දේවල ඉහළ තත්ත්වය කින් තබා ගන්න පුළුවන් වෙනවාය කියායි. නමුත් මගේ අත්දැකීමේ සැටියට ආරෝග්‍යශාලාවලට පත් කරන නිල නොලත් පරීක්ෂකවරුන් මොන මොන අඩුපාඩු කම් ගැන පැමිණිලි කළත්, ප්‍රාදේශීය දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරීන් ඒ පැමිණිලි සත පහකටවත් ගණන් ගන්නේ නැහැ.

ඒ නිසා මීට පසුවටත්, ආරෝග්‍යශාලාවල නිල නොලත් පරීක්ෂකවරුන් යම් යම් පැමිණිලි ලොග් පොතේ සටහන් කළොත් එහෙම නැත්නම් ඇමතිතුමාට ඉදිරිපත් කළොත්, ඒවා ගැන නියම විධියට වගවිභාග කර බැලීමට ඇමතිතුමා ලැස්තිද කියා මා දැනගන්නට සතුටුයි.

**ගරු බදියුද්දීන් මහ්මූද්**
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

ලැස්තියි.

## ගිලිමලේ ආරෝග්‍යශාලාව : සේවකයින්ගේ නිල ඇඳුම්

## கிலிமலே வைத்தியசாலை : தொழிலாளர்களுக்கு உத்தியோக உடை

## GILIMALE HOSPITAL : UNIFORMS TO WORKERS

6. **ඩී. පී. ආර්. වීරසේකර මයා.**
*(திரு. டீ. பீ. ஆர். வீரசேகர)*
(Mr. D. P. R. Weerasekera)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1963-64 වර්ෂය සඳහා, ගිලීමලේ ආරෝග්‍යශාලාවේ සේවකයින්ට තවමත් නිල ඇඳුම් සපයා දී නැති බව එතුමා දන්නවාද? (ආ) මෙම කාරණය ඉක්මන් කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா : (அ) கிலிமலே வைத்தியசாலையில் கடமையாற்றுகின்ற தொழிலாளர்களுக்கு 1963-64 ஆம் ஆண்டுக்கென வழங்கப்படவேண்டிய உத்தியோக உடைகள் இன்னமும் வழங்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) இவ் விடயத்தைத் துரிதப்படுத்துவதற்கு அவர் நடவடிக்கைகள் மேற்கொள்வாரா?*

asked the Minister of Health: (a) Is he aware that the official uniforms for 1963-64 have not been supplied as yet to the workers in the Gilimale hospital? (b) Will he take steps to have this matter expedited?

**ගරු බදියුද්දීන් මහ්මූද්**
*(கௌரவ பதியுத்தீன் மஹ்மூது)*
(The Hon. Badiuddin Mahmud)

(a) Yes. (b) A part supply of uniforms has already been made by the Superintendent, Government Stores, and the balance will be supplied by him within a week.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**ආරෝග්‍යශාලා සේවකයින්ට පැය 8 වැඩේ**

வைத்தியசாலை ஊழியர் : எட்டு மணித்தியால வேலை

HOSPITAL WORKERS : EIGHT-HOUR DAY

7. ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : සාමාන්‍යයෙන් විනීත සේවක පිරිසක් වන උපස්ථායකයින් හා අනෙකුත් ආරෝග්‍යශාලා කාර්‍ය මණ්ඩලය ඔවුන්ගේ පැය 12ක් වැඩ කරන දවසේ අගහරියේදී අසතුටුදායක තත්ත්වයකට නැඹුරු වන හෙයින් සේවකයින්ට සාධාරණයක් වශයෙන් හා රෝගීන්ගේ යහපත තකා ආරෝග්‍යශාලා සේවකයින්ට පැය 8ක් වැඩ කරන දින ලබා දීමට එතුමා කටයුතු කරනවාද ?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா : சாதாரணமாக இணக்கமாக நடக்கின்ற பரிசாரகரும் வைத்தியசாலையின் ஏனைய உத்தியோகத்தர்களும், நாளொன்றுக்கு 12 மணித்தியால வேலை செய்த பின்னர் திருப்தியற்ற முறையில் நடக்குந் தன்மையை முன்னிட்டு, இத்தொழிலாளர்களின் நலன்கருதியும், நோயாளர்களின் நன்மைக்காகவும் வைத்தியசாலை ஊழியர்களுக்கு நாளொன்றுக்கு 8 மணித்தியால வேலை வழங்குவதற்கு அவர் நடவடிக்கைகள் மேற்கொள்வாரா ?

asked the Minister of Health : Since attendants and other hospital staff who are generally polite tend to be unsatisfactory towards the end of their 12-hour working day, will he take steps to give hospital workers an 8-hour working day, both in fairness to these workers as well as in the interests of the patients?



ගරු බදිඋද්දීන් මහ්මූද්

(கௌரவ பதியுத்தீன் மஹ்மூது)

(The Hon. Badiuddin Mahmud)

In view of the additional staff that will be required to give effect to the request of the hon. Member, I shall discuss this further with the Hon. Minister of Fniance and give whatever relief is possible. I appreciate very much the anxiety of the hospital staff to be polite to members of the pub ic ; but I would also remind all staff that long hours of work should be no excuse for not being polite to members of the public.

කේ. එම්. පී. රාජරත්න මයා.

(திரு. கே. எம். பீ. ராஜரத்ன)

(Mr. K. M. P. Rajaratna)

මෙපමණ කාලයක් තුළ උපස්ථායකයන් බඳවා ගත් ක්‍රමය වෙනස් කර, අලුත් ක්‍රමයක් අනුව උපස්ථායකයන් බඳවා ගන්න අදහස් කරනවාද ?

ගරු බදිඋද්දීන් මහ්මූද්

(கௌரவ பதியுத்தீன் மஹ்மூது)

(The Hon. Badiuddin Mahmud)

That question does not arise. There is no question like that.

**නැසීගිය කේ. කිචන් මහතාගේ වැන්දඹු භාර්‍යාවට හිමි විශ්‍රාම වැටුප් ගෙවීම**

காலஞ்சென்ற திரு. கே. கிச்சென் : கைம் பெண்ணுக்கு இளைப்பாற்றுச் சம்பளம்

K. KICHEN, DECEASED : PAYMENT OF PENSION TO WIDOW

8. පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)

(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலை)

(Mr. P. M. K. Tennekoon—Mihintale)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) සේනපුර, වවුනියාව හා මාංකුලම මාතෘ නිවාසවල කම්කරුවෙකු වශයෙන් සේවය කළ කේ. කිචන් මහතා මාන්කුලම මාතෘ නිවාසයේ සේවයේ යෙදී සිටියදී 1964.1. 29 වැනි දින මිය ගිය බව එතුමා දන්නවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

(ආ) අවුරුදු 16ක් පමණ සේවයේ යෙදී සිටි නිසා ඔහුට හිමි විශ්‍රාම වැටුප් හෝ වැන්දඹු හා අනන්දරු මුදල් ඔහුගේ වැන්දඹු භාර්යාවට හා දරුවන්ට ගෙවීමට එතුමා කටයුතු කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) சேனபுர, வவுனியா, மாங்குளம் ஆகிய இடங்களில் உள்ள மருத்துவ மனைகளில் தொழிலாளியாகக் கடமையாற்றிய திரு. கே. கிச்சென் என்பவர் 29.1.64 அன்று மாங்குளம் மருத்துவ மனையில் கடமையாற்றிக் கொண்டிருக்கையில் இறந்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) பதினாறு வருட காலங்கள் சேவை செய்துள்ள அவருக்குச் சேர வேண்டிய இளைப்பாற்றுச் சம்பளம் அல்லது கைம்பெண் அனாதைகள் இளைப்பாற்றுச் சம்பளப் பணங்கள் ஆதியனவற்றை அவரது கைம்பெண்ணிற்கும் பிள்ளைகளுக்கும் வழங்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Finance: (*a*) Is he aware that Mr. K. Kichen who had served as a labourer at the Maternity Homes in Senapura, Vavuniya and Mankulam, died on 29.1.1964 while on duty at the Mankulam Maternity Home? (*b*) Will he take action to pay pension or W. & O.P. monies due to him to his widow and children as he had been in service for about 16 years?

**ගරු ජේ. පී. ඔබේසේකර මයා. (මුදල් කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති)**

*(கௌரவ ஜே. பீ. ஒபேசேக்கர—பதில் நிதி அமைச்சர்)*

(The Hon. J. P. Obeyesekere—Acting Minister of Finance)

(අ) ඔව්. වව්නියාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අදහස අනුව, කිචන් මහතා මිය ගියේ 1964 ජනවාරි මස 30 වෙනි දාය. (ආ) මරණ පාරිතෝෂිකයක් හෝ වැන්දඹු විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම සඳහා මේ වන තෙක් ඉල්ලුම් පත්‍රයක් ලැබී නැත. එවැනි ඉල්ලුම් පත්‍රයක් ලත් විගස ම අවශ්‍ය කටයුතු කෙරේවි ඇත.

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

*சபை அலுவல்*

BUSINESS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභා නායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 24, the motions appearing as items 10, 11 and 12 on the Paper be proceeded with this day".

This is to enable the House to take up these items after 8 P.M. if the hon. Members have no objection.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

එම යෝජනාවට මා විරුද්ධයි. අපට දින 5ක් කල් දෙන්න ඕනෑ; නමුත් එසේ කෙරී නැහැ. එම නිසා මේ යෝජනාවට අපි විරුද්ධයි. අටෙන් පස්සෙ ඔව කරන්න අපේ එකඟත්වය දෙන්න පුළුවන් වේය කියා මා සිතන්නෙ නැහැ.

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன—தொழில், வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Labour and Housing)

මා සිතනව ඔය තීරණය ගත්තෙ පක්ෂ නායකයන්ගෙ අදහස් උඩය කියා. ඔය අන්දමට එම යෝජනාව ඉදිරිපත් කළේ ඒ නිසයි. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

පක්ෂ නායකයන්ගෙ සාකච්ඡාවලදී කුමන තීරණයක් ගත්තත් ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් වී සිටින සභානායකතුමාටත් සංවිධායක තුමාටත් එම තීරණ අනුගමනය කරන්න බැහැ. තමුන්නාන්සෙල පක්ෂ නායකයන්ගේ තීරණ අනුගමනය කරන්න ඉදිරිපත් වෙනව ; නමුත් ගරු අගමැතිනිය වෙන තැනක ඉඳල ඒව කඩනව.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ගරු මන්ත්‍රීතුමා විරුද්ධ නිසා මා එය ඉල්ලා අස්කර ගන්නව.

**යෝජනාව, අවසර දෙන ලදුව, ඉල්ලා අස් කර ගන්නා ලදී.**

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

*தனி அங்கத்தவர் மசோதா*

## PRIVATE MEMBERS' BILLS

### ORIENTAL STUDIES SOCIETY, COLOMBO, BILL

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගොමුව))
(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)
(Mr. P. B. Balasuriya—Galigomuwa)

මතු පළ වන කෙටුම්පත් පණත මම ඉදිරිපත් කරමි :

"That leave be granted to introduce a Bill to Incorporate the Oriental Studies Society, Colombo".

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

**විසින් ස්ථිර කරන ලදී.**

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.**

**වාර්තා කිරීම සඳහා, 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පණත අධ්‍යාපන ඇමති වෙත පවරන ලදී.**

## විසර්ජන කෙටුම්පත් පණත 1964-65

*ஒதுக்கீட்டு மசோதா, 1964-65*

## APPROPRIATION BILL, 1964-65

**කාරක සභාවෙහිදී සලකා බලන ලදී.**
—[ප්‍රගතිය, අගෝස්තු 28.]

**කථානායකතුමා මූලාසනාරූඪ විය.**

### 72 වන ශීර්ෂය—ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල අමාත්‍යවරයා

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,29,909**

**1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 3,40,607**

*தலைப்பு 72.—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர்*

*வாக்குப்பணம்இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 5,29,909*

*உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளமும் ரூ. 3,40,607*

### HEAD 72.—MINISTER OF LAND, IRRIGATION AND POWER

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 529,909*

*Sub-head 1.—Cadre and salaries, Rs. 340,607*

**ඉදිරිපත් කරන ලද සංශෝධනය** [අගෝස්තු 27]—

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'"
[පර්සි වික්‍රමසිංහ මයා.]

පූ. භා. 10.15

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ** (අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

අයවැය වාර්තාවෙ කටයුතු පිළිබඳව වෙන් කර ඇති කාල සීමාවින් දැන් හුඟක් දුරට ව්‍යාකූල වෙලයි තියෙන්නෙ. අපේ සාකච්ඡා බලාපොරොත්තු වූවාට වඩා දීර්ඝ කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]
වීම ගැන මා කනගාටු වෙනව. කෙසේ වෙතත්, මෙම වැය ශීර්ෂය ගැන කතා කරන විට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ විදුලි බලය පිළිබඳ දෙපාර්තමේන්තුව කියන දෙපාර්තමේන්තු තුන ගැන කල්පනා කරන්න වටිනවා. ඒවායෙ ඉතා කනගාටු දායක තත්ත්වයක් පවතිනව. අද ප්‍රධාන වශයෙන් ව්‍යාකූල වී තිබෙන්නෙ මෙම දෙපාර්තමේන්තු තුනයි.

දේශීය හා විදේශීය ප්‍රතිගාමිත්වය මේවායෙ බලපෑම තියෙනව. සංවර්ධනය අතින් සහ ආර්ථික අතින් සමාජවාදි පදනමක් උඩ සාර්ථක වැඩ පිළිවෙළක් ගෙන යාම වැළැක්වීමේ යුද කඳවුරු හැටියට මෙම ආයතන සකස් වී තිබෙනව. ටිකින් ටිකවත් අනිකුත් ආයතනවලින් ප්‍රතිගාමී බලවේග ඉවත් කොට ප්‍රගතිශීලි ක්‍රම ඇතුළු කරන්නට පුළුවන් වී තිබෙතත් මේවායෙ එසේ කරන්න ලැබී නැහැ. මෙම දෙපාර්තමේන්තුවල පවතින අක්‍රමිකතා හා දූෂණ ක්‍රියා ගැන කරුණු ටිකක් මා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනව. ඒවා ඉවසීමෙන් අහන හැටියට මා ඉල්ලනව.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ සමහර කොන්ත්‍රාත්කරුවනුත් ඉංජිනේරුවනුත් සමග පෞද්ගලික වශයෙන් මගේ විරුඩයක් නැහැ. මෙම පුද්ගලයන් ගැන කතා කරන විට එක කාරණයක් තියෙනව, මතක් කරන්න. මේවයෙ සිදුවන දූෂණ කටයුතුවලට කිසි සම්බන්ධයක් නැති, ඒවායින් ලාබ ප්‍රයෝජනයක් නොගෙන අවංකව කටයුතු කරන්න ආසාවක් තියෙන කෙනෙක් හැටියට ගරු ඇමතිතුමා හඳුන්වන්න පුළුවනි. නමුත් මේවායෙ සිදු වන දූෂණ ක්‍රියා ගැන අසන සමහර අයට අවබෝධ වෙන්න පුළුවනි. ගරු ඇමතිවරයත් මේවට සම්බන්ධ නැති නම් මේව කෙරෙන්න පුළුවන්කමක් නැත කියා. ඇමතිතුමා යම් යම් නිලධාරීන්ට විශ්වාස කරන නිසා ඔවුන් ඇමතිතුමාව ආයුධයක් කර ගෙන විශාල දරුණු දූෂණ ක්‍රියා කරන තත්ත්වයක් පැන නැගී තිබෙනව. ගරු ඇමතිතුමා සම්බන්ධ නූනත් එතුමගෙ ඇස් ඉදිරිපිට විශාල දූෂණ ක්‍රියා කරන බව මට කනගාටුවෙන් නමුත් මතක් කරන්න සිදු වී තිබෙනව.

මා පළමුවෙන්ම පටන් ගන්නෙ සෑහෙන ප්‍රසිද්ධියක් දැනටමත් ලැබී තිබෙන විතානගේ හා සම්බන්ධ තොරතුරුවලිනුයි. ඔහු පටන් ගත්තෙ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ නුවරඑළියේ ගොඩනැගිල්ලක් හැදීමට කොන්ත්‍රාත්තුවක් අරගෙනයි. පොරොන්දු වූ ආකාරයට ඒ වැඩේ අවසන් කරන්න ඔහුට බැරි වුණා. නුවරඑළියේ සබ්-ඩිවිෂන් එකේ ගොඩනැගිල්ලක් හැදීමටයි පොරොන්දුව. ඊට පසුව ලක්ෂ දෙක හමාරකට කොන්ත්‍රාත්තුව ගත්තේ වී නමුත් අද වන තුරු ඒ ගොඩනැගිල්ල සම්පූර්ණ වෙලා නැහැ. ඒ සඳහා වියදම් කළ මුදල අපතේ ගිහිල්ලයි තියෙන්නෙ. ඔය කොන්ත්‍රාත්කරුවා වංචනික ලෙස ක්‍රියා කළ නිසා ගොඩනැගිල්ල සම්පූර්ණ කරන්න බැරි වුණා.

අළුත්නුවර ප්‍රදේශයේ බඹරවැව කියන ව්‍යාපාරයෙත් කොන්ත්‍රාත්තුවක් ගත්තා. ඒක රටේ හැම නැනම කවුරුත් පාහේ දන්න කොන්ත්‍රාත්තුවක්. රුපියල් පණස් දාහකට "සිලෝන් ඩිවෙලප්මන්ට් කොම්පැනි" නැමති සමාගමට කොන්ත්‍රාත්තුව වික්කා. කොම්පැනියෙන් තමයි ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආදිය යොදා ඒ කොන්ත්‍රාත්තුවේ වැඩ කළේ. එතකොට මොහුට එයින් රුපියල් පණස් දාහක පගාවක් ලැබුණා. කොන්ත්‍රාත්තුව ගැනීමට කොම්පැනියෙනුත් ටෙන්ඩරයක් ඉදිරිපත් කළ නමුත් විතානගේටයි කොන්ත්‍රාත්තුව දෙපාර්තමේන්තුවෙන් ලැබුණේ. කොන්ත්‍රාත්තුව ලබා ගත් විතානගේ එය කොම්පැනියට විකුණා රුපියල් 50,000 ක් ලබා ගත්තා. ඊට පස්සෙ බෝදගම ආර කොන්ත්‍රාත්තුව ලබා ගත්තා. භාර්යාවට ඉඩකඩම් ආදි වස්තුව තිබුණු නිසා ඒවා උගසට තබා ලංකා බැංකුව ඇපකරු වශයෙන් පත් කර ගන්න ඔහුට පුළුවන් වුණා. මේ අන්දමට ඒ කොන්ත්‍රාත්තුව කරගෙන ගිය නමුත් එය අවසන් කරන්න ඉස්සර වෙලා කරවිලවැව කොන්ත්‍රාත්තුවටත් ටෙන්ඩර දමන්න ඔහුට පුළුවන් වුණා. කලින් භාර ගත් කොන්ත්‍රාත්තුවට ඇප වී සිටි ලංකා බැංකුව මේ කොන්ත්‍රාත්තුවටත් ඇප දෙන්න ඉදිරිපත් වුණේ නැහැ. ඊට හේතුව කලින් භාර ගත් කොන්ත්‍රාත්තුව අවසන් නොකිරීම නිසා ඒ ඇපය නිදහස් නොකිරීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ඇපය තිබියදී තවත් කොන්ත්‍රාත්තුවකට ඇප වීමට නම් තවත් වැඩිපුර දේපොළ උගස් තබන ලෙස ලංකා බැංකුව කියා සිටි නිසා විතානගේට ඒ කොන්ත්‍රාත්තුව නොලැබෙන තැනට කටයුතු සිදු වුණා. ඉතින් එවකට තිස්සමහාරාමයේ හිටපු වාරිමාගී ඉන්ජිනේරු තැන, නොහොත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ ගුණසේකර ඉංජිනේරු තැන කරවිලවැව කොන්ත්‍රාත්තුව භාර දීම කල් දැම්මා. එසේ කළේ ලංකා බැංකුවේ මුල් ඇපය නිදහස් වුණාම කරිවිල වැව කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ඇප දෙන්න පුළුවන් කමක් ලංකා බැංකුවට ඇති වීමටයි. මේ කොන්ත්‍රාත්කරුට ලාභ ප්‍රයෝජන සලසා දීමේ අදහසින් කරිවිල වැව කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ ටෙන්ඩරය ක්‍රියාවේ යෙදීමේ වැඩ පිළිවෙළ කල් දැම්මා. ඊට පසු ලංකා බැංකුව ඇපකරු හැටියට තබාගෙන කොන්ත්‍රාත්තුව භාර ගත්තා. මේ තරම් විශාල කොන්ත්‍රාත්තුවක් භාර ගෙන ඔහු වැඩ කළේ කොහොමද? "හයර් පර්චස්" ක්‍රමයට බ්‍රවුන් සහ සමාගමෙන් මැෂින් ආදි උපකරණ බද්දට ලබා ගත්තා. මාස් පතා ඒ සඳහා ගෙවිය යුතු කොටස් මුදල් හරියාකාර නොගෙවූ නිසා පිස්කල් මුලාදෑනිවරුන් ගිහිල්ලා එතන තිබුණු යන්ත්‍රෝපකරණ ආදිය ඇතුළු බඩු බ්‍රවුන් කොම්පැනිය තහනම් කළා. ඒ සිද්ධිය නිසා එතෙක් කර ගෙන ආ හොරකම් එළිදරවු වෙන්න පටන් ගත්තා. ඒ අවස්ථාවේ චන්ද්‍රිකාවැව කොන්ත්‍රාත්තුවත් මොහුටම භාර දෙන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ ඩිරෙක්ටරුත්, නියෝජ්‍ය ඩිරෙක්ටරුත් වීරසූරිය නැමති ගණන් පරීක්ෂක ඇතුළු මේ පල් හොරු රංචුව එකතුවුනා. මා මේ විධියේ තද වචන පාවිච්චි කිරීම ගැන ගරු ඇමතිතුමා මා කෙරෙහි සමාධිය භජනය කරනවා ඇතැයි විශ්වාස කරනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඔය හැම එකක් ගැනම මම විභාග කරවා බලන්නම්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

එතනදි මොකක්ද කළේ? තිස්සමහාරාමයේ හිටපු ගුණසේකර ඉංජිනේරු මහත්මයා චන්ද්‍රික වැවට මාරු කළා. ඒ කාලේ බොරු ගණන් හිලවු ඉදිරිපත් කළා කරිවිලවැව කොන්ත්‍රාත් එක සම්බන්ධයෙන්. රුපියල් 94,000කට බොරු ගණන් ඉදිරිපත් කළා. එතන විශේෂ සේවයක් කරන්න තිබෙනවය කියල රුපියල් 300ක විශේෂ අමතර එලවන්ස් එකක් ඔහුට ගෙවන්න පටන් ගත්තා. දුෂ්කර ස්ථානයක් හැටියට සලකා ගෙවන්න පටන් ගත් ඒ විශේෂ දීමනාව අද වන තුරු ලබා ගන්නව. දුෂ්කර ප්‍රදේශවල විශේෂ සේවයක් කරන ඉංජිනේරුවන්ට විශේෂ දීමනාවක් ලැබෙනවා. චන්ද්‍රිකා වැව යෝජනා ක්‍රමයේ සේවයට පැමිණි ගුණසේකර ඉංජිනේරු තැනද ඒ මුදල ලබා ගත්තා. ඔහු අදත් ඒ මුදල ලබා ගන්නව. කලින් භාරගෙන තිබුණු කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කරන තුරු චන්ද්‍රිකා වැව ක්‍රමයෙහි කොන්ත්‍රාත් ගැනීමට බැහැ. නමුත් කලින් භාර ගෙන තිබුණු කරවිලවැව කොන්ත්‍රාත්තුවේ නොකරන ලද වැඩ සඳහාද මුදල් ලබා ගෙන තිබුණා. මේ හොරකම එළිවන්නට නොදී කෙසේ හෝ වසා ගත යුතු නිසා මේ ලියමන ප්‍රාදේශික වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යැව්වා.

"W. S. 4/2
Irrigation Department,
Buller's Road,
Colombo,
24th May, 1963.

G. M. M. Branch

Subject: Karawila Tank.

Please send urgently 3 Class I tractors, 2 bucket scrapers, water bowsers, etc., to do about 15,000 cu. ft. of earth work for Karawila, Southern Province. This work should be done very urgently."

ඔව්, බොහොම හදිසි වැඩක් තමයි. බඩුත් එක්ක හොරුන් අසුවන්නට යන කොට කොහොම හරි ඒක වහගන්න ඕනෑ නොවැ. නොකර ඇති වැඩ ආණ්ඩුව මඟින්ම කරවා ගැනීමයි, මේ හොරකම වසා ගැනීමේ තමයි. හොරකම වහ ගන්න ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

මගින්ම යන්ත්‍ර ගෙන්වා ගන්න ඕනෑ වුණා. ආණ්ඩුවේ ප්‍රධාන වාරිමාර්ග ඉංජිනේරු තැන මේ විධියට වැඩ කළත් මේ දෙපාර්තමේන්තුවේ අවංක ඉංජිනේරුවන් දඅතළොස්සක් පමණ සිටින නිසා සියල්ල කාබාසිනියා කර දමන්න පුළුවන් වී නැහැ. ඒ නිසා අර යන්ත්‍ර ගෙන්වා ගැනීමට බැරි වුණා.

කාලය ගත වන නිසා මේවා ගැන දිගින් දිගට විස්තර කරන්න යන්නේ නැහැ. තංගල්ලේ ප්‍රාදේශීය ඉංජිනේරු තැනට එවන ලද විදුලි පණිවුඩය ගැනත්, කොන්ත්‍රාත් කරුවකුට රුපියල් 35,000ක් ගෙවන්න කියා බල කිරීම ගැනත් මීට පෙර මා මේ ගරු සභාවේදී සඳහන් කර තිබෙනවා. ඒ නිසා දැන් ඒ ගැන කියන්න යන්නේ නැහැ. ගරු ඇමතිතුමා මේ කරුණු ගැන පරීක්ෂා කර බලන්න ඕනෑ. මෙහි පහත සඳහන් කරන ලිපිය තිස්ස සිටින වාරිමාර්ග ඉංජිනේරු තැන මහජන බැංකුවේ සාමාන්‍යාධිකාරි තැනට යවා තිබෙනවා.

"Irrigation Office,
Tissa,
15th May, 1962.

The Manager,
People's Bank Head Office,
Union Place,
Colombo.

Dear Sir,

Subject: M. M. Vithanage Bros.,
Account No. 401,
Karawila Scheme, Kataragama.

I am writing at the request of Mr. B. A. Vithanage, Managing Partner of Messrs. Vithanage Bros., Nuwara Eliya, to inform you that this firm has entered into an agreement with this department for the construction of the Karawila Scheme, Kataragama. The total amount of the contract is Rs. 317,010. Up to date this firm has been paid approximately a sum of Rs. 130,000. The balance to be paid is about Rs. 167,010.

I certify that the progress made by this firm on this contract has been very satisfactory."

This letter was signed by the Irrigation Engineer, Tissa, the nephew of the Director of Irrigation—a person who is now drawing a special allowance in Chandrikawewa.

මෙතනින් තමයි, මහජන බැංකුවට තට්ටු කරන්න පටන් ගත්තෙ. කරවිල වැව ව්‍යාපාරයේ හොරකම ගැන පරීක්ෂා කරද්දී, ලැබූ ලාභ ප්‍රයෝජන සඳහා ආදායම් බදු නොගෙවන නිසා, ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් මුදල් තහනම් කළා. ඉරිගේෂන් ඉංජිනේරුවරුන් දන්න නිසයි, එහෙම කළේ. ඒ ඉංජිනේරුවරුන්ට නියම කරල තිබුණ, කොන්ත්‍රාත්තුවෙ මුදල්වලින් ආදායම් බදු අඩු කරල, ඒ මුදල් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවන්නය කියා. විතානගේ ආදායම් බද්දටත් හොරකම් කරන නිසයි, ඒ පිළිවෙලට නියෝගයක් කර තිබුණේ. මෙවැනි තත්ත්වයක් තියෙන කොන්ත්‍රාත්කරුවකු ගැන තමයි, 1962 දී මහජන බැංකුවට මේ ලියමන ලීවෙ. අවසානයේදී මේ දූෂණකම් නිසා කරවිල වැව ව්‍යාපාරයේ කොන්ත්‍රාත්තුව අවලංගු කළා. දැන් ඒ ගැන පරීක්ෂණයක් තියෙනව. චන්ද්‍රිකා වැව කොන්ත්‍රාත්තුව සම්බන්ධ ප්‍රශ්නය දැන් නිරවුල් කිරීමේ මණ්ඩලයකට තබා තිබෙනව. මේ තරම් දූෂණ කරන, හයර් පර්චස් බදු නොගෙවීම නිසා බ්‍රවුන් කොම්පැනියෙ යන්ත්‍ර තහනම් කළ පසු යන්ත්‍ර නැති මේ තැනැත්තාට චන්ද්‍රිකා වැව ව්‍යාපාරයේත් රුපියල් 20,00,000 ක කොන්ත්‍රාත්තුවක් දුන්න. ඒ සඳහා රුපියල් 99,000 ක ඇපයකට අත්සන් කළේ මහජන බැංකුවයි. දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තුව හරියට නො කළොත් ඒ සම්බන්ධයෙන් වන්දි ගෙවීම සඳහා රුපියල් 99,000 ක ඇපයකට අත්සන් කළේ මහජන බැංකුවයි. මෙසේ කළේ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන්ගේ සහතික උඩ, අර ලියමන උඩ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

**චන්ද්‍රිකා වැව කොන්ත්‍රාත්තුව රුපියල් ලක්ෂ 20යි.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඊට කලින් 1,37,000ක් ගෙවල තියෙන වය, 1,67,000ක් ගෙවන්න තියෙනවය කියා 1962 මැයි මාසයේදී මහජන බැංකුවට සහතිකයක් දුන්න නිසයි, මේක වුණේ. එතනදී විතානගේට හොඳ ආයුධය අහු වුණා. ඔහු බැංකුවට කීවා, දැන් නුඹලා ඇපයට අත්සන් කරල තියෙනව, මම කොන්ත්‍රාත්තුව නොකළොත් නුඹලට ඉරිගේෂන් දෙපාර්තමේන්තුවට රුපියල් 99,000ක් ගෙවන්න සිදු වෙනව ; ඒ නිසා මට මේ කොන්ත්‍රාත්තුව කරන්න යන්ත්‍ර ගෙන්වන්න රුපියල් 2,50,000ක ණයක් දීපල්ලය කියල. මහජන බැංකුවට වුණේ කොටි වලිගය අල්ල ගත්ත වගේ වැඩක්. අන්තිමේදී රුපියල් 2,50,000ක ණයක් දුන්න යන්ත්‍ර ගෙන්වන්න. මේ කොන්ත්‍රාත්තුව 1963 සැප්තැම්බර් මාසයේදී අවසාන කරන්න ඕනෑ. මැයි මාසය වන විට බොරළු ටිකක් එකතු කිරීම හැර වෙන කිසිම වැඩක් කරල තිබුණේ නැහැ. නමුත් මේ කොන්ත්‍රාත්කරු තර්ජනය කරල ටෙලිග්‍රෑම් යැව්වා තංගල්ලෙ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනට, වාරිමාර්ග අධ්‍යක්ෂතැනගේ ඕඩරය උඩ තමාට රුපියල් 35,000ක් ගෙවන්නය කියා. කොන්ත්‍රාත්තුව අවලංගු කරන්න ඔන්න මෙන්න කියා තියෙද්දිත් ඒ මිනිහට රුපියල් 35,000ක් ගෙවන්න දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරිවරු—වාරිමාර්ග අධ්‍යක්ෂතුමත් ඔහුගේ අනික් හවුල් කාරයනුත්—මහන්සි ගත්ත. නමුත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන ඒකට ඉඩ දුන්නෙ නැහැ.

පූ. භා. 10.30

අපේ ප්‍රදේශයේ වාරිමාර්ග කටයුතුවල වැඩ බොහොම උනන්දුවෙන් කළ නිලධාරියකු හැටියට ඒ මහත්මයා ගැන මම හොඳට දන්නව. වික්‍රමසූරිය කියන ඒ මහත්මයා, මා හිතන පිළිවෙළට දැන් කොළඹ "ඩ්‍රෙනේජ් ස්කීම්" එකක් යොදවන්න පත් කරල ඉන්න ප්‍රධාන ඉංජිනේරු මහත්මයෙක්. උන්නැහෙට තීරණය කරන්න සිදු වී තිබුනෙ, රක්ෂාවෙන් පන්නා දමන තත්ත්වයට කටයුතු කරනවද එහෙම නැත්නම් හොරුන්ට එකතු වෙලා හොර ගුහාවට යනවද කියන මේ දෙකෙන් එකකටයි. නමුත් උන්නැහේ රක්ෂාව නැති වුණත් කමක් නැත, අවංකව කටයුතු කරන්න ඕනෑය කියා, ආණ්ඩුවට සේවය කරන්න ඕනෑය කියා, මේ හොරකම වැසීමට කටයුතු කළේ නැහැ ; කොන්ත්‍රාත්තුව අවලංගු කළා. තහනම් කළාට පසු උන්නැහේ නියමයක් කළා, අර බඩු තහනම් කරන්න : බැංකුවෙන් ණයට ගත්ත මුදලෙන් රුපියල් 2,50,000 කට ගෙනා බඩු තහනම් කරන්න. අර ඇපය නිසයි, එහෙම තහනම් කරන්න නියම කළේ. එතනදී බැංකුව කලබල වෙලා දෙපාර්තමේන්තුවට ලියුම් ලිව්ව. ඇටර්නි ජනරාල් දෙපාර්තමේන්තුව මේ ගැන සාකච්ඡා කරල නීතියෙ හැටියට බැංකුවට අයිතිය තියෙන්න පුළුවන්ය කීව. ඒ නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන්ත්‍ර ටික තහනම් කළේ නැහැ. ඒ 99,000 අලාභය සම්බන්ධව දැන් "ආබිට්රේෂන්" එකක් නොහොත් විනිශ්චය මණ්ඩලයක් පත් කර තිබෙනව. යම් විධියකින් මේ අලාභය ගෙවන්න තීන්දු වුණත් කාගෙන්ද ඒ අලාභය ලබා ගන්නෙ ? එක සාක්කුවකින් අනික් සාක්කුවටයි යන්නෙ. මහජන බැංකුව විසිනුයි ගෙවන්න වෙන්නෙ. විතානගේගෙ කිසිම වටිනාකමක් නැහැ. ඒ නිසා මේ තත්ත්වය හොඳට අවබෝධ කර ගන්න ඕනෑ. මේ තරම් විශාල හොර කමක් අසු වී තිබියදීත් ඒක වහන්න කටයුතු කළ ගුණසේකර ඉංජිනේරුව තවම චන්ද්‍රිකා වැව සහ උඩවලවේ ව්‍යාපාරවල

---

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

සැප්තැම්බර් අගදී චන්ද්‍රිකා වැව ව්‍යාපාරය ගල් ඔය සංවර්ධන මණ්ඩලයට භාර දෙනව.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

බොහෝම සන්තෝෂයි ඒ ගැන ඇසීමට ලැබීම ගැන. නමුත් මම කියන්නෙ වාරිමාර්ග ඉංජිනේරුව තවමත් එතැන ඉන්න බවයි. දැන් ඔහු මැණික් ගරනව. ඒ මොකද ? බය නැතිව ඒ වැඩ කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

පුළුවන්. මෙපමණ විශාල හොරකමක් වැසී මට දෙපාර්තමේන්තුව ක්‍රියා කළා නම් කිසිම බයක් නැතිව තවත් ඕනෑම එකක් කරන්න පුළුවනි. මේ සම්බන්ධයෙන් මා ඊට වඩා කියන්නෙ නැහැ. නමුත් මම විශෙෂයෙන් ඉල්ලනව මේ ගැන තියුණු පරීක්ෂණයක් පවත්වන්නය කියා. ඒ මොකද, මේ ඔක්කොම හොරකම් වහනව වීරසූරිය නමැති එකවුන්ටන්ට්. මේ අය පත්‍රවලටත් ප්‍රකාශ නිකුත් කරනව. 1963 ඔක්තෝබර් 29 වෙනිද "ඩේලිනිවුස්" පත්‍රයෙ මෙහෙම තිබෙනව.

"INTERDICTIONS AFTER SECOND BIG FRAUD

A series of interdictions are expected in the Irrigation Unit at Karawillagama in the Kataragama area, following the detection of a Rs. 35,000 fraud there."

මේ හොරකම් ගැන පසු ගිය අවුරුද්දෙ අවසාන භාගයෙදි මා මෙම ගරු සභාවේදී ප්‍රකාශ කළාට පස්සෙ ඒ දවස්වලමයි මේ ප්‍රවෘත්තිය පත්‍රයෙ පළ වුණේ.

"The detection was the first result of on-the-spot investigations by the Chief Accountant of the Irrigation Department...."

මෙයා තමයි මේ පල් හොරුන්ගෙ නායකයා. ඔක්කොම හොරකම් වහන්න ඉන්නෙ මෙයයි. මේ එකවුන්ටන්ට් පුහුණු වුණු "චාටර්ඩ් එකවුන්ටන්ට්" කෙනෙක් නොවෙයි. වෙන දෙපාර්තමේන්තුවක ලිපිකරුවෙක් වශයෙන් සිටි මේ තැනැත්තට උසස්වීමක් දී මේ තැනට පත් කර තිබෙනව. සාමාන්‍යයෙන් ගණකාධිකාරීන් අවුරුදු දෙක තුනක් ඇතුළත මාරු කරනව. නමුත් මේ නිළධාරියා පත් වී දැනට අවුරුදු 5ක් ගත වී ඇතත් තවම මාරු කර නැහැ. එතැනම ඉන්නව. එපමණක් නොවෙයි, මේ දෙපාතීමේන්තුවෙ තිබෙන අභ්‍යන්තර ගණන් පරීක්ෂක අංශයෙ ප්‍රධානියත් මෙයයි. හොරාගෙ අම්මගෙන් පේන අහනව වාගෙ වැඩයි කෙරෙන්නෙ. හොරකම් අල්ලන්න ඉන්න අය හොරකම් කරනවා නම් වැඩේ හරි යාවිද? ඒ වගේම මේ නිලධාරිය වැඩි පුර ඉන්නෙ මහ කන්තෝරුවෙ නොවෙයි. රාජාංගනේ, පදවියෙ, චන්ද්‍රිකා වැවේ, එඩ වලවේ ආදී ඔය කියන සෑම තැනකම ඉන්නව. මෙයාගෙ සම්බන්ධකාරයො හොර කණ්ඩායම් වශයෙන් හැම තැනම මුල් බැහැල ඉන්නව. ඒ හොරකම් ඔක්කොම වහන්න ඉන්නෙ වීරසූරියයි. ගණන් පරීක්ෂක කටයුතුවලට ගියත් කරන්නෙ ගණන් පරීක්ෂක වැඩ නොවෙයි.

මේ දෙපාර්තමේන්තුවෙ පුදුම විධියෙ සංවිධානයක් තිබෙනව. ඕනෑම හොරකමක් කරල අධ්‍යක්ෂට, දන නමස්කාර කර හොඳ "පාටියක්" දැම්මම ඔක්කොම හරි. උන්නැහෙ ඉන්නෙ ලොකු උත්සවවලට යන්න පමණයි. උන්නැහෙ ලොකු රූකඩයක්. උන්නැහෙගෙන් ඇති වන එකම සේවය වැඳුම් පිදුම් ලබා ගැනීම පමණයි. පුද පඬුරු සහ වැඳුම් පිදුම් ලබා ගැනීමයි. කතරගම දෙවියො දේවාලෙ ඉන්නව වාගේ, උන්නැහෙත් ඒ විධියටම ඉන්නව. ඊළඟට තවදුරත් මෙසේ සඳහන්ව තිබෙනව:

"Ministry sources said that the Minister's directive had followed almost immediately on receipt of the complaints and that the investigations had been both swift and thorough.

This is the second recent occasion when a fraud in the Irrigation Department was unearthed as a result of investigations ordered by the Lands Minister.

The earlier defalcation was also in a unit located close to an area venerated for religious reasons—the Mahiyangana area."

නමුත් අද වන තුරු කාගෙද වැඩ තහනම් කර තිබෙන්නෙ? එක සුළු නිලධාරියකුගෙ පමණයි. ඕවර්සියර් කෙනකුගෙ පමණයි. ගුණසේකර ඉංජිනේරුවට රුපියල් 300කුත් වැඩි කර උසස්වීමක් දී තිබෙනව. වීරසූරිය තවම හොරකම් වහනව. අධ්‍යක්ෂක තවම ප්‍රධාන තැන ඉන්නව. "කොන්ට්‍රැක්ට්ස් ඉරිගේෂන් එංජිනියර්" තවම ඒ කටයුතු කරනව. කාවද ඇල්ලුවෙ? පරීක්ෂා කෙළේ කවුද? ඒ කොන්ත්‍රාත්තුව ගැන එපමණයි.

කවුඩුල්ල වැව ව්‍යාපාරයට සම්බන්ධ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය ගැන මට කියන්නට සිදු වී තිබෙනව. මට ඒ ගැන කියන විට එම නිලධාරීන්ගේ නම් කියන්නට සිදු වීම ගැන කණගාටු වෙනව. පෞද්ගලික වශයෙන් මම ඒ අය ගැන දන්නෙ නැහැ. පළමුවෙන් ම එයින් එක් ඉංජිනේරුවෙක් ගැන කියන්නම්. ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමනි, මෙම ව්‍යාපාරයට සම්බන්ධ දෙපාර්තමේන්තුවෙ කෙරෙන දූෂණකම් අවබෝධ කර ගන්නට, අකමැත්තෙන් වුවත් ඒයට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කියන්නට සිද්ධ වී තිබෙනව. මම කැමති නැහැ, ඒ අයට මෙතනට ඇවිත් උත්තර දෙන්න බැරි නිසා නම් වශයෙන් කියා වරද පෙන්නා දෙන්න. නමුත් මම හෙළිදරව් කරන කාරණා සත්‍ය බව මා හොඳින් දන්නා නිසාත්, ඒ බව පැහැදිලි කිරීමට සහතික ඉදිරිපත් කළ හැකි නිසාත්, වගකීමකින් යුක්තව මේ ප්‍රකාශයන් කරන්න කැමතියි. එම නිසා ගරු ඇමතිතුමාත් මට සමාවන්න ඒ අයගේ නම් සඳහන් කරන්නට මට සිදු වී ඇති නිසා. නමුත් ඒ අයගේ නම් නොකීවොත් සමහර විට තමුන්නාන්සේටත් දැනගන්නට නොලැබේවි; ඒ වාගේම මහජනතාවටත් දූෂණ කටයුතුවල යෙදෙන ඒ පුද්ගලයන් කව්ද කියා දැන ගැනීමට අවස්ථාවක් සැලසෙන්නෙ නැහැ. මම පළමුවෙන් සඳහන් කරන්නෙ ඩයස් අබේසිංහ කියන පුද්ගලයා ගැනයි. මේ තැනැත්තාට දෙපාතීමේන්තුවෙන් රුපියල් තුන්සියයක එලවන්ස් එකක් ලැබෙනව. මේ පුද්ගලයා අවුරුදු හයකට ඉස්සර පුදුම වැඩ කළ කෙනෙක්.

මයියන්ගනෙ—අලුත් නුවර පැත්තෙ—වාරිමාගී දෙපාර්තමේන්තුවට අයත් ඒ ඒ ස්ථානවල සිටින වැඩිපුර කම්කරුවන් එකතු කර ඒ අය ලවා පාරක් කැපීමට මේ පුද්ගලයාට නියෝග කළා. මේ අනුව කැලය සුද්ධ කර ඒ මැදින් පාර කපන්නටයි තිබුණේ.

"To recruit surplus labour of the Department from certain specific divisions."

මුන්නැහෙ ඒ නියෝගය අනුව කම්කරුවන් 276 දෙනකුගෙ චෙක් රෝලක්—නම් ලැයිස්තුවක්—සකස් කළා. නමුත් එම ලැයිස්තුවට ඇතුළත් වුණේ, අර නියෝගය පරිදි, වැඩ කරන ස්ථානවල සිටින අමතර කම්කරුවන් නොවෙයි. වෙනත් කම්කරුවන්. මේ කම්කරුවන් 276 දෙනා මාසයේ 30 දවසේම නොකඩවා, එක දිනයක්වත් විවේක ගන්නෙ නැතුව, වැඩ කර තිබෙනව. මම හිතන්නෙ නැහැ ලංකාවෙ කොතැනකවත්, කොයිම දෙපාර්තමේන්තුවකවත්, මේ අන්දමට මාසයේ තිස් දවසේම නොකඩවා වැඩ කර තිබෙනවාය කියා. එක කම්කරුවකුවත් ලෙඩ නිවාඩු අරගෙන නැහැ. වෙනත් නිවාඩු අරගෙන නැහැ, වැඩට නැවිත් නතර වෙලා නැහැ. අඩු ගණනෙ පින්කමක්වත් වෙලා නැහැ. දරුවකුගෙ වැඩිවිය පැමිණීම වෙනුවෙන් නිවාඩුවක් අරගෙන නැහැ. මරණයක් වෙලා නැහැ. ඒ කම්කරුවන් 276 දෙනා තිස් දවසේම නොකඩවා, නිවාඩු ලබාගන්නෙ නැතුව, වැඩ කර තිබෙනව. මේ කාරණය පිළිබඳ විභාග කිරීමෙන් පසු හොරකම අසු වුණා. මෙම වරදට කළ දඬුවම අවුරුදු හයක ඉන්ක්‍රිමන්ට්—පඩි වැඩි වීම්—නැවැත්වීම පමණයි. ප්‍රධාන ඩිරෙක්ටර් උන්නැහෙ මේ හොරකම් ගැන දන්නව. තමන්ගෙ හවුල් කාරයෙක් වුණාට ඒ කාරණය කෙළින්ම යටපත් කරන්නෙ නැහැ. සුළු දඬුවමක් දීලා පස්සෙ ඒකට සමාව දෙන එකයි කරන්නෙ. ඒ වරදට ඉන්ක්‍රිමන්ට් හයක් නැවැත්තුවට, පස්සෙ එයින් පහක් ඉවත් කර තිබෙනව. අනික් ඉන්ක්‍රිමන්ට් නැවැත්වීමත් ඉවත් කරන්නටයි ලැහැස්ති වෙන්නෙ. උන්නැහෙ තමයි කවුඩුල්ල භාරව ඉන්නෙ.

පසුගිය කාලයෙදී කවුඩුල්ලෙ තිබුණා ලොකු බාලක්. මෙම නැටුම් බාලට කොළඹින් පවා "ඔකෙස්ට්‍රා" එකක්—බෑන්ඩ් කණ්ඩායමක්—ගියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම දන්නෙ නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
පත්‍රයෙත් තිබුණා. ආණ්ඩු පක්ෂය අනුගමනය කරන "ට්‍රිබියුන්" පත්‍රයෙ තිබුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මගේ ඡන්ද කොට්ඨාශයෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

"REVEAL that the high jinks of the top brass of the Irrigation Department seem to be starting once again . . . At the present moment, a big tamasha is being organised in a Dry Zone centre which was first opened up by D. S. Senanayake in the thirties. Where ruthless inquiries should be conducted into allegations of fraud and corruption, a major tamasha is being organized to make people forget and forgive."

This is a quotation from the "Tribune".

කාලය නැති නිසා මම ඔක්කොම කිය වන්නෙ නැහැ. ඩයස් අබේසිංහයි මෙම බාල සංවිධානය කර තිබෙන්නෙ. මේක විශාල බාලක්—ටමාෂා එකක්—. බෑන්ඩ් කණ්ඩායම ගියෙ කොළඹින්. තමන්ගෙ කොට්ඨාශයෙ සිදු වුණු දෙයක් වුණාට මේවා ඇමතිවරයා දන්නෙ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මගේ ඡන්ද කොට්ඨාශයෙ වුණත් මට ආරාධනයක් ලැබුණේ නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මේව දැන් කියන්නෙ නැතුව කවදද හෙළි කරන්නෙ? මම මේ කාරණා ගැන හොඳට දන්නව. තමුන්නාන්සෙ දැන් මේ කාරණා ගැන දන්නෙ නැති බව ප්‍රකාශ කළේ නැත්නම් මේ වැරදි ඔක්කොම තමුන්නාන්සෙගෙ කරපිටින් යන්නෙ. තමුන්නාන්සෙගෙ නමයි මේකට සම්බන්ධ වෙන්නෙ. තමුන්නාන්සෙගෙ සේවන යටතෙ මේ අන්දමේ හොරකම් ගෙන යනවායයි කල්පනා කරනව. ඩියස් අබේසිංහ හොඳට නටන්න පුළුවන් පුද්ගලයෙක්. නැටුමට දක්ෂයෙක්. වැඩ කරන අතර කුරුඳුවත්තට ඇවිදින් බාල් නටනව. ඒ විතරක් නොවෙයි. දෙපාර්තමේන්තුවට අයත් ලොකු ගෙවල් තිබෙනව. දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන ඉංජිනේරුවන් සමහරෙක් තරුණ අය; නටන්න බොහොම දක්ෂයි.

ගරු සභාපතිතුමනි, මෙම කවුඩුල්ල ව්‍යාපාරයේ පළමුවන පියවර සඳහා රුපියල් 70 ලක්ෂයක් වියදම් කර තිබෙනවා. දෙවන පියවරට රුපියල් ලක්ෂ 90 යි. මේ අවුරුද්දේ රුපියල් ලක්ෂ 10 යක් වියදම් කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ තරම් විශාල ව්‍යාපාරයක් මේ පුද්ගලයාට බාර දෙන්නේ ඇයි? මොහු අළුත් නුවර බොරු චෙක්රෝල් යොදල අහු වුණා. තිස්ස හොරකම් ගැන තවම විභාගයක් තිබෙනවා. එසේ තිබියදීත් මේ තරම් ව්‍යාපාරයක් ඔහුට දීම වැරදියි.

රාජාංගනයේ විශාල කොන්ත්‍රාත්තුවක් දී තිබෙනවා "සිලෝන් ඩිවෙලොප්මන්ට් කම්පැනිය"ට විශාල මුදලකට. එය පටන් ගන්න මත්තෙන් එතැනත් විශාල බාලක් තිබුණා. එදින, මා හිතනවා, ඇමතිතුමාත් සහභාගිවුනා. මට ආරංචියි, එදා ඉංජිනේරුවෙකුත් ගණන් පරීක්ෂක තැනත් පදම කට ගහල—කසිප්පුද, විස්කිද කියා මම දන්නෙ නැහැ—හැසුරුණු ආකාරය ඇමතිතුමාටත් ගැලපුනේ නැති බව. මේ තරම් විශාල බාල් දමා කොන්ත්‍රාත්කරුවා වැඩ පටන්ගන්නවා නම් දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන් ඒ වැඩ පරීක්ෂා කරන්නේ කොහොමද? බාල් දැමීමටද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව තිබෙන්නෙ? මේ එක තැනක් පිළිබඳවවත් පරීක්ෂා කර බලා තිබෙනවාද? චන්ද්‍රිකා වැවේ රුපියල් ලක්ෂ 20 කට කොන්ත්‍රාත්තුවක් දුන්නේ වුවමනා නැති වැඩක් සඳහා බව—කොන්ක්‍රීට් පිටවානක් තැනීම සඳහා බව—දැන් ඔප්පු වී තිබෙනවා. ඒ සඳහා සිමෙන්ති කොට්ට 75,000 ක් යෙදවීමටයි, බලාපොරොත්තු වුණේ. අපේ රටේ නිපදවන සිමෙන්ති මදි නිසා අවශ්‍ය කටයුතු සඳහාවත් පිටරටින් සිමෙන්ති ගෙන්වීමට බැරි තත්ත්වයක් තිබියදී මේ වුවමනා නැති වැඩක් සඳහා හොඳම සිමෙන්ති කොට්ට 75,000 ක් යෙදවීම බලවත් අපරාධයක් බව මම අමුතුවෙන් විස්තර කරන්න වුවමනා නැහැ. රාජාංගනයටත් සිමෙන්ති කොට්ට ලක්ෂ තුනහමාරක් හතරක් පමණ යනවා.මේවා පිළිබඳව දෙපාර්තමේන්තුව හරියට පරීක්ෂා කර බැලුවාද? චන්ද්‍රිකා වැවේ පිටවානට කොන්ක්‍රීට් බැම්මක් වුවමනා නැති බව ඔප්පු වී තිබෙනවා. පස්වලින් බැම්මක් බැන්දාම සෑහෙන බව පිළිගෙන තිබෙනවා. ඇයි එහෙම නම් අනික් තැන්වලත් ඒ විධියට පස්වලින් බැම් බඳින්න බැරි? ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිබඳව පරීක්‍ෂා කර බලාද, මේවා කරන්න දී තිබෙන්නේ ? චන්ද්‍රිකා වැවෙන් හොඳ පාඩමක් ඉගෙන තිබෙනවා. ඒ පිළිබඳව පරීක්‍ෂා කර බැලූ නිසයි, අපතේ යාමට තිබුණු රුපියල් 20 ලක්ෂයක් බේරාගත්තේ. පරීක්‍ෂා කර බැලූ නිසා හොරකම අඩු වුණා. ඒ නිසයි, පරීක්‍ෂා කිරීමට ඉඩ නොතබා මෙතැන කොන්ත්‍රාත්තුව අත්සන් කර ඇත්තේ.

පූ. භා. 10.45

උඩ වලවේ යෝජනා ක්‍රමයේ සැලැස්ම ඇමරිකන් ඉංජිනේරුවන් යෙදුවේ. ඔවුන් කියා තිබෙනවා, කොන්ක්‍රීට් බැම්මක් දැමීම වුවමනාය කියා. ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ චෙකොස්ලොවැකියානු විශේෂඥයින් පෙන්නා දුන්නා, කොන්ක්‍රීට් බැම්මක් දැමීමට යන වියදම අපතේ යන මුදලක්ය කියා. සිමෙන්ති බැම්මක් වුවමනා නැත, ඒ වෙනුවට පස්වලින් වේල්ලක් බඳින්න පුළුවන්ය, එසේ කළොත් වියදමෙන් රුපියල් 2,50,00,000 ක් අඩු කර ගන්න පුළුවන්ය කියා ඔවුන් පෙන්නා දී තිබෙනවා. එපමණක් නොවෙයි, එහි ජල විදුලි බලයත් සියයට 15 කින් වැඩි කරන්නට පුළුවන, වැවත් ටිකක් ලොකු කරන්න පුළුවන්ය කියා තිබෙනවා. එහි අපතේ යන මුදල් අඩු කරගෙන ප්‍රයෝජන තවත් වැඩි කරගන්නා අයුරු පෙන්නා දී තිබෙනවා.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව තවත් කාරණයක් මතක් කරන්න තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මම කියන්නම්. කවුඩුල්ලේ ඉංජිනියර් ගැන මට දන්වා එවා තිබෙනවා.

The punishment imposed on the I. E. was by the Public Service Commission. Charges were framed against him and after a disciplinary inquiry punishment was imposed on him. He is not in receipt of a special allowance for the past three months.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

තුන් මාසයෙන්ද අඩු වුණේ ? බලන්න ඔතැනට ගොස් දැන් කොපමණ කල්ද. හොරකම කරලා අවුරුදු 4 ක් 5 ක් වෙනවා. ලොකු හොරකමක් කර එය වහන්න සුළු දඬුවමක් දෙනව. ඒක තමයි දක්ෂකම. මේ අය දක්ෂම පල් හොරු. ඒ අය දඬුවම් කරනවා. සමහර කසිප්පු කාරයෝ, විශාල මුදලාලිලා, ගංජාකාරයෝ සිටිනවා; හිටි හැටියෙ පොඩි කොල්ලෙක් ඉස්සරහට දමනව. රුපියල් 25 ක් 50 ක් ඔහුට දඩගහනව. එතකොට පොලිසියත් බේරිලා. පොලිසියත් රාජකාරිය කරනව; බිස්නස් එකත් ගෙනියනව. වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් ඒ වගෙයි. මස්කෙළිඔය කොන්ත්‍රාත්තුවට "එස්ටිමේට්" එක තිබුණේ කෝටි 11 යි. ඇමෙරිකන් ඉංජිනේරුවරු සැලැස්ම හැදුවා ඒ පස්වලින් බැම්ම බැඳීමට. නමුත් කැනේඩියන් කොන්ත්‍රාත්කාරයින් සමග සාකච්ඡා කරන විට මොකක්ද වුණේ ? විදුලි බල දෙපාර්තමේන්තුවේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම යන නිලධාරීන් විශාල පඩි ලබා ගැනීමට ඔවුන්ගේ සහචරයින් වශයෙන් කටයුතු කරනවා. එවැනි අය කැනේඩියානු කොම්පැනිවලට සේවය කරන්න ආසාවෙන් සිටිනව. ඒ කොම්පැනි කිව්වා, මෙය පස්වලින් හදන්න බැරිය, කොන්ක්‍රීට්වලින් හැදිය යුතුය කියල. රුපියල් 6 කෝටියක් වැඩියෙන් කොන්ත්‍රාත්තුව අත්සන් කළා. එය පරීක්‍ෂා කරන්න සූදානම් වන විට සමහර ඉංජිනේරුවන් මුදල් අමාත්‍යාංශයට දැන්නුවා, මේවා ගැන පරීක්‍ෂා කරන්න ඕනෑ නැත කියා. පිටරටක් සමග කරන ගනුදෙනුවක් නිසා මෙයට වාර්මාර්ග දෙපාර්තමේන්තුව පමණක් නොවෙයි මුදල් අමාත්‍යාංශයත් සම්බන්ධයි, නමුත් කැනඩාවේ කොන්ත්‍රාත්තුව හදිසියේම අත්සන් කළා. ඒ ගැන විභාග කර බලන්න, පරීක්‍ෂා කර බලන්න මත්තෙන් අපේ විශේෂ මහ කොමසාරිස්තුමා එහි ගොස් එය අත්සන් කළා. පස්වලින් එය බඳින්න බැරිද, කොන්ක්‍රීට් බැම්ම අවශ්‍යද, 6 කෝටියක් වැඩියෙන් ගැනීම සුදුසුද, කියන ප්‍රශ්න හරි හැටියට විභාග කළේ නැහැ. ඒ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන් අපේ රටට අලාභ වෙන්නටත්,

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

විදේශීය කොම්පැනිවලට වාසි වෙන්නටත් කටයුතු කරනවා, ඔවුන්ට කොමිස් තිබෙන නිසා. රට විකුණූ තරමට ලාභ ප්‍රයෝජන ලබන අය සිටිනවා. ඒ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම අපට අවාසි වන විධියට කටයුතු කළා. එපමණක් නොවෙයි, ඒ කොන්ත්‍රාත්තුව අනුව අපට බඩු ගන්නත් පුළුවන් ඒ රටින් පමණයි. මේ සඳහා වුවමනා කරන උපකරණ ගන්නට පුළුවන් ඒ රටින්ම පමණයි කියා කොන්දේසියක් තිබෙනවා. නමුත් ලෝක වෙළඳපොලේ කවුරුත් පිළිගන්න කරුණක් තිබෙනව. එනම්, කැනේඩියානු බඩු අනික් රටවල ඒවාට වඩා සියයට 25 ක් මිළ වැඩියි ; නමුත් බඩුවල තත්ත්වය නම් එක සමානයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කැනඩාවෙන් දෙන්නෙ ණයක් වශයෙන්.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මෙයට හේතුව වශයෙන් ගරු ඇමතිතුමා පෙන්වන්නෙ ඒ උදවිය රුපියල් කෝටි 6 ක පමණ ණයක් දෙන එකයි. නමුත් ඒ ණය දෙන්නෙ සියයට 6යේ පොලියට. ඉල්ලුවා නම් චෙකොස්ලොවේකියාවෙන් සියයට 2½ රේ පොලියට මේ ණය ගන්නට තිබුණා. වලවේ ව්‍යාපාරය රුපියල් 2,50,00,000ක් ලාභ ඇතිව කරන්න පුළුවන් වුණානම් මස්කෙළි ඔයේ මේ වැඩේටත් ඊට වඩා ලාභ ගන්න පුළුවන් විධියට සියයට 2½ රේ පොලියට රුපියල් 6 කෝටියක් අඩුවෙන් කරන්න ඔවුන්ට බාරගන්න පුළුවන්කම තිබුණා. සමාජවාදී රට වලින් මේ රටේ ව්‍යාපාරවලට ආධාර ලබා ගැනීම වැළැක්වීමට තිබෙන බල කොටු වලින් ප්‍රධාන එක තමයි විදුලිබල සහ වාරිමාර්ග දෙපාර්තමේන්තු. එවැනි රටවල් සමග සම්බන්ධවීම වැළැක්වීමට සාර්ථක ලෙස මෙපමණ කලක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කළා. දැන් මේ දෙපාර්තමේන්තුවෙ ප්‍රධාන නිලධාරීන්ට සිංදු වගෙයි ඔවුන් ආවේශ වූ කට්ටියක් වගෙයි. උඩවලවේ ව්‍යාපාරයෙන් පළමුවෙනි වරට ඇමතිවරයාට හොඳ හැටි අවබෝධ වුණා. යම් යම් කටයුතුවලදී තමා වටේ සිටින නිලධාරීන්ගේ අදහස් ලබා ගැනීම පමණක් නොව තමාත් ඒ ගැන නිදහස්ව කල්පනා කළ යුතු බව. ලාභයට හොඳට වැඩ කරන්ට පුළුවන් බව පෙන්වා දී තිබෙනව. සමාජවාදී රටකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුත්තක් සඳහා පළමුවෙනි වරට කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමට මග පාදා ගන්ට පුළුවන් වුණේ, මෙතරම් විශාල හොරකමක් එළිදරව් කර, රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක ලාභයක් පෙන්වා, සැලැස්මේ දුර්වලකම් පෙන්වා කරුණු අවබෝධ කර දීමෙන් පසු, පසුගිය මාසයේයි. ඇමරිකන් හා ප්‍රංශ ඉන්ජිනේරු සමාගම්වල බලපෑම් කොතරම් තිබුණත් ඒව හරි ගියේ නැහැ. 1958 සිට 1964 දක්වා ඒ රටවලින් ලබා ගන්ට තිබුණු ආධාර සියල්ලටම මේ පිරිස විසින් අවහිර යෙදුව. මගේ කථාව කර ගෙන යන විට එය හොඳ හැටි පැහැදිලි වෙයි.

ගරු සභාපතිතුමනි, රට සංවර්ධනයට වැළඳී තිබෙන ප්‍රධාන වසංගතය තමයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරීන්. අද පල් හොරුන් වගේ විදේශීය කොම්පැණි සමග සම්බන්ධකම් ඇතිව වැඩ කරන කොටසක් එහි සිටිනව. ඒ සඳහා සෑම උපක්‍රමයක්ම ඔවුන් යොදනව. වෙනෙකක් තබා සුළු හොරකම්වලට සුළු දඩුවම් පවා දෙනවා, සැක නැති කරන්ට. මේ උදවිය කටයුතු කරන්නෙ නියම හොරුන් වගෙයි. හොරකම් කරන විට භය නැති වන්ට ඕනැ, ඒ වගේම අහංකාර කම හොඳටම තිබෙන්ට ඕනැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ගිහින් බලන්න. වාරිමාර්ග අධ්‍යක්ෂකගෙ කාර්යාලයෙ මේ ගරු සභාව පවත්වන්ටත් පුළුවන්. ඒ තරම් විශාලයි. ඒ වගේ උසස් නිලධාරීන්ගේ කාමර දුසිම් ගණනක් එහි තිබෙනව. පල්ලෙහා තට්ටුවේ කාර් නවත්වන්න ගරාජ් හදා තිබෙනව. ඒ උසස් නිලධාරීන්ගේ කාර් එසේ මෙසේ තැන්වල නවත්වන්න බැහැ. පහළ තට්ටුවේ හතළිස් අඩි දෙදාහක් පමණ වෙන් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනව, කාර් නවත්වන්න. තැපැල් ඇමතිවරයා මාසයකට රුපියල් 5,000 ක් සෙලින්කෝ ගොඩනැගිල්ලට ගෙවමින් ඇමති කාර්යාලය පවත්වාගෙන යනව. ඒ වගේ ඇමති අංශ ගණනාවක් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙ පවත්වන්න පුළුවනි. ඒ ස්ථානයේ සිදුවන දූෂණ හා අක්‍රමිකතා ආදිය වසා ගැනීමට ලොකුම පල් හොරු කරන වැඩේ තමයි, බුද්ධාගම ඊට ආයුධ යක් කර ගැනීම. අගමැතිනිය සතුටු කර වන්ටද කොහෙද හිතාගෙන එහි ඉස්සර හින් බුද්ධ රූපයක් තනවා තිබෙනව. එය දක්ෂ ශිල්පියෙකුගෙ නිර්මාණයක් හැටි යට අපට පිළිගන්ට පුළුවන්. කාර්යාලයේ පිටුපසට ගිහින් බලන්න එතැන තමයි, බෝගහ ඉන්දල තිබෙන්නෙ. ඒ බෝගහ පැළවෙන්නෙ රසායනාගාරයෙයි. බෝධි මලුව තිබෙන්නෙ කඩා බිඳ වැටුණු පරීක්ෂණාගාරය තිබෙන තැනයි.

අධ්‍යක්ෂවරුන් විශාල උඩු මහල් සහිත මාලිගා හදාගෙන ඉස්සරහ කොටසේ සිටි නව. බුද්ධ රූපයක් ඉස්සරහින් තබා ගෙන හොරකම් වහන්නට ලෑහැස්ති වෙනව. පිටුපස්සේ රසායනාගාරයේ තිබෙන විශාල යන්ත්‍ර දිරාපත් වෙනව. පාරෙන් අනික් පැත්තෙ තහඩු මඩු තුන හතරක් හදා තිබෙනව. පර්යේෂණ නිල ධාරීන්ට කටයුතු කරන්න. ඒ උදවියට අව්වේ වේලි වේලි වැඩ කරන්ට සිද්ධ වී තිබෙන අතර හොරකම් කරන නිලධාරීන් ට විශාල කාමර සපයා තිබෙනව. නිලධා රීන් නැති විශාල හිස් කාමර ගණනාව කුත් එහි තිබෙනව. ඒ කාර්යාලයේ නිල ධාරීන්ටත් කටයුතු වලටත් ඒ ගොඩ නැගිල්ලෙන් දහයෙන් පංගුවක් හොඳටම ඇති. අනික් ගොඩනැගිලි ටිකෙන් අද තිබෙන කාර්යාල ගිහය ඉතාමත් හොඳින් පිරිමසා ගන්න පුළුවන්. අර පහළ තට්ටුව කාර් ගරාජ සඳහා වෙන් කරන්ට වුව මනාද? කාර් දමන්න ඇස්බැස්ටෝස් ගැසූ ගරාජ පිට සාදා තිබෙනව. නමුත් මේ අධ්‍යක්ෂගේත් තවත් දෙතුන් දෙනෙකු ගේත් කාර් දමන්න පහළ තට්ටුවේ සත රැස් අඩි 2,000 ක් පමණ පාවිච්චි කරනව. මේ අයගේ වැඩ පිළිවෙළ ගැන මේකෙන් අවබෝධ කර ගන්න පුළුවනි.

මට තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනව. පසුගිය දවස්වල එක්සත් ජාතීන්ගේ මණ්ඩලයත් ආණ්ඩුවත් සාකච්ඡා කර මහවැලි ගඟ ව්‍යාපාරය සම් බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනව. ඒ වාර්තාව තවම මේ ගරු සභාවට ලැබුණෙ නැහැ. මා ඒ ගැන දොස් කියනවා නොවෙයි. නමුත් ඒ වාර්තාවේ විස්තර ටිකක් දිනපතා පත්‍රවල පළවුනා. ඒ නිසා අපට ඒ මාර්ගවලින් මේ වාර්තාව සම්බන්ධ කරුණු ටිකක් දැනගන්නට ලැබී තිබෙනව. මහවැලි ගඟ හැරවීමේ ව්‍යාපාරය ක්‍රියාවේ යොදවන්නෙ නැත කියා ආණ්ඩුව පිළිගෙන තිබෙනව. ඒ ගැන මා වචනයක් දෙකක් කිව යුතුව තිබෙනව. ප්‍රතිගාමී ව්‍යාපාර අපේ සංවර් ධන වැඩ කටයුතු කඩාකප්පල් කිරීමට ක්‍රියා කරනවා පමණක් නොවෙයි. ඔවුන් ගෙන්, ඒ අධිරාජ්‍යවාදී සමාගම්කාරයින් ගෙන් බේරගෙන ගිය ව්‍යාපාරත් සම්පූර්ණ යෙන්ම ඔවුන්ගේ බැම්වලින් බැඳගෙන අපේ ආර්ථික නිදහස වහල් කර ගැනීම සඳහාත්, රජයේ දෙපාර්තමේන්තුවල කටයුතුවලට විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සමාජ වාදී රටවලින් ලැබෙන ආධාර වැළැක්වීම සඳහාත් ගෙන යන විශාල ප්‍රයෝග සම් බන්ධයෙන් මා විස්තර කරනව. මගේ කථාව ආරම්භ කළ දවසේ, ගිය සිකුරාදා අධිරාජ්‍යවාදීන්ට කත් අදින, අර පිට කොන්ද පණ නැති අශ්වයො කරත්ත අදිනවා වාගේ, "ඔබ්සර්වර්" පත්‍රයේ වාර්තාකරුවන් මගේ කථාව විදෙශවල අලං කාර විස්තරයක් හැටියටත් විහිළුවක් හැටියත් විස්තර කරන වාර්තාවක් පළ කර තිබුණා. නමුත් ඒ උදවියගේ විහිළුවල මිම්මෙන් අපෙන් ඉටුවිය යුතු ජාතික යුතුකම් පිළිබඳ කරුණු මණින්නෙ නැති බව මා මතක් කරන්ට සතුටුයි.

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයත් ආණ්ඩුවත් පොදුවේ ඉදිරිපත් කළ මහ වැලි ගඟ ව්‍යාපාරය සම්බන්ධ වාර්තාවේ මෙසේ සඳහන් වී තිබෙනව:

"There has been no overall development plan hitherto for the entire dry zone . . . The Government of Ceylon does not wish to implement the Mahaweli Diversion Scheme, before having

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

sufficient information on the entire development possibility under the Mahaweliganga of half a million acres".

මම මේ වාර්තාවෙන් සටහන් කරගත් කොටසකුයි කියවන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Do you not think it is correct?—Not to start work on the diversion.

පූ. භා. 11

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

හරි. නමුත් එතකොට මේකෙ මෙහෙම තියෙන්නෙ මොකද කියා කියන්න.

"The idea of diverting the Mahaweliganga to the North-Central Province has been discussed for a number of years....

The Mahaweli-ganga basin is to be used as a specific model and demonstration area..."

These remarks appear under the heading "Authorization for studies to divert the Mahaweli-ganga waters to the N. C. P." in the introduction to the report.

ඒකෙ ඒ, බී, සී, ඩී කොටස්වලින් ඩී කොටස මා දැන් කියවනව:

"(d) all of which shall be incorporated into a comprehensive Mahaweli-ganga report...in order to permit early implementation of the Government's committed program for diverting a portion of the basin water to the North-Central Province, it is proposed that this phase of the plan be ready for inclusion in the 1959-60 Budget".

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

It is true. After the whole thing is prepared. The Americans were doing this; they were doing the whole thing.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

"The interim report issued in August of 1959 was written to comply with the latter part of the agreement. This Trans Basin Diversion Report establishes the feasibility of the diversion plan and permits early implementation of the Government's committed program."

The report was published so that this could be included in the 1959-60 Budget in order to carry out the diversion. This is only about diversion.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Not for construction? After the project report we have to get detailed plans and estimates which, at least, takes about two years. You cannot start at once. You will find this in the Mahaweli-ganga major scheme. The U. N. team will take at least two years to prepare the plans of that project.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

I am sorry, I do not accept the explanation of the Hon. Minister. This report was not only published but the Secretary to the Treasury, Mr. Shirley Amerasinghe, just before he left for New York for negotiating a Rs. 1,200 million loan to implement the diversion scheme, mentioned to me in the presence of the then Minister of Finance, Mr. F. R. Dias Bandaranaike, that this was a foolproof scheme, that it was to be implemented immediately and that the cost—benefit ratio was very favourable. He flew to New York to negotiate a loan of Rs. 1,200 million in order to implement it.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Construction work cannot start till plans and estimates are ready on that report. It is only a feasibility report.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

American engineers were working at Peradeniya in connection with the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

diversion scheme canal and they were siting locations for the diversion canal right up to near Anuradhapura.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

That is a special check.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

Did they not go into details of boring, finding out soil conditions and the geological conditions for the canal ? Did they not give an estimate for the concrete lining of canal of over 100 miles in detail ? Were not negotiations started for the loan ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I want to tell the hon. Member that, whatever he thinks, the U. N. team prepared the designs and estimates, and how long it will take is not a matter for argument.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

The U. N. team is a different thing. Do not confuse the issues ; the U. N. team is a recent thing : it came after we exposed this in Parliament. The U. N. team says it wants two years for investigation and then another two years for preparation of the scheme before tenders are finally called for—in all four years. You have to spend about Rs. 14 million during this period of four years. I entirely endorse that report by the U. N.

This USOM feasibility report says in order to justify diversion that lower Mahaweli basin is not worth development for rice cultivation.

"Those areas which are low and do not have adequate natural drainage, such as those adjacent to lower Mahaweli, have not been recommended for development."

They were developing arguments to justify the diversion. "The lower Mahaweli is unfertile and unsuited, alkaline content is high and it is unsuitable for development."

But in contrast what does the U. N. report say ? The U. N. Report refers to the Mahaweli basin development all through. "The Mahaweli-ganga diversion scheme was originated in 1956 by the Hon. C. P. de Silva, the time the country began receiving aid from the U.S.O.M. and the study of the Mahaweli-ganga diversion was one of the earlier projects undertaken by the U.S.O.M. For reasons beyond control the work of the U. S. Aid was stopped soon after the report on the diversion scheme was out and the work almost came to a standstill."

At least now I would like the Hon. Minister to inform us about the meaning of the words "beyond control". How did the U.S.O.M. assistance come to a standstill immediately the diversion report was out ?

The project for the U. N. Technical Assistance Association was to study and approve of the U. N. Development Plan A, B, C, D (I do not want to go into that), I will read only item E :

"To review and complete the feasibility to study the Mahaweli diversion scheme."

They admit that it has to be reviewed and then it has to be completed. According to the Diversion Report of U.S.O.M. it is to be estimated for in the 1959-60 Budget estimate. The U. N. team contradicts this and states that the diversion scheme has to be reviewed and it is not complete and therefore they have to study the diversion scheme. They make a further statement which is very significant.

"The main river basin can also be developed by two storage reservoirs at Victoria and Randenigala, two adjacent dam sites with a storage capacity of over a million generating to 200,000 kw."

Two reservoirs will contribute to a reduction of floods in the flood-plain. The lower regions consist of fertile alluvial soil in the flood plain which has not yet been developed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

for agriculture. The basin will receive special consideration and priority will be determined for implementation of various projects. 150,000 acres on the right bank remain undeveloped yet. A very large area below Minipe remains to be developed yet where they emphasize that the priorities have to be determined after proper investigation. In the diversion scheme as the priority was pre-determined the Americans submitted the report of the diversion. It was signed on behalf of the U.S.O.M. Director by the American Engineer and by Mr. E. C. D. de Gunasekera, Ceylon's Director of Irrigation on behalf of Ceylon. They state that this is the committed programme and this should be included in the 1959-60 Budget and that the implementation of this project was definitely being attempted during the period of 1959-60 and Shirley Amerasinghe was sent to New York to negotiate on this project. The proof of that is this, an elaborate report which was published on the Malwatu Oya Reservoir, all the investigation was done with the Assistance of the Soviet Engineers. This report was unceremoniously put in the pigeon hole. The reason was the commitment for the Rs. 1,200 million scheme for the diversion of the Mahaweli-ganga. This report was signed by Ignatov, Hydrolic Engineer of the Ministry of the U.S.S.R., and Mr. R. F. Ramananthar, Irrigation Engineer, Irrigation Department, Colombo. They read a report on this at the Economic Commission for Asia and the Far East—the Regional Technical Conference on Water Resources Development—and it was maintained that this is the most economical scheme devised by a foreign country offering aid in any part of South East Asia. That is not denied.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

But the benefit to cost ratio was less than——

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

I am not prepared to enter into a discussion on this benefit to cost ratio.

They maintained in that report at that conference that this is the most economical and beneficial scheme ever designed in South East Asia by a foreign country offering aid. This scheme was pigeon-holed because of the Mahaweli-ganga Diversion Scheme committed programme. Then, the Kalu-ganga Scheme was taken off the list for the same reason, and it was said on the Floor of this House that the Kalu-ganga Scheme was taken off the list on the instructions to the Irrigation Department by the then Minister of Finance, Mr. Felix Dias Bandaranaike, when he visited Moscow. The Kelani-ganga Scheme was also laid by. All this was—here I come to the most important political aspect of this problem—the most determined effort to prevent inroads into the foreign imperialist monopoly of the Ceylon economy. I say this because the International Bank of Reconstruction, the World Bank, and all the reports from the imperialist foreign experts, those who came to report on the Gal-oya Scheme, every one of them was unanimous—and the Ceylonese experts agreed with them—that the big rivers are beyond development for large-scale multi-purpose schemes like hydro-electricity, flood protection and irrigation schemes. The last such scheme was the Embilipitiya Scheme following the Gal Oya and the Malwatu-oya Schemes. They said that these were the only three schemes possible in Ceylon, and that the big rivers are beyond development and that it is unwise to develop them as they are grandiose schemes which Ceylon could ill-afford. If you read the World Bank report this is quite clear, and the Irrigation Department worked on that basis. And, when they found that the Soviet Union had in its aid programme offered the Kelani-ganga Scheme, the Kalu-ganga Scheme and the Malwatu-oya Scheme at the request of the Minister himself—they

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

had completed a preliminary report with details of the engineering plans and it was ready for construction ; all the data had been obtained and all the specifications and detailed planning were completed—the Malwatu-oya Scheme was considered by the department as the priority scheme out of the schemes that the socialists countries were to provide for Ceylon.

Now, this is what I want to emphasize. These schemes offered by the socialist countries were completely blocked successfully till recently, till the Uda Walawe breach was made, to prevent socialist countries from giving aid for multi-purpose development schemes which will become the starting point for the development of an independent economy in this country.

While I am on this subject, I may also mention that this Mr. Dias Abeysinghe who did that miracle of getting 276 workers to work the full 30 days in the month in the Alutnuwara jungles, was the engineer who was selected by the Director of Irrigation to go on this scholarship to the U. S. S. R. I do not know what benefit he derived from being sent to the U. S. S. R. on a study tour.

පූ. භා. 11.15

I think I have said enough with regard to the activities of the Irrigation Department—the corruption, inefficiency and political reaction that exists there. I do not intend to take more of your time in elaborating any further the doings of the Irrigation Department except to mention the need for investigation into the activities of the department pertaining to road building, maintenance of circuit bungalows and the policy adopted with regard to housing schemes. The department spends more money on the construction of bungalows for staff officers tnan for the provision of elementary accommodation for the work force. One would have expected it to be the reverse ; the handful of staff officers could put up in rest houses and travel from a distance to the work site. The provision of housing accommodation for the work force should be given the first priority.

There are some circuit bungalows which are only used as holiday resorts for some of the officers of this department. Even officers of other departments are studiously prevented from using these bungalows. These circuit bungalows really are holiday resorts and they function as such. They are not meant to assist departmental officers in the supervision of irrigation works. The Hon. Minister will realize this for himself if he goes into this question.

With regard to the Forest Department, the earlier criticisms still hold good and I do not want to repeat what I said last year. The forests continue to be denuded. There are many reasons for this happening and one is this. There is a large colony in Ethimole where the Irrigation Department has bungled hopelessly. There the water does not run from the tank into the paddy fields but water from the paddy fields flow into the tank. The Minister knows that a large area of jungle is being cleared by the people for sheer survival. There is no roadway leading to the colony. There is an enormous amount of timber being felled and burnt to prepare the ground for chena cultivation because the colonists must survive somehow or other.

The same thing is happening in Mahawillachchiya.

ගරු සී. පී.ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

There is plenty of water there.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

There are about 900 families and most of the water available is brackish. So cultivation is not possible in a large portion of the mudded fields. What has happened is that these colonists have got into the grip of traders—and money

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

lenders—and they control the entire working of the scheme. The colonists are employed by these traders in illicitly opening up chena lands. The colonists are permitted to sell paddy to the Government under the Guaranteed Price Scheme but the paddy they actually sell is the paddy produced not in their paddy fields but the paddy produced illegally in the chenas opened by the traders. The traders are carrying on a business of buying up these permits. The paddy grown on these chenas is cultivated in an unscientific and uneconomic method with a view to immediate profit and without any regard to the conservation of the soil. When forests are denuded and illegal rice cultivation takes place, naturally all scientific methods of cultivation are completely forgotten. It is done with a view to getting quick results. This is what is happening in Mahawilachchiya, Ethimole and near Kataragama where large areas of forest land have been cleared. It is happening in many other areas, too, such as Ayagama, Vilpota, Padaviya, Kitulagama and the whole of the Puttalam area. The whole country will be turned into a desert if this enormous amount of felling goes on.

Earlier, most of the damage was done when the Forest Department was manned by civil servants. That one big blunder has been eliminated today after many years of open criticism in the House, although, in spite of that criticism, civil servants continued to rule the roost for quite some time. Now the department has technically-trained officers, but, unfortunately, the big contractors and vested interests concerned with exploiting forests have a dominating influence over the officials of the department. To break through this influence is an immense task and is something that has to be done effectively if we are to preserve our forests.

I make a special appeal because, in the combined report of the United Nations Technical Aid and Assistance Organization and the Government, there is the statement that about 600,000 square miles, the entire area covered by the Mahaweli-ganga, will be investigated. That whole area is to be investigated, not only in regard to irrigation and rice cultivation, but in regard to social and economic problems— the problems of the cultivator, the diversification of crops, the nature of the soil, the commercial crops that could be grown, the raising of livestock, the raising of fodder, the problem of underground water supplies, and the proper development of the river and its utilization for the purposes of hydro-electricity and flood control. It is a comprehensive development scheme which has been agreed upon between the United Nations organization and the Ceylon Government, involving an expenditure of Rs. 14 million spread over four years.

Whilst this scheme is being agreed upon, I appeal to the Hon. Minister to see that our vital resources are not wantonly destroyed, as is being done now, by forests being denuded, illicit cultivation being done by big *mudalalis*, and the colonists being victimized by the *mudalalis.*

පූ. භා. 11.24

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order, please! The Deputy Speaker will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

A good variety of paddy, H4, which grows on dry land, has now been found. The belief that paddy can only be grown on flooded paddy fields has been disproved. On the contrary, the fact that paddy can be grown in dry conditions with the minimum of irrigation and without completely flooding the field has been established. H 4

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

grows well, and yields up to 100 to 150 bushels have been obtained on dry land with a minimum of irrigation and with minimum seasonal rains. Rain once every week or so provides ample water supply for the successful growing of H4 paddy and for obtaining good yields, and in the Dry Zone it is necessary to have minimum irrigation facilities. There need not be eight or ten acre-feet of water as is now considered to be essential. I say that if you have even two acre-feet of water and release it under conditions of proper control it would be sufficient to grow H4 paddy.

So, I earnestly request the Hon. Minister to shake up these departments and see that a new policy is followed. He should take steps to remove corruption from the Hydro-electric Board, the Electrical Department and especially the Irrigation Department. This is essential if we are to benefit by the first thorough investigation we have had with regard to the development of the Dry Zone which has hitherto been a major problem.

I am glad that the Hon. Minister has had the courage and the frankness to admit that he has abandoned the alienation scheme of marginal lands. He must also seriously consider that this present method of advanced colonization has resulted not only in utter destitution of a large number of cultivators who have been denied water for about four or five years, but has also resulted in the illicit clearing of forests for illegal cultivation of rice, and thereby has reduced the primeval forests into infertile chena lands. What is now happening is that because of chena cultivation and because of the supply of tractors for ploughing, most of the rice grown in the Dry Zone is of the H4 variety. These two factors have produced this position.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

The hon. Member has taken over an hour. There are many hon. Members to follow.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

I shall finish soon. As the Chairman of the Committee is anxious that I should finish, may I, in conclusion, earnestly request the Hon. Minister to go into this question of the foreign influences that have been operating and preventing genuine assistance being given to this country for the development of hydro-electricity and the development of water resources, and also take immediate action to bring into being the much delayed Water Resources Board.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The draft Act is before Parliament.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

The Hon. Minister brought it up at the last Sessions. What I am asking is that the Water Resources Board should be immediately constituted with all the changes that are necessary in the draft Bill so that even at this late stage we can preserve the national wealth and develop our resources scientifically and make the country independent both in food production and in industry.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

May I have your permission to leave the House for a short time ? The Hon. Speaker has sent for me. Notes will be taken down by my officers.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ගරු සභාපතිතුමනි, එකම ඇමතිවරයෙක්වත් මෙතන නැහැ. ඒකට ඉතින් කරන්න දෙයක් නැහැ. විශෙෂ වැඩක් තියෙන නිසා වෙන්න ඇති විශේෂ ඉල්ලීමක් උඩ අපේ ගරු ඉඩම් ඇමතිතුමා පිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

වෙලා යන්නෙ. ඒකට කමක් නැහැ. මුලින්ම මේ ආණ්ඩුවට එක් චෝදනාවක් කරන්න තියෙනව. දෙපාර්තමේන්තුවල ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නැහැ. කෘෂිකර්ම අංශයත්, වාරිමාර්ග අංශයත්, ගමනාගමන අංශයත් වෙන් වෙන් වශයෙන් තිබෙන දෙපාර්තමේන්තු වුවත් ඒවායේ ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නොතිබුණොත් එයින් වෙන්නෙ නිකරුණේ මහජන මුදල් නාස්ති වීමයි. "කොඕඩිනේටිං" වැඩ පිළිවෙළක් තියෙන්නම ඕනෑ. වෙනත් වචනවලින් කියනවා නම්, වාරිමාර්ග ඇමතිතුමා යම්කිසි සැලැස්මක් උඩ වැඩ කරන්න යන විට ප්‍රසිද්ධ වැඩ භාර ඇමතිතුමා ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. ඒ කාරණය තවත් පැහැදිලි කරන්න පුළුවනි. යම්කිසි ප්‍රදේශයක වාරි මාර්ගයක් ඇති කරගෙන යනව නම්, ඒ වාරි මාර්ග යම ඔරු පාරු බෝට්ටු ආදිය ධාවනය කිරීමට ප්‍රයෝජනවත් වන ආකාරයට පාවිච්චි කරන්න බැරිදැයි ගමනාගමන අංශය භාර ඇමතිතුමා කල්පනා කරන්න ඕනෑ. මේ කාරණය කෙරෙහි මේ ආණ්ඩුව අද වන තුරු කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. පිටරටින් ගෙන්වනු ලබන ලොරි, කාර්, වෑන්, දුම්රිය ආදිය මේ රටේ තිබෙනව. ඒවායින් බඩු එහා මෙහා ගෙන යනව. ඊට වඩා අඩු මිළකට බඩු බාහිර ආදිය එහා මෙහා ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න බැරිද? ඒක කල්පනාවට ගන්නෙ නැහැ. ඇයි? කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ කටයුතු ගැන මේ ප්‍රශ්නය කොයි තරම් බල පානවද යන්න මීට පෙරත් මා සඳහන් කර තියෙනව. කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ සිමෙන්ති ලංකාව පුරා විසුරුවා හරින්න පහසු ක්‍රම යොදා ගන්න පුළුවන් බවත්, දැන් කෙරෙන ආකාරයට ලොරි සහ දුම්රිය පාවිච්චි නොකර වෙනත් පහසු ක්‍රමයක් යොදා ගත්තොත් මේ වියදම දහයෙන් එක දක්වා අඩු කර ගන්න පුළුවන් බවත් මීට පෙර පෙන්නුවා. ඇතැම් ප්‍රදේශවල වාරි මාර්ග දෙපාර්තමේන්තුව මගින් විශාල වාරි මාර්ග සකස් කර තිබෙනව. ඒ වාරි මාර්ගවලින් ගත හැකි නියම ප්‍රයෝජනය ගන්න බලන්නෙ නැහැ. ඒ ප්‍රදේශ ඇතුළත දියුණු වේගන යන කර්මාන්තවලට අවශ්‍ය බඩුබාහිර ආදිය ගෙන යාමට පහසු ක්‍රමයක් යොදා ගැනීම සඳහා මේ අමාත්‍යාංශ අතර ඒකාබද්ධ වැඩ පිළිවෙළක් ඇති කර ගන්න ඕනෑ. ඒකාබද්ධ ප්‍රතිපත්තියක් අනුව වැඩ කරන්නෙ නැහැ අද. එක එක පුද්ගලයා එක එක් කෙනාගෙ බෙලි කැපීමේ ව්‍යාපාරවලයි වැඩිපුරම යෙදෙන්නෙ. එක් ඇමතිවරයෙක් යම්කිසි වැඩක් පටන් ගත්තම අනෙක් ඇමතිවරයා ඒකට කැමති නැහැ. මේක නොවෙයිද අද හැම දෙපාර්තමේන්තුවකම වගේ ඇති වෙලා තියෙන්නෙ?

පූ. භා. 11.30

එක් ඇමතිවරයෙක් කියනව එක් ස්ථානයක වාරි මාර්ගයක් ඇති කරන්න ඕනෑය කියල. එතකොට තවත් ඇමතිවරයෙක් කියනව එහෙම කළොත් ගමනාගමන වැඩ පිළිවෙළකට එයින් ප්‍රයෝජන ගන්න පුළුවන් වේය කියල. එතකොට මුලින් කී ඇමතිවරයා කියනව ඒ ඇළ ඔය කියන කටයුත්තට පාවිච්චි කරන්න ඉඩ දෙන්නෙ නැහැ කියල. මා කියා සිටියා කීප වරක්ම පුත්තලමේ සිට කළුතර දක්වා පාරුවලින් බඩු ගෙන යන්න වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳ බව. වාරිමාර්ග භාර ගරු ඇමතිතුමා පුළුවන් තරම් ඇළ ශුද්ධ කර දෙන්න ලෑස්තියි. ඒ වුණාට අනෙක් ඇමතිතුමා කියනව, ඊට වඩා වෙනස් මාර්ගවලින් බඩු ගෙන යන්න එතුමාට පුළුවන්ය කියල. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව සම්බන්ධයෙන් කියා සිටි අවස්ථාවේ පැහැදිලි වශයෙන් පෙන්වා දුන්නා එකට දහයක් මුදල් නාස්ති වන ක්‍රමයක් අනුගමනය කිරීමේ වැරද්ද. සියේට අනුව කීන් වියදම් අඩු කර ගැනීමේ මාර්ගයක් ගැන පැහැදිලි කර දුන්නා. යම් යම් ප්‍රදේශවල කර්මාන්ත යනාදිය දියුණු වේගන යනව නම් එම කර්මාන්ත ආයතනවලට අඩු මිලට බඩු බාහිරාදිය ගෙන යාම පිණිස වාරිමාර්ග ක්‍රම සකස් කර දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉස්සෙල්ල වතුර බැස්වීම කළ යුතුය කියාවී. වාරිමාර්ග අංශයෙ වැඩ කටයුතුවලට පාවිච්චි කරන ජල මාර්ග ක්‍රම අතිකුත් අංශවල බඩු බාහිරාදිය ගෙන යාම සඳහාත් පාවිච්චි කරන්න පුළුවනි. නමුත් එය ප්‍රතිපත්තියක් වශයෙන් ක්‍රියාවට දමා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, මා විශේෂයෙන් මේ කරුණු කියන්නෙ ඔරුවල යකඩ කම්හල ගැන සලකා බලායි. එම වැඩපොළට ටොන් කෝටි ගණනක බඩු බාහිරාදිය ගෙනියන්න වෙනව; පරම්පරා ගණනක් තිස්සෙ ගෙනියන්න වෙනව. අද කොළඹ සිට එහි ගෙන යන ටොන් එකක් සඳහා රුපියල් 10 ක් පමණ වැය වෙනව ඇති. නමුත් කැලණි ගඟ ඔස්සෙ යන්න සැතපුම් තුනහමාරක ඇළක් කැපුවාම ටොන් එකක් ගෙනියන්න ශත 80 කට වඩා—වැඩිම වුණොත් රුපියලකට වඩා —යන්නෙ නැහැ. අවුරුදු දෙකක් බඩු ගෙන යාම සඳහා වැය වන මුදල් යෙදෙව්වොත් මේ මාර්ගය සකස් කර ගන්න පුළුවනි. පරම්පරාගතව ඉදිරියට ගෙනයන මෙවැනි කර්මාන්තයක් සඳහා බඩු ගෙනයාමට එවැනි පහසු වැඩ පිළිවෙළක් සකස්කරන අදහසක්වත් නැහැ. ඒ සම්බන්ධව ගෙන ආ මගේ යෝජනාවක් ඒකච්ඡන්දයෙන් සම්මත වුණා. මේ ගැන ගිය සතියෙ ගරු ඇමතිතුමාට කීවම එතුම කියනව, මට පුළුවන් එකයි මම කරන්නෙ, කියා. වතුර බැස්සීමට ඇළ කැපීමයි, කරන්නෙ. වතුර බස්සන්න කපන ඇළ අනිකුත් දෙපාර්තමේන්තු සමගත් සාකච්ඡා කර බලා අඩි 100ක් විතර පළලට කපන්න ලෑස්ති නැත්තෙ ඇයි? ඉස්සෙල්ලා නිකං ඇළක් කපාවි. අනිකුත් දෙපාර්තමේන්තු සමග කිසි සම්බන්ධයක් ඇතුව මේ වැඩ කෙරෙන්නෙ නැහැ. එසේ වූ විට කෙසේද රටට වැඩක් සිදු වන්නෙ? කෝටි ගණන් මුදල් අපතෙ යනව නේද? ඉඩම් ඇමතිතුමා සුළු ඇළක් කපාවි, වතුර බස්සන්න. ඊට පස්සෙ තවත් මිනින්දෝරුවො ගිහින් ඒ ඇළ පළල් කරන්න ඕනෑ කියාවි. ඒ වැඩේ කරන්න තුන් වතාවක් විතර මහන්සි ගනීවි. ඇමති මණ්ඩලයේ සහ කැබිනට් එකේ අයගෙ සම්බන්ධයක් නැහැ. එක එක්කෙනාගෙ බෙලි කපා ගන්න ලෑස්ති වෙන ආකාරයටයි ක්‍රියා කරන්නෙ. පාරවල් හදන්න කීවත්, ගමනාගමන අංශය දියුණු කරන්න කීවත්, එක එක්කෙනාගෙ බෙලි කැපීමෙ වැඩ පිළිවෙළක් ඔස්සෙ මහජන මුදල් කාබාසීනියා කරන බවයි, පෙනෙන්නෙ. සමහර අය කියනව පාරවල් ඕනෑ කියා. තවත් අය කියනව වහාම කාපට් එක දාගන්න ඕනෑ කියා. පොදු ජනයට ප්‍රයෝජනවත් වන විධියට කිසිවක් කෙරෙන්නෙ නැහැ. මමයි ඇමති; මමයි පාර්ලිමේන්තු ලේකම්; එම නිසා මගේ හරියෙ වැඩයි කරන්න ඕනෑ කියන ප්‍රතිපත්තියයි තියෙන්නෙ. ඔය හැඟීම් ඉවත් වන තුරු රටේ වැඩ කරන්න බැහැ.

බස්නාහිර පළාතේ අක්කර දහස් ගණනක් තියෙනව, ගොවිතැන් ව්‍යාපාර දියුණු කරන්න පුළුවන්. ගරු ඇමතිතුමාට ඒ ප්‍රදේශවල වතුර ටික බස්සා දෙන්න බැහැ· දෙන්නට දෙන්න හැප්පිලයි වැඩ කරන්නෙ. එහෙම නැහැ කියා මෙහිදී නම් කෑගහනව· නමුත් අපට පේනව එක්කෙනෙකුගෙ බෙල්ල කපන්න අනික් එක්කෙනා ලෑස්ති වන නිසා එකම මහජන වැඩක්වත් කෙරෙන්නෙ නැති බව. කැබිනට් මණ්ඩලයේ එකඟත්වයක් නැති වුණොට මහජන මුදල් වියදම් කරන විට නම් ඒ ඒ කටයුතු සඳහා ඒකාබද්ධතාවය තිබිය යුතුයි. ඇමතිවරුන් නම් කලින් කලට මාරු වෙනවා. නමුත් කරන වැඩ හොඳින් කරන්න ඕනෑ.

ඇළවල් අයිනේ, ගංගා අයිනේ, මුහුදු අයිනේ දැන් ඇතැම් කර්මාන්ත ඇතත් ඒවායේ බඩු ප්‍රවාහණය කිරීම සඳහා යොදා ගන්නට සිදු වී තිබෙන්නේ රෝදවල සහ තෙල්වල උපකාරයමයි. පිටරටින් රෝද හා තෙල් ලැබුණු තරමටයි, ඒවායේ බඩු එහා මෙහා ගෙන යන්නට පුළුවන් වන්නේ. නමුත් බඩු එහා මෙහා ගෙන යෑම වඩා පහසුවටත්, ලාභයටත් කිරීම සඳහා වාරිමාර්ගවල උපකාරය ලබා ගත හැකිව තිබිය දීත් ඒවා දියුණු කිරීමට ආණ්ඩුව උනන්දු වන්නේ නැහැ. ඉස්සර නම් පුත්තලමේ සිට කොළඹ ප්‍රදේශයට පාරු ආ නමුත් දැන් ඊට බාධා තිබෙනවා. ගංවතුර නවත්වන්නය කියා එහෙම නැත්නම් වෙන මෝකක් හෝ කියා ඒ ඇළ මාර්ගය හරස් කර තිබෙන හෙයින් දැන් ඒ මගින් බඩු ගේන්නට බැහැ. ඉස්සර එක පාරුවේ ටොන් විස්ස තරම් බර වූ බඩු ප්‍රමාණයක් ගෙන ආ බව මතක් කරන්න ඕනෑ. නොයෙකුත් බැමි බැඳ ගංවතුර වැළැක්වීමට හැදුවත් එයින් වැඩක් වී නැහැ. මුතුරාජවෙල සඳහා රුපියල් කෝටි ගණනක් වියදම් කළා. නමුත් වැඩක් සිදු වෙලා නැහැ. වාරිමාර්ග හරස් වීම නිසා පහසුවෙන් බඩු එහා මෙහා ගෙන යාමට විධියක් නැති වී තිබෙන හෙයින් ඒ ගැන කල්පනා කර බලා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් වෙනත් අවශ්‍ය දෙපාර්තමේන්තුවලත් ඒකාබද්ධතාවය උඩ වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන ලෙස මතක් කරනවා. ඒකාබද්ධතාව නැති නිසා නොයෙක් අලාභ පාඩු සිදු වෙනවා.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අද විශාල ජනගහණයක් සිටිනවා. අප නියෝජනය කරන ප්‍රදේශවල කිසිම ආදායම් නැති ඉඩම් ඇතත් ඒවා ඉඩම් නැති ගොවි ජනයාට ලබා දීමට ආණ්ඩුව ක්‍රියා කරන්නේ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ තිබෙන ඉඩම් කීපයකින් අක්කර 25ක්, 50ක්, නැත්නම් 60ක් ගැනීම සඳහා මා ආණ්ඩුවට කරුණු ඉදිරිපත් කළ නමුත් මෙතෙක් කිසිම ප්‍රතිඵලයක් ලැබී නැහැ. ඒවා ගැන විමසූ විට වරින් වර නොයෙක් දේවල් කියනවා. "ඔන්න ඒජන්ත උන්නැහේට ඉදිරිපත් කර තිබෙනවා, ඔන්න ඉඩම් කොමසාරිස්ට ඉදිරිපත් කර තිබෙනවා, ඔන්න ස්ථිර ලේකම්ට ඉදිරිපත් කර තිබෙනවා, ඔන්න ඇමතිගේ අත්සන සඳහා ඉදිරිපත් කර තිබෙනවා, ඔන්න ඇමතිවරයා අත්සන් කර තිබෙනවා" ආදී වශයෙන් නොයෙකුත් දේවල් වරින් වර අපට කියනවා. අත්සන් කළාය කීවාට හරියන්නේ නැහැ. ගොවීන් ඒ ඉඩම්වල පදිංචි කරවිය යුතුයි. මා නියෝජනය කරන ප්‍රදේශයේ තිබෙන මාලාබේ බම්බුහටන වත්ත, බෝමිරියේ බෘක් වත්ත, නවගමුවේ කුරුඳුවත්ත, කොට්ටාවේ අල්විස් වත්ත යනාදී වශයෙන් වතු කීපයකින්ම ඉඩම් ගැනීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ නමුත් තවම කිසිම ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් නැහැ. "අත්සන් කරල යැව්වා. එවෙලේම ස්ථිර ලේකම්ට භාර දුන්නා" යනුවෙන් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. නමුත් අද වනතුරුවත් කිසිම ප්‍රතිඵලයක් නැහැ. එක්කෝ මිනින්දෝරුවන් අඩුය, එහෙම නැත්නම් වෙන මොකක් හෝ අඩුය කියා අප වරින් වර ප්‍රශ්න කරන විට කියනවා. අප මොකක් හෝ කිව්වොත් නම් නොයෙකුත් බාධාවල් තියෙනවාලු. වැඩ කටයුතු ඉක්මනින් කර ගෙන යෑම සඳහා වුවමනා කරන මිනින්දෝරුවන් නැතිලු. හැබැයි වෙන ප්‍රදේශවල නම් අක්කර සිය ගණින් අරගෙන තිබෙනවා. අපේ ප්‍රදේශවල රජය සතු ඉඩම් නැහැ. කලින් අධිරාජ්‍යවාදීන්ට යට වී තිබුණු එසේ නැත්නම් ප්‍රදේශයෙන් පිට පදිංචි ස්වදේශිකයන්ට දැන් අයිති ඉඩම් හැර ආණ්ඩුවේ ඉඩම් නැහැ. නිකම් අපතේ යන ඒ ඉඩම් වහාම රජයට ගෙන ගොවීන්ට බෙදා දෙන ලෙස මා නැවතත් මතක් කරනවා.

විදුලි බලය සම්බන්ධයෙන්ද මතක් කරන්න කැමතියි. අපේ ගම්බද ප්‍රදේශවලට තවම හරියාකාර විදුලි බලය බෙදා හැර නැහැ. අප නියෝජනය කරන ප්‍රදේශවල ගම්කාර්ය සභාවලට විදුලි බලය දීම සඳහා කොන්ක්‍රීට් කනු වෙනුවට හොර කණු යොදා ගන්නා ලෙස මා ඉල්ලා සිටියා. හොඳින් තෙල් ගසා පිළියෙල කර ගත් හොර කණුවක් අවුරුදු 25 ක්, 30 ක් තරම තබා ගන්නට පුළුවනි. නමුත් හොර කණු ලබා ගැනීම සඳහා ආණ්ඩුව මගින් ස්ථාන කීයක් ඇති කර තිබෙනවද කියා මා ප්‍රශ්න කරන්න කැමතියි. ගිංතොට පමණයි, රජයේ එකක් තියෙන්නෙ. තව පෞද්ගලික තැන් තියෙනව. ඒ නිසා දෙපාර්තමේන්තුවට කනු ටික ගන්න අවුරුදු ගණනක් ගත වෙනව. ගම්වලට විදුලි බලය දෙන්න නම් මේ කනු අවශ්‍යයි. බැමි බැන්දට මදි. ගම්වලට ප්‍රයෝජනය ලබා ගන්න, විදුලි බලය ලබා ගන්න සූදානමින් ඉන්න අයට පහසුවෙන් එය ලබා ගන්න, ගම් කාර්ය සභා මගින් විදුලි බලය සැපයීමට ඉක්මනින් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. එසේම සුළු කර්මාන්තවලට සහයෝගය දීම සඳහාත් ඉක්මනින් ගම් ප්‍රදේශවලට විදුලි බලය ලබා දෙන්න ඕනෑ. බස් ඩිපෝවලට පිටින් එන්ජින් ගෙන්වන පිළිවෙළට වැඩ කරන්න එපා. පිටරටින් එන්ජින් සියල්ලක්ම ගෙන්වන්නෙ. රටේ විදුලි බලය තියෙනව. ඒ ඩිපෝවලට විදුලි බලය සපයා තියෙනව. නමුත් ස්ටෑන්ඩ් බයි තියා ගන්න ඩයිනමෝ එක—මැෂින් එක—පිටරටින් ගෙනෙනව. ඩිපෝ 48 ක්ද කොහෙද ලංකාවෙ තියෙනව. ඒ හැම තැනටම ස්ටෑන්ඩ් බයි තියා ගන්න මැෂින් ගෙන්වනව. ඒ විධියට වැඩ කරල විදුලි බලය සම්බන්ධයෙනුත් රටේ මුදල් පිටරට යවන්න වැඩ කරන්න එපා.

පූ. භා. 11.45

අපේ අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා හැම දාම ඝෝෂා කරනව, අර කොන්ත්‍රාත් එක හරියට කළේ නැත, මේ කොන්ත්‍රාත් එක හරියට කළේ නැත කියා. ඒ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කථා කරන්න නැගිට්ටොත් පැය ගණනක්ම කථා කරල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්නෙ අහවල් රටෙන් ලැබුණු මුදල හරියට පාවිච්චි කළේ නැත කියායි. ඒ මන්ත්‍රීතුමාගේ ඒ කථාවලට අපි ගරු කරනව. නමුත් කොපමණ කීවත් වැඩක් වන්නෙ නැහැ. මහවැලි ගඟ යෝජනා ක්‍රමය ගැන මම 1955 සිට මේ ගරු සභාවෙ කියනව. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලයේ සිටම අවුරුද්දක් පාසා ඒ යෝජනාව ඉදිරිපත් කරනව, මහවැලි ගඟේ වතුර ටික උතුරු ප්‍රදේශයට—යාපනය දක්වා ගෙන යාමට. කලින් ඒ පිළිවෙළට වතුර අරගෙන ගිහින් තියෙනව. නමුත් ඒක කෙරෙන්නෙ නැහැ. "මල්ටි පර්පස්" කියා හැම වැඩක්ම එක වරට කරන්නයි, හදන්නෙ. ඒ සියල්ලක්ම කරන්න ඉන්නෙ නැතිව පුළුවන් තරම් ඉක්මනට ඒ ප්‍රදේශවල වැව් ටික පුරවා ගොවියාට වතුර ටික දෙන්නය කියායි අපි කියන්නෙ. අකුරැස්සෙ මන්ත්‍රීතුමා කියන පිළිවෙළට කරන්න කල් යනව නම් ගොවිතැන් කිරීමට වතුර ටික දෙන්න. ඔක්කොම එක වරට කරන්න බලා පොරොත්තු වන නිසා අද වන තෙක් එකක්වත් කෙරිල නැහැ. ගරු ඇමතිතුමා කියනව, "මල්ටි පර්පස් ස්කීම්" එකක් හැටියට, විදුලි බලය කිලෝවොට්ස් මේ තරම් ගන්නක් ඕනෑය, මේ තරම් අක්කර ගණන් අස්වද්දන්න ඕනෑය ආදි වැඩ රාශියක්. නමුත් මේව ඔක්කොම කරන්න මුදල් නැත්නම් ඒ ප්‍රදේශවල ගොවිතැන් කර ගැනීමට ඒ වැව්වලට වතුර ටික දෙන්න. ඉස්සර මහවැලි ගඟෙන් ඒ ප්‍රදේශවලට වතුර දුන්න නිසයි, මම මේක කියන්නෙ.

ගරු සභාපතිතුමනි, මිණින්දෝරුවන් ගැනත් මේ අවස්ථාවේදී වචනයක් කියන්න ඕනෑ. මේ රටේ මිනිසුන්ගේ ඉඩකඩම් ටික හරියාකාර මැණ දීමට මිණින්දෝරුවන් නැත කියා මේ ආණ්ඩුව හැමදාම කියනව. මිණින්දෝරුවන් නැත්නම් අවුරුද්දකට, දෙකකට මිණින්දෝරුවන් කණ්ඩායමක් පිටරටින් ගෙන්වා හෝ මේ ඉඩම් මැණල හරිගස්සල දෙන්න ඕනෑ. ඒ මිණින්දෝරුවන් ගෙන්වන්නෙ මෙහි පදිංචි කිරීමට නොවෙයි; අපේ වැඩය කර ගැනීමට පමණයි. හැම දාම කියනව, මිණින්දෝරුවන් මදිය කියා. ළමයින් හදල, ලොකු කරල මේ මිණින්දෝරු ප්‍රශ්නය විසඳන්න බැහැ. අවුරුදු 18 ක් තිස්සෙ මම මේ ගරු සභාවෙ මේ කාරණය ගැන කියනව. ඒ හැම වතාවේ දීම කියන්නෙ මිණින්දෝරුවන් නැත කියලයි. නමුත් අපේ රටේ ඉඩම් පළල් වුණේ නැහැ; ලොකු වුණේ නැහැ. ඉස්සර බිම් ප්‍රමාණයමයි, තවමත් තියෙන්නෙ. 17 අවුරුද්දක පටන් කියන නමුත්, ඒ ඉඩම් වුවමනා විධියට බෙදා හදා ගොවියන් පදිංචි කර වීමට ලැහැස්ති නැහැ. හැමදාම මිණින්දෝරුවෝ නැහැ. මේක බොරුවක්. ප්‍රයෝගයක්. වැඩ කරන්න ලැහැස්ති නැති එකයි ඔප්පු වෙන්නෙ. මෙහෙ මිනින්දෝරුවො නැත්නම් යම් කිසි ගිවිසුමක් අනුව සීයක් දෙසීයක් ගෙන්වා ගන්න පුළුවනි. එසේ ගෙන්වාගෙන පළමුවෙන්ම "ඒරියල් සර්වේ" එකක් ගත්තාම මේ වැඩේ කරන්න ඉතාම ලෙහෙසියි. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලනව ඒ විධියෙ වැඩ පිළිවෙළක් යොදන්නය කියා.

දැන් ඔරුවල පිහිටුවා තිබෙන වානෙ සහ යකඩ කම්මල අනාගතයේදී දිගටම පවත්වාගෙන යාමට තිබෙන කර්මාන්තයක්. එතෙන්ට බඩු ගෙන යාම සඳහා රේල් පාරවල් සහ මහා මාර්ග ලොකු කරන්න කලින් මේ වතාවෙවත් මුදල් වෙන්කර අර ඇළ කපන්න කටයුතු සලස්වනවා නම් ලොකු මුදලක් ඉතුරු කර ගන්න පුළුවන් වෙනව. කැළණි ගඟෙන් ඇළ කැපූ විට කර්මාන්ත ශාලාව ළඟටම බඩු ගෙනියන්න පුළුවන් වතුරෙන්. අද දුම්රියෙන් නැත්නම් ලොරි වලින් ටොන් 500 ක් ගෙනියනවා නම් කීයක් වියදම් වෙනවද? ටොන් එකකට රුපියල් 10 බැගින් ගෙවන්ට ඕනෑ. නමුත් වතුරෙන් ගෙන යන විට බඩු ගෙන යාමේ ගාස්තුව විශාල ප්‍රමාණයකින් අඩු වෙනව. දකුණු පළාතේ සිටත් පුත්තලම් පැත්තෙ සිටත් ටොන් ලක්ෂ ගණන් ගේන්න වෙනව. දැන් මීගමුව පැත්තෙ සිට එන මෝඩ ඇළ නොහොත් "ඩච් කැනාල්" එක සුද්ධ කර ගත් විට මේ වැඩේට බොහොම ලේසියෙන් පාවිච්චි කරන්න පුළුවන්. රෝද මගින් තෙල් බලයෙන් ගෙනෙනවාට වඩා වතුර මගින් ගෙන ඒමට වියදම් වන්නෙ ඉතාමත් අඩු වෙනුයි. මේ වැඩේ නොකරනවා නම් යම් කිසි ගුප්ත අදහසක් උඩ ගෙන යන වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

පිළිවෙළක් බවයි කෙලින්ම කියන්න තිබෙන්නෙ. මෙය රටේ දියුණුවටවත් කර්මාන්ත දියුණුවටවත් කටයුතු නොකර තම තමන්ට ලැබෙන කොමිෂන් පිට කරන වැඩක්ය කියා මම බය නැතිව චෝදනා කරනව. මේ රටේ ජනතාවගේ කෝටි ගණන් මුදල් නැති කරන්නෙ නැතිව ඒ මුදල් මහජනයාට වුවමනා විධියට යොදවන්න.

රණාලේ හෝ නවගමුවේ සිට හැතැප්ම තුනහමාරකින් පමණ මේ ඇළ කපන්න පුළුවන්. ඉතාම කෙටි දුරප්‍රමාණයක් තිබෙන්නෙ. දැනට මේ කර්මාන්ත ශාලාවට ටොන් ලක්ෂයකට වඩා ගෙන ගොස් තිබෙනව. ඒ සඳහා රුපියල් දස ලක්ෂයක් පමණ වියදම් වුණා නේද? නමුත් ඇළ කපා තිබුණා නම් දස ලක්ෂයක් වියදම් වන වැඩේ එක ලක්ෂයක වියදමින් බේර ගන්න තිබුණා නේද? නමුත් ඒක කරන්න ලැහැස්ති නැහැ. මේ ඇමති වරුන්ගෙ කන්වල තිබෙන ගෝන ඇට ගැලවිල යන්නයි මම කථා කරන්නෙ. මහජන මුදල් ඒගොල්ලන්ට ඕනෑ විධියට පෙම් කෙළ කෙළ කොම්පැනිවලට දෙනව. අර ඇළ කපනව නම් ඇළ දෙපැත්තෙ සුළු කර්මාන්ත කටයුතුත් දියුණු වෙනව නේද? ඒ වාගේම ගඟේ දැලෙත් කර්මාන්ත දියුණු වෙනව නේද? ඒව වැළැක්වීමටයි කටයුතු කරන්නෙ. අර යු. කේ. එඩ්මන්ඩ්ට අස් වද්දන්න දීපු කෝටි තුනහමාර ඇළ කපන්න යෙදුව නම් මොකද වෙන්නෙ? කෙහෙද, ඒවට ලැහැස්තියක් නැහැ. එම නිසා මේ ඔරුවල කර්මාන්ත ශාලාවට බඩු එහා මෙහා ගෙන යාම සඳහා ඇළ කැපීමට හැකි පමණ ඉක්මනින් මුදල් වෙන් කර ඒ කාර්‍යය ආරම්භ කරන්නය කියා මා අවසාන වශයෙන් ඉල්ලනව.

**යූ. පී. වයි. ජිනදාස මයා.** (කුණ්ඩසාලෙ)
(*திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலெ*)
(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා නියෝජනය කරන කොට්ඨාශයේ, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ සෑහෙන කොටසකට ඉඩම් බෙදා දී තිබෙනව. ඒවායේ පදිංචි උදවියට මූලික පියවරක් වශයෙන් රුපියල් 75 ක ආධාර මුදලක් දුන්න. නමුත් පසුගිය අවුරුදු දෙක තුන ඇතුළත ඒ අය වෙනුවෙන් කිසිවක් කර නැහැ. දොර ජනෙල් දමා ගැනීමට සහ වෙනත් කටයුතු සඳහා මේ මුදල ප්‍රමාණ වත් නොවුණත්, මේ මුදල දීමත් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණයෙන් නවතා දමා තිබෙනව. මේ කාරණය ගැන මම කනගාටු වෙනව. ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ ඉඩම් බෙදා දීමේදී ඉඩම් ලබාගැනීමට ඉදිරිපත් වන අය ඉතාමත් දුප්පත් අහිංසක පිරිසක් නිසා ඒ අය වෙනුවෙන් කරනු ලබන ගෙවීම—රුපියල් 75 ක ගෙවීම—නවත්වා දැමීම ගැන මගේ කනගාටුව ගරු ඇමතිතුමාට ප්‍රකාශ කර සිටිනව. ගරු ඇමතිතුමා යටතේ තිබෙන අමාත්‍යාංශයෙන් පසුගිය කාලය තුළ මේ ගෙවීම කර නැති බව මතක් කර සිටිනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම සුළු මුදලෙන් මේ උදවියට ගෙයක් හදා ගන්න බැහැ. ඉතා දුකසේ ජීවත්වන මේ උදවියට බඩු ඇද ගැනීම සඳහා පමණක් මේ මුදල ගෙවීම කර ගෙන එනු ලැබුව. නමුත් ඒ ගෙවීම නතර කරනු ලැබුවෙ මන්ද කියා දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න කළාම ඒ අය කියනවා, මුදල් නැති කම නිසා එසේ කරන්නට සිදු වී තිබෙනවාය, කියා. මෙය ඉතාමත්ම ලොකු මුදලක් නොවෙයි. පවුල් දහසකට දුන්නත් වැය වෙන්නෙ රුපියල් 75 දහසක පමණ මුදලක්. දස දහකට දුන්නත් වැය වෙන්නෙ රුපියල් 7,50,000 ක්. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අපතේ යන මුදල් ටිකක් ප්‍රවේශම් කළොත් රුපියල් 75 ගණනේ පවුල් දහස් ගණන කට මුදල් ගෙවීම කිසිම අපහසුවක් නැතුව කරන්න පුළුවනි. එම නිසා අඩු ගණනේ රුපියල් 75හේ ගෙවීමවත් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

ඒ වාගේම තමුන්නාන්සෙට මතක් කිරීමට කැමතියි, අපේ ප්‍රදේශයේ ලොකු තදබදයක් තිබෙනව; ජනගහනය වැඩියි. එක ගමක ජනගහනය හාරදහස පන්දහස දක්වා ඉහළ නැග තිබෙනව. එම නිසා ගම් පළල් කිරීම සඳහා වැය කර ඇති මුදල ප්‍රමාණවත් මදි. අපේ ප්‍රදේශයේ ධනවත් ඉඩම් හිමියන්ගේ ඉඩකඩම් තිබෙනව. ඒවායේ නොවැවුණු ඉඩම් කොටස් අප්‍රමාණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනව. පල්ලෙකැලේ අක්කර හාර සියයකට වඩා වගා කර නැහැ. වවන්නත් බැහැ. තේ, රබර්, පොල්, කොකෝවා, ආදිය වගා කර නැහැ. මුඩු ඉඩම් තිබෙන බවත් ඒ ඉඩම් අරගෙන ඉඩම් නැති උදවියට බෙදා දීමට වැඩ කටයුතු යොදන ලෙසත් බොහෝ කාලයක සිට මා ඉල්ලා සිටියා. නමුත් තවමත් ඒ ඉල්ලීම ඉෂ්ට වී නැහැ. තේ අක්කර 20, 30 තිබුණු ඉඩම් දැන් වගා කරන්නෙ නැතුව ගිය නිසා, ඒවායින් ප්‍රයෝජනයක් නොගැනීම නිසා, මුඩුබිම් හැටියට පරිවර්තනය වී තිබෙනව. මෙබඳු ඉඩම් ලබා ගෙන බෙදා දෙන හැටියට ඉල්ලා සිටි නමුත් මේ වන තෙක් එයද ඉටු වී නැහැ. එම නිසා ඒවා ක්‍රියාත්මක කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවෙ ඉල්ලා සිටිනව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප ඉල්ලා සිටින්නෙ නැහැ වැවුණු ඉඩම්, වගා කරන්න පුළුවන් ඉඩම් බෙදා දෙන්නටය කියා. වවන්නෙ නැතුව අත්හැර තිබෙන අක්කර දහයෙ පහළොවේ ඉඩම් තිබෙනව. එවැනි මුඩු ඉඩම් කොටස් තෝරා ගෙන ගම් පළල් කිරීමේ ව්‍යාපාරය යටතේ බෙදා දෙන ලෙස ඉල්ලා සිටිනව. මගේ කොට්ඨාශයේ නොයෙක් ප්‍රදේශවල මේ අන්දමේ මුඩු ඉඩම් රාශියක් තිබෙනව.

As there appears to be no co-ordination either among the Ministries or in the Cabinet, I think, we can go on to discuss these questions. My humble submission is that any villager should be entitled to a permit to purchase a gun if he bears a good character and if he has not been found guilty of a criminal offence in a court of law. I would appeal to the Hon. Minister of Home Affairs or any other Minister concerned to send out directions that these people be given permits more leberally so that they can protect their crops. These poor people do not have guns, that is one of the main reasons why they are unable to protect their crops.

The Government does not give assistance to these people to protect their crops against monkeys. You give attention to the Deduru herd but not so much attention to the Deduru Oya people. You give assistance to drive away the Deduru herd to Wilpattu but you do not pay compensation to these people whose crops are damaged by the Deduru herd. These people have to become destitute to claim compensation.

The problems of the Dry Zone and the Dry Zone peasantry cannot be solved by piecemeal methods. I would appeal to the hon. Parliamentary Secretary to get his Ministry and the Cabinet to appoint a Dry Zone Peasantry Commission on the same lines of the Kandyan Peasantry Commission, because it is only through such a commission and the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

co-ordination of the views of various people that we can solve the needs of the Dry Zone peasantry which is the backbone of our country.

**සුමනපාල දහනායක මයා.** (දෙණියාය)
*(திரு. ஸுமனபால தகனாயக்க—தெனியாய)*
(Mr. Sumanapala Dahanayake—Deniyaya)

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වෙනව. අවුරුදු ගණනාවක් තිස්සේ මේ වැය ශීර්ෂය යටතේ රජය අනුගමනය කරන ඉඩම් ප්‍රතිපත්තිය අපි විවේචනය කර තිබෙනවා. අද රජයේ තිබෙන ඉඩම් බෙදා දීමේ ප්‍රතිපත්තිය වහාම වෙනස් කළ යුතුව තිබෙන බව මා පළමුවෙන්ම කියන්න කැමතියි. අද රජයේ ඉඩම් දීම ක්‍රම කීපයකටම කරනව. විශේෂයෙන්ම අපේ පළාත්වල, ගම් පළල් කිරීම යටතේ ඉඩම් බෙදා දෙනවා, උස් බිම් ජනපද යටතේ ඉඩම් බෙදා දෙනවා, ඒ සමගම සමහර අයට වාසස්ථාන තනා ගැනීමටත් ඉඩම් බෙදා දෙනවා. තවත් සමහර පළාත්වල ආදායම් බදු ගෙවන ලොකු සල්ලිකාරයින්ට මධ්‍යම පංතික ක්‍රමයට ඉඩම් බෙදා දෙනවා. නමුත් මේ ඉඩම් බෙදීමේ ක්‍රමය සුදුසු නැත කියා අපි කියනව. මක්නිසාද කියනවා නම්, සමාජවාදය කරා මේ රට ගෙන යෑමට සූදානම් වන මෙවැනි අවස්ථාවක ඉඩම් බෙදීමේ ක්‍රමයේ පංති ක්‍රමයක් ඇති වීම නුසුදුසු නිසයි.

අ. භා. 2.15

දැන් තිබෙන ඉඩම් ප්‍රතිපත්තිය අනුව පංති ක්‍රමයක් අනුව කටයුතු කෙරෙන නිසා, මේ ඉඩම් බෙදීමේ ප්‍රතිපත්තිය වහාම නවත්වා පංති භේදයක් නැති සමාජවාදී ක්‍රමයකට කාටත් එක හා සමාන ක්‍රමයකට ඉඩම් දීමේ ක්‍රමයක් වහාම ඇති කරන්නට ඕනෑ. අද විශේෂයෙන් අපේ පළාත්වල සමහර අයට ඉඩම් ප්‍රශ්නය උග්‍ර වී තිබෙන්නේ ඇයි කියා අපි දන්නව. සමහර අයට ඉඩම් කච්චේරි තබා ඉඩම් දෙන්නේ වාසස්ථාන සඳහා පමණයි. ඒ සඳහා ඉඩමක් අක්කර ¼ ක් නැත්නම් ½ ක් දුන්නත් අවුරුද්දක් යන්නට පෙර ඒ අය තවත් ඉඩමක් ඉල්ලා සිටිනවා. මක්නිසාද කියනවා නම්, ගෙයක් සාදා ගැනීමට ඉඩමක් දුන්නාට ඔහුට තමන්ගේ ආර්ථික තත්ත්වය හැඩ ගස්වා ගන්න බැහැ. ඒ නිසා මේ ඉඩම් ප්‍රතිපත්තිය වහාම වෙනස් කරන්න ඕනෑ.

ඉතා ඉක්මනින් ඉඩම් ආඥාපනත සංශෝධනය කරන්න කටයුතු කරනවාය, ඒ නීති කෙටුම්පත කැබිනට් මණ්ඩලයෙන් සලකා බලා ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාය, කියා ඉඩම් කොමසාරිස්වරයාගේ පාලන වාර්තාවේ නම් සඳහන් වී තිබෙනවා. ඇමතිතුමා මෙතැන නැති නිසා පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරනවා, පුළුවන් තරම් ඉක්මනින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, මේ පණත නීති ගත කරන්නට කටයුතු කරන්නය කියා.

ඉඩම් කච්චේරි පවත්වා, ඉඩම් බෙදා දීමේ ක්‍රමය යටතේ අද දින සෑහෙන ප්‍රමාදයක් පවතිනවා. සමහර අවස්ථාවල ඉල්ලුම්පත්‍ර කැඳවා මාස හය හත පමා වෙනව. ඉඩම් දෙන්නෙ නැතිව. තවත් සමහර අවස්ථාවලදී ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් බෙදා දීමට සුදුස්සන් වශයෙන් තෝරා ගත් කට්ටිකරුවන්ට ඒ ඉඩම් කෑලි භාර දීමට හත් අට මාසයක් ගත වෙනවා. එවැනි එක කනගාටුදායක අවස්ථාවක් මට මතකයි. දෙනියාය ආසනයේ මොරවක් කෝරළයේ වැලිව ගම්මුලාදැනි කොට්ඨාශයේ ඉඩම් කච්චේරියක් පැවැත්තුව. පදිංචියට නිවාස නැති විශාල ජනකායක් සිටින ඒ ප්‍රදේශයේ අපගේ බලවත් ඉල්ලීම පිට ඉඩම් කච්චේරියක් පැවැත්වූ නමුත් එහි ප්‍රතිඵල තවම ලැබුණේ නැහැ. ඉඩම් කච්චේරිය පවත්වා දැන් අවුරුදු දෙකකටත් වැඩියි. ඒ අනුව කී දෙනකුට ඉඩම් ලැබෙනවාද, ඒ ඉඩම් කච්චේරියට මොකද වුණේ, කියා දැනගන්ට අපට කිසිම විධියක් නැහැ. ඊට හේතුව ඒ ඉඩම් කච්චේරිය පැවැත්වූ නිලධාරියා අම්පාරේ ප්‍රදේශයට මාරු වී ගොස් තිබීමයි. ඔහු මාරු වී යද්දී මේ ඉඩම් කච්චේරිය පිළිබඳ ලියකියවිලි ගෙන ගොස් තිබෙනව. මාතර දිසාපතිතුමාත් මේ සම්බන්ධව ලියුම් රාශියක් ලියා මහන්සි ගත්ත, ලියකියවිලි ගෙන්වාගෙන මේ කටයුත්ත අවසානයක් කරන්න. එහෙත් අද වන තුරු පුළුවන්කමක් ලැබී නැහැ, ඒ ලියකියවිලි ගෙන්වා ගන්න. මේ අන්දමට කටයුතු කරන නිලධාරීන්ට දෙපාර්තමේන්තුව දෙන දඬුවම [illegible]ද? ඉඩම් කොමසාරිස් දෙපාර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

මේන්තුවේ එක තැනක, දෙපොළක පමණක් නොවෙයි මේ විධියේ වැරදි කෙරෙන්නෙ; සැම තැනකම සිදු වෙනව. එහෙත් ඔවුන්ට විරුද්ධ විනයානුකූලව කිසිවක් කරන්නෙ නැහැ. මේ ඉඩම් කච්චේරිය පවත්වා දැන් අවුරුදු දෙකකටත් වැඩියි. මේ පිළිබඳව ඇමතිතුමාටත් දැනුම් දුන්න. එහෙත් මේ ඉඩම් කච්චේරිය නවමත් නීත්‍යනුකූල එකක් හැටියට පිළිගන්නවාද, නැති නම් එය අවලංගු කර වෙනත් ඉඩම් කච්චේරියක් ඒ පළාතට පවත්වනවාද, එසේ නැත්නම් කලින් පැවැත්වූ ඉඩම් කච්චේරියේ ප්‍රතිඵල නිකුත් කරනවාද යන කරුණු අපට කිසිවකුගෙන් දැනගන්ට පුළුවන් කමක් නැහැ. ඉල්ලුම් පත්‍ර කැඳවා කරුණු පරීක්ෂා කර බැලුවාට මදි. අපි ඉල්ලා සිටිනව, ඉඩම් කච්චේරි පවත්වනවාත් සමගම හැකි තරම් ඉක්මනින් සුදුස්සන් හැටියට තේරෙන කට්ටිකරුවන්ට ඉඩම්වල අයිතිය භාර දෙන්න හැකි වන අන්දමේ වැඩ පිළිවෙළක් වහාම සකස් කරන්න කියා.

අනික් කාරණය, මගේ පළාතේ විශාල වශයෙන් උස්බිම් ජනපද ආරම්භ කර තිබෙනව. මා මීට කලිනුත් කියා තිබෙන පරිදි ඉඩම් ඇමතිතුමා ආරම්භ කළ ව්‍යාපාරවලින් ඉතාමත් සාර්ථක වූණු ව්‍යාපාරයක් තමයි, මේ උස්බිම් ජනපද ව්‍යාපාරය. එය ඉදිරියටත් සාර්ථක වන බව අපට පෙනී යන නමුත් ඒ ව්‍යාපාරවල අඩුපාඩු රාශියක් පවතින බව විශේෂයෙන් ඇමතිතුමා මේ ස්ථානයේ සිටින නිසා මතක් කරන්ට ඕනෑ. සභාපතිතුමනි, මෙම ජනපදවල අද පදිංචිව සිටින්නෙ, දෙනියාය ප්‍රදේශයේ නැත්නම් ඒ ජනපද පිහිටි පළාත්වල ජනයා පමණක් නොවෙයි. ඉතා ඈත ප්‍රදේශවලින් තෝරාගත් කට්ටිකරුවන් විශාල පිරිසක් මේ ජනපදවල පදිංචිව සිටිනව. ඔවුන්ගේ ඕනෑ එපාකම් ඉෂ්ට කර ගැනීමට අවශ්‍ය සැප පහසුකම් මේ ජනපදවල නොතිබුණොත් මා හිතන්නෙ නැහැ, ජනපදවල පදිංචි අයට හරියාකාර ඔවුන්ගේ ජීවිකාව කරගෙන යන්ට පුළුවන් වෙයි කියා. සමහර කට්ටිකරුවන් මේ ජනපදවලට ඇවිත් සිටින්නෙ, තම ගම්වල තමන්ට අයිතිව තිබුණු සුළු ඉඩම් කොටස් හා ගෙවල් දොරවල් ආදිය අත්හැර දමා ස්ථිර පදිංචියටයි. එවැනි අවස්ථාවක ඔවුන්ට සාමාන්‍ය පුරවැසියන් හැටියට ඔවුන්ගේ ජීවිකාව ගෙන යන්ට පුළුවන්කමක් නැත්නම්, ජනපද ඇති කිරීමෙන්—ජනපදවලින් කොතරම් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට පුළුවන් වුණත්—මා හිතනව, ආණ්ඩුව ඔවුන්ට කරන්නෙ ආසාධාරණයක්ය කියා.

මේ දැරංගල, කලුබෝවිටියන, ඊදඹුකිත, දංගල ආදී ජනපදවල තවත් වැඩ රාශියක් කරන්ට තිබෙනව. සමහර ජනපදවල නිවාස තැනීමට තවමත් වැඩ ආරම්භ කර නැහැ. මේ කට්ටිකරුවන් පදිංචි වී දැන් අවුරුදු තුන හතරක් වෙනව. ස්ථිර නිවාස සාදා දෙන පොරොන්දුව පිට ආණ්ඩුවෙන් සාදා දුන් තාවකාලික මඩුවලයි මේ කට්ටිකරුවන් පදිංචි වුනේ. නමුත් මේ දක්වා ඒ ජනපදවාසීන්ට ස්ථිර නිවාස සාදා නොදීම නිසා ඒ අයට කරදර මහත් රාශියකට මුහුණපාන්ට සිදු වී තිබෙනව. මක්නිසාද, අපේ ප්‍රදේශය අධික වශයෙන් වර්ෂාපතනය තිබෙන ප්‍රදේශයක්. ඒ නිසා තාවකාලික සෙවිලිවලින් වැඩි කලක් ප්‍රයෝජන ගන්න බැහැ. එබැවින් මා විශේෂයෙන්ම ඇමතිතුමාට මතක් කර සිටින්නෙ හැකි තරම් ඉක්මණින් මේ ජනපදවාසීන්ට ස්ථිර නිවාස ලබා දෙන ලෙසයි. මේ අයට නිවාස සාදා දෙන්න ඉදිරි මුදල් වර්ෂය තුළ මුදල් වෙන් කර නැත කියා මට ආරංචියි. එහෙම නම්, ඉදිරි මුදල් වර්ෂය තුළ මුදල් වෙන් කර නැත්නම්, මේ ජනපදවාසීන් වාසය කරන්නෙ කොයි බද කියා මා ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට සතුටුයි.

එපමණක් නොවෙයි. සාමාන්‍යයෙන් ජනපද පිහිටුවීමේදී සෞඛ්‍ය පහසුකම් ඇති කර දෙනව. මේ උස්බිම් ජනපදවලටත් ආරෝග්‍යශාලාවක් ලබා දෙන්නය කියා මා නොයෙක් විට ඉල්ලා සිටියා. ඇමතිතුමා ආරම්භ කළ අනික් ජනපදවල නම් ආරෝග්‍යශාලා පහසුකම් තිබෙනව. නමුත් මේ උස්බිම් ජනපදවලට ආරෝග්‍යශාලා පහසුකම් නැහැ. 1962 වර්ෂයේදීත් මේ ජනපදවලට ආරෝග්‍යශාලාවක් ලබාදෙන්නය කියා මා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් ඉල්ලා සිටියා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් අවසර දෙනවා නම්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනවා නම්, ආරෝග්‍යශාලාවක් පිහිටුවීමට සූදානම්ය කියා එදා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව කියා සිටියා. සෞඛ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙපාර්තමේන්තුවේ අවසරය ගන්න මාස 10 ක් 12 ක් පමණ ගත වුණා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් හෝ ආරෝග්‍යශාලාවක් ඇති කර නවා නම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එය නඩත්තු කරන්න සූදානම්ය කියා දැන් දන්වා තිබෙනවා. නමුත් දැන් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව කියනවා මුදල් නැති නිසා ආරෝග්‍යශාලාවක් සාදා දෙන්න බැරිය කියා. ඒ නිසා ගරු ඇමති තුමා පිළිතුරු දෙන අවස්ථාවේදී මේ සම් බන්ධයෙන් ස්ථිර ප්‍රකාශයක් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනව. මේ ජනපදවල සුදුසු මධ්‍යස්ථානයක ආරෝග්‍ය ශාලාවක් පිහිටුවනවාද, එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා ගන්න අද හස් කරන්නෙ කුමන පියවරක්ද කියා මා දැනගන්නට සතුටුයි.

ඒ සමගම මේ ජනපද නිලධාරීන් ගැනත් කියන්නට ඕනෑ. මා මීට පෙරත් කීප අවස්ථාවකදීම මේ ගැන කරුණු පෙන් වා දී තිබෙනව. විශේෂයෙන්ම ගරු ඇමති තුමටත් කරුණු පෙන්වා දී තිබෙනව. අද මේ ජනපද ඉතාම සාර්ථක අන්දමින් ගෙන යන්නට පුළුවන් කම තිබෙනව. නමුත් මේ නිලධාරීන්ගෙන් විශාල කරදර ඇති වෙනව. මේ උස්බිම්වල වගා කර තිබෙන්නෙ තේ සි. දැන් ඒ ඉඩම්වලින් පලදාව ලැබෙනව. ඒ නිසා තවදුරටත් මේ ජනපද නිලධාරීන් ඒ වාගේ තබාගත යුතුය කියා මා කිසිසේත් සිතන්නෙ නැහැ. අද ඒ ජනපදවල වැරදි වැඩ වෙනවා නම්, දූෂන වැඩ වෙනවා නම්, ඒ සියල්ලම වන්නේ මේ නිලධාරීන් නිසා බව මා කියන්ට ඕනෑ. ඒ වාගේම මේ නිල ධාරීන් සඳහා දෙපාර්තමේන්තුවත් සෑහෙන මුදලක් වියදම් කරනව. ඉඩම් වැවීම ආරම්භ කරන අවස්ථාවේදී මේ නිලධාරීන්ට කරන්ට සෑහෙන වැඩ කොට සක් තිබුණා. නමුත් දැන් මේ ඉඩම්වලින් පලදාව ලැබෙනව. ඒ වාගේම මේ ඉඩම් සම්පූර්ණයෙන්ම මාතර දිසාපති කාර්යාලය මඟින් බලා ගන්නව. ඒ නිසා දැන් මේ ජනපද නිලධාරීන්ට කිසිම වැඩක් නැහැ. දැන් කිසිම වැඩක් නැතිවයි ඔවුන්ට පඩි ගෙවන්නෙ. ඒ නිසා මේ ජන පද තවත් සාර්ථක කර ගැනීමට, මාතර දිසාපති තුමා සමග එකඟත්වයකට පැමිණ පුළුවන් තරම් ඉක්මනින් මේ ජනපද නිල ධාරීන් ඒ වායින් ඉවත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා. දැන් දැරංගල වැනි ජන පදවලින් සම්පූර්ණයෙන්ම ආදායම ලැබෙනව. ඒ වායේ නිලධාරීන්ට කරන්න තවත් අලුත් වැඩ නැහැ. ඒ වැඩ කරන්න ජනපදවල සිටින ඕවර්සියර්වරුන්ට පුළු වනි. ජනපදවාසීන්ට කරදර සිදු වන්නෙ ජනපද නිලධාරීන් නිසා බව නැවතත් මතක් කරන්න ඕනෑ. අද ජනපදවාසීන් සමහර දෙනාගෙ ඉඩම් අවලංගු කිරීම වැනි වැඩ කෙරෙන්නෙත් එම නිලධාරීන්ට අවශ්‍ය විධියට ඒ අයගෙ ඕනෑ එපාකම්වල හැටියට ජනපදවාසීන් කටයුතු නොකරන විටයි. එසේ සිදු වූ අවස්ථා කීපයක් ගැන මා දන්නව. ජනපද නිලධාරීන් සහ ජන පදවාසීන් අතර ඇති අමනාපකම් නිසා ජනපදවාසීන් කීප දෙනෙකුගෙ ඉඩම් කැන්සල් වී ගියා. මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඇති වැඩ පිළිවෙළක් ගරු ඇමතිතුමා ඉක්මනින් ක්‍රියාවෙ යොදවනු ඇති කියා මා විශ්වාස කරනව.

ගරු ඇමතිතුමා පිළිගන්නව ඇති, උස් බිම් ජනපද සඳහා රජයෙන් යම්කිසි මුදලක් වැය කළොත් අවුරුදු කීපයක් තුළදී ඒ මුල් මුදලම රජයට ලැබෙන බව. අද "ඩේලි නිව්ස්" පත්‍රයේ ඉඩම් කොම සාරිස්ගේ ප්‍රකාශයක් පළවී තිබෙනවා. එහි සඳහන් වෙනම එක කට්ටිකරුවකු ගෙන් අවුරුද්දකට රුපියල් 700 ක ආදායමක් ලැබෙන බව. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතෙ අක්කරය දෙක ඉඩම් ලබා ගත් අය විශාල සංඛ්‍යාවක් සිටිනව. නමුත් එම ඉඩම් බොහොමයක් නිසරු වී තිබෙන බව පේනව. ඒවායේ ස්ථිර වැවිලි ඇත්තෙ නැහැ. ජනපදවලට දෙන අන්දමට නොව සුළු වශයෙන් හෝ එවැනි ඉඩම් වගාවට ආධාර දුන්නොත් ඒවායින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් වේවි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ගම් පළල් කිරීම යටතෙ ලැබුණු ඉඩම්ද?

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)
ඔව්, මීට අවුරුදු දෙක තුනකට පෙර අක් කරයෙ කොටස්වලට ආධාර දීමට කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

කළා. පසුගිය අවුරුදු දෙක තුළ සල්ලි නැති කම නිසා ඒ සම්බන්ධව සෑහෙන යමක් කෙරී නැහැ. ජනපදවලට දෙන ආධාර පිළිවෙළටම ආධාර නුදුන්නත් ඊට අඩු තරමින් වුණත් සුදුසු පරිදි මේවට ආධාර දෙන්න පුළුවනි. තේ පැළ දෙන්න පුළුවනි; පොහොර සපයන්න පුළුවනි; පස ආරක්ෂා කිරීමට ආධාර දෙන්න පුළුවනි.

අ. භා. 2.30

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙ වැඩ පොළවල් කීපයක් ඒ පළාතෙ තියෙනව මා දැනගන්න කැමතියි, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙ කම්කරුවන් සම්බන්ධව රජය ගන්න ප්‍රතිපත්තිය, ක්‍රියා මාර්ගය, කුමක්ද කියා. අද විශෙෂයෙන්ම දැරංගල, ඊදඹුකිත, කළුබෝවිටියන යනාදි තැන්වල වැඩ කරන ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කම්කරුවන් රාශියක් අනියම් සේවකයන් හැටියට වැඩ කරනව. ගරු ඇමතිතුමාටත්, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමාටත් දන්වා යවා තිබෙනව, හය මසකට වඩා කල් සේවය කර ඇති එවැනි අනියම් සේවකයින් ස්ථිර තත්ත්වයකට පමුණුවා දෙන්නය කියා. නමුත් ඒ සම්බන්ධයෙන් තවම කිසි දෙයක් දැනගන්න නැහැ. අවුරුදු දෙක, තුන අනියම් අය හැටියට වැඩ කර ඇති කම්රුවන් සිටිනව. හය මසකට වැඩි කලක් අනියම් ලෙස සේවය කළ අය ස්ථිර තත්ත්වයට පත් විය යුතුය කියා භාණ්ඩාගාර චක්‍ර ලේඛනයකින් කියවෙනවා. මේ තැන්වල හය මාසය නොවෙයි, අවුරුදු දෙක තුන වැඩ කළ අය සිටින නිසා ඔවුන් ස්ථිර තත්ත්වයට පත්කර දෙන හැටියට මා ඉල්ලනව.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා ව්‍යාපාරය යටතේ කෙරෙන දේ ගැන ගරු ඇමතිතුමා පරීක්ෂාකාරීව සිටිනවා නම් හොඳයි. ජාතික සේවා අංශයෙන් නෙලුවේ ආරම්භ කළ වැඩ පිළිවෙළක් ගැන මා දන්නව. නෙලුවෙ පැල වත්තේ සිට මොරවක දක්වා කැපීමට පටන් ගත් පාරේ වැඩ කටයුතු දැන් අඩ පණ වෙලා තියෙනව, හුඟක් දුරට, ඒ නිසා ජාතික සේවා අංශය ගැන මීට වඩා සැලකිලිමත් විය යුතුය කියා මා කල්පනා කරනව. මාලත් අත්දැකීම් වලින් මට බොහෝ දේවල් කියන්න පුළුවනි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ නෙලුව කඳවුරේ කෙරුණු සමහර වැඩ කොටස් සඳහා දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කළ මුදලට වඩා විශාල මුදලක් වැය කර තිබෙනව. ශ්‍රමදාන ක්‍රමයටත් වැඩ කළාට පස්සෙ ආණ්ඩුවෙන් වැය විය යුතුව තිබුණෙ ඇස්තමේන්තු කළාට වඩා අඩු මුදලක් විය යුතුයි. එහෙත් වැඩි මුදලක් වැය කර තිබෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අපි ගෙව්වෙ නැත්නම් හරි නොවැ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

මා කී දේ ගරු ඇමතිතුමාට තේරුණේ නැහැ වෙන්න ඕනැ.

**ටී. බී. තෙන්නකෝන් මයා. අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ரீ. பி. தென்னகோன்—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Internal and External Trade and Supply)

ඒ නිසා කරුණා කරල තේරෙන විධියට කියන්න.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

පාර කැපීම සඳහා ඇස්තමේන්තු කළ මුදලට වඩා ලොකු මුදලක් වියදම් වුණා, ශ්‍රමදානයෙන් වැඩ කළාට පස්සෙ. විශාල මුදලක් වැය කොට කරවා ගත යුතුව තිබුණු වැඩ ප්‍රමාණයක් ශ්‍රමදාන ව්‍යාපාරය යටතේ නොමිලයේ කරවා ගන්න පුළුවන් වුණා. එහෙම තියෙද්දීත් ඇස්තමේන්තු කළාට වඩා විශාල මුදලක් මේ කැපීම සඳහා වියදම් වුණා. ඒ නිසා මේ සම්බන්ධයෙන් මා පාර්ලිමේන්තුවේදීම ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්නයට නිසි පිළිතුරක් ලැබුණෙ නැහැ. සත්‍ය කරුණු යටපත් කළා වගෙයි මට දැනෙන්නෙ. මේ තරම් විශාල මුදලක් වැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න සිද්ධ වුණා නම් සිද්ධ වුණේ සංවර්ධන දෙපාර්තමේන්තුව අනුගමනය කළ වැඩ පිළිවෙළ වැරදි නිසයි.

ජාතික සේවා අංශය පාලනය කරන ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැරදි වැඩ පිළිවෙළවල් නිසා වියදම් පක්ෂය වැඩි වුණා. එසේ සිදු වූ අවසථා කීපයක් පෙන්වන්න පුළුවනි. කලුබෝවිටියන කඳවුරේ කෑම උයන්න ගන්න දර ටික ඒ අව ටින් ලබා ගන්න පුළුවනි. එහෙත් එතන රාජකාරියට එවනු ලැබ සිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියා දර හොයා ගෙන එන්නෙඕ කියල ලොරියක් පිටත් කර යැව්වෙ පැලවත්තෙ ඉඳල හැතැප්ම සිය ගණනක් ඈතටයි. ලිපේ දාන්න ගන්න දර ටික හොයා ගන්නෙ හැතැප්ම සිය ගණන් ඈත ගිහිල්ල නම් නිසියාකාර වැඩ පිළිවෙළක් නොතිබුණු බවයි පෙනෙන්නෙ. ජාතික සේවා කඳවුර භාරව හිටපු ඒ නිලධාරියාට ලැබුණු පඩියට අමතරව ඔහුට ජීප් රථයකින් යන්න එන්නත් දී තිබුණා. ඒ හැම දෙයක්ම නිසා වෙන්න පුළුවනි විශාල මුදලක් වැය කරන්න සිදු වුණෙ. ඒ කිසිම දෙයකින් කඳවුරේ වැඩට සේවයක් වුණේ නැහැ. ඔය කඳවුරේ වැඩට සහභාගි වූ අය අතර කිච්චුව පහත ප්‍රදේශ වලින් පැමිණි අයත් සිටියා. කිච්චුව තිබෙන ගම්වල වැසියෝ මේ වැඩවලට සහභාගි වුණා. ඒ අයගෙ සේවය ලබා ගැනීමට විශේෂයෙන් කටයුතු කළේ පළාතේ දිසාපතිතුමා සහ ග්‍රාම සංවර්ධන නිලධාරියා ඇතුළු පිරිසයි. එහෙත් ඔය තරම් විශාල මුදලක් වැය වුණේ අර කොළඹින් පිටත් කළ නිලධාරියාගේ වැරදි වැඩ නිසයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඇත් පළාතෙ දිසාපතිතුමාට භාර දීල තියෙනව, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට නොවෙයි.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

මුලදී බලාපොරොත්තු වුණු ප්‍රමාණයට වඩා වැඩියෙන් වියදම් වෙන්න හේතු වූ කාරණා ගැනයි මා කියා සිටියෙ. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නෙ ජාතික සේවා අංශය ගැන දැනට වඩා පරීක්ෂාකාරී වන ලෙසයි. එහෙම නොකළොත් අප වියදම් කරන්න බලාපොරොත්තු වන මුදලට වඩා වියදමක් දරන්න සිද්ධ වේවි.

ඊළඟට ගරු ඇමතිතුමා යටතේ තිබෙන වැවිලි මණ්ඩලය ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා විසින් ආරම්භ කරන ලද දිස්ත්‍රික් ජනපද ව්‍යාපාරයෙන් සැහෙන ප්‍රතිඵල ලැබී තිබෙන නමුත් මහජනයාට ඒ ප්‍රතිඵල නිසි පරිදි ලබා ගන්නට බැරි වී තිබෙන්නේ වැවිලි මණ්ඩලයෙන් පාලනය වන දැරංගල කර්මාන්ත ශාලාව නිසයි. දැරංගල තේ කර්මාන්ත ශාලාව සම්බන්ධයෙනුත්, වැවිලි මණ්ඩලයෙන් එහි ඇති වී තිබෙන පාලනය සම්බන්ධයෙනුත් අවස්ථා කීපයකදීම මා මේ ගරු සභාවේදී සඳහන් කළ බව තමුන්නාන්සේට මතක ඇති. මේ වැවිලි මණ්ඩලයට කොතරම් කරුණු ඉදිරිපත් කළත් ඔවුන්ගේ හිතුවක්කාරකම් නිසා පිළිතුරු ලබා ගැනීමට බැහැ. ගරු ඇමතිතුමා යටතේ ඇති වැවිලි මණ්ඩලයෙන් පාලනය වන දැරංගල තේ කර්මාන්ත ශාලාව භාර දී තිබෙන්නේ වීරසිංහ නමැති පුද්ගලයකුටයි. වීරසිංහ කියන මේ පුද්ගලයා දැරංගල තේ කර්මාන්ත ශාලාවේ සුපිරින්ටෙන්ඩන්ඩ් වශයෙන් පත් කරනු ලැබ තිබෙන්නේ පස්සා දොරින් බව කිව යුතුයි. ඔහු මේ තනතුර සඳහා සුදුසුකමක් ඇති පුද්ගලයෙක් නොවෙයි. මේ කර්මාන්ත ශාලාව දන් තිබෙන තත්ත්වයට ඇද වැටී තිබෙන්නේ මේ හේතුව නිසයි. වීරසිංහ නමැති මේ පුද්ගලයාගේ මේ පත්වීම් සම්බන්ධයෙනුත්, මීට කලින් ඔහු ලබා සිටි පත්වීම සම්බන්ධයෙනුත් පරීක්ෂණයක් පැවැත්වුවහොත් ඇත්ත වශයෙන්ම එම තනතුර දැරීමට ඔහු සුදුසු නැති බව ගරු ඇමතිතුමාට පෙනී යනවා ඇති.

මේ පුද්ගලයා මේ අමාත්‍යාංශය යටතේ විශාල වාසනාවක් උදා කර ගත් තැනැත්තෙක්. දැනට අවුරුදු හතරකට, පහකට පමණ පෙර ඔහු මොරවක් කෝරළේට අවේ තේ පරීක්ෂකවරයකු හැටියටයි. ඊළඟට ජනපද ඉඩම් කච්චි භාර නිලධාරී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

යකු වශයෙන් රජයේ සේවයට බැඳී විශාල වැටුපක් ලබා ගැනීමට ඔහුට වාසනාවක් ලැබුණා. තේ පරීක්ෂකවරයකු වශයෙන් ඔහු එදා පැමිණියත් තේ කර්මාන්ත ශාලා වල වැඩ කිරීමට ඔහුට පුහුණුවක් තිබුණේ නැහැ. නමුත් දැරංගල තේ කර්මාන්ත ශාලාවේ වැඩ කෙරී ගෙන යද්දී මේ වීරසිංහ මහතාට දෙනියාය වත්තේ පෞද්ගලික තේ කර්මාන්ත ශාලාවක පුහුණුවක් ලබා දෙන බව අපට ආරංචි වුණා. එක පැත්තකින් ආණ්ඩුවේ කර්මාන්ත ශාලාවක් සාදාගෙන යන අතර අනික් පැත්තෙන් ජනපද ඉඩම් කට්ටි භාර නිලධාරියා තේ කර්මාන්ත ශාලාවක පුහුණුවට ගියා. අපේ සැකය අන්න ඒකයි. අන්තිමේදී කර්මාන්ත ශාලාව සාදා නිම වන විට එහි පාලනය පැවරුණේ වීරසිංහ මහතාටයි. මේ කර්මාන්ත ශාලාව ආරම්භ කරන ලද්දේ ඉතා උසස් පරමාර්ථ ඇතිවයි. මෙය විවෘත කිරීම සඳහා ගරු ඇමතිතුමා පැමිණි දිනයේ ඒ ප්‍රදේශයේ ජනයා එතුමා පිළිගත්තේ දෙවියකු හැටියටයි. තේ කර්මාන්ත ශාලාවක් නැතිවීම නිසා උස් බිම් ජනපදවල වවා තිබෙන තේ සඳහා නියම මිළක් ලබා ගන්නට නුපුළුවන් වූ හෙයින් ඒ ප්‍රදේශයේ මිනිසුන් හිටියේ ඉතාමත්ම අනාථ තත්ත්වයකයි. නමුත් මේ කර්මාන්ත ශාලාව නිසා ඔවුන්ගේ තේ සඳහා නියම මිළක් ලැබෙතැයි ඔවුන් බලාපොරොත්තු වුණා. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? මොරවක් කෝරළේ තිබෙන අනික් සෑම තේ කර්මාන්ත ශාලාවකටම වඩා අඩු මිළකටයි, මේ කර්මාන්ත ශාලාව තේ මිළයට ගන්නේ. මේ තේ කර්මාන්ත ශාලාවේ පාලනයේ ඇති වරද නිසා මිස වෙන කිසිම හේතුවක් නිසා කොයිම අවස්ථාවකවත් තේ මිළ පහත බැස්සෙ නැති බව කියන්න කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඊළඟදී දැරංගල ෆැක්ටරිය ගැන මාතර කච්චේරියේදී පරීක්ෂණයක් පැවැත් වුණා. මන්ත්‍රීතුමා ඒකට ගියාද?

**සුමනපාල දහනායක මයා.**
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)

නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

තේ දළු ගණන් ගැන මට වාර්තාවක් ලැබී තිබෙනවා. 1963 ඔක්තෝබර් සිට මේ අවුරුද්දෙ ජූලි වන තෙක් මිළ ගණන් තියෙනවා.

| | |
|---|---|
| Derangala | 20.5 cents (average) |
| Kotagala | 20.5 cents (average) |
| Deniyaya | 20.3 cents (average) |

වුවමනා නම් මේ ගණන් විස්තර පසුව මන්ත්‍රීතුමාට දෙන්න පුළුවන්.

**සුමනපාල දහනායක මයා.**
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)

සති කීපයකට පෙර ඉරාක ප්‍රශ්නය උඩ තේ මිළ පහළ බැස්සා. ඒ අවස්ථාව ගැනයි, ඔය කියන්නෙ. ඒ තාවකාලිකව වූ දෙයක්. මේ තේ කර්මාන්ත ශාලාව කරන චෝදනාව නම් මෝරපු තේ දළු යවනවාය කීමයි.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

පැහිච්ච කොළ දෙනවලු.

**සුමනපාල දහනායක මයා.**
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)

පැහිච්ච කොළ දෙන්නෙ නැති බව ඔප්පු කරන්න පුළුවන්. ඒ ගැන පරීක්ෂණයක් පවත්වා බලන්න. දවසක් අපි උප දේශක කමිටුවට ගිය විටත් පෙන්නුව පැහිච්චි කොළ තියෙන බව. පැහිච්චි කොළ ආවෙ කොහෙන්ද කියා පරීක්ෂා කරන විට පෙනී ගියා, වීරසිංහ විසින් වත්තෙ වැඩ කරන කම්කරුවන් දෙදෙනකු ලවා පැහිච්චි කොළ කඩවා ගෙනැවිත් තිබුණ බව, දළුත් සමග කලවම් කර අපට පෙන්වීමට. ගරු ඇමතිතුමනි, මාතර හිටපු දිසාපතිතුමන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිගත්ත, සමුපකාර සමිතිවලින් එකතු කරන දළු බව. මෙතන ඇමතිතුමාට නොතේරෙන ප්‍රශ්නයක් තියෙනව. සමුපකාර සමිති දළු එකතු කරනවට තේ කම්මාන්ත ශාලාවෙ පාලක පක්ෂය කැමති නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
යහළුවන්ට තේ බණින්නෙ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமணபால தகனாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
යහළුවන්ගෙ වැරදි හරිගස්ස ගන්න වුවමනා නිසයි, කියන්නෙ. සමුපකාර සමිති තේ කර්මාන්ත ශාලාවට දළු සපයනව. නමුත් ජනපද නිලධාරින් දළු එකතු කරනවටයි, තේ කම්මාන්ත ශාලාවෙ පාලක පක්ෂය කැමති. මේ ජනපද නිලධාරින්ට දළු එකතු කරන්න යුතුත්කමක් නැත, ඔවුන්ට ඒ සඳහා ඉඩ දෙන්නත් එපාය කියා අපි මීට කලින් කීප වතාවක්ම කියා තිබෙනව. ඒ ජනපද නිලධාරින්ට තේ දළු රාත්තලකින් ශත කාලක් කොමිස් ලැබෙනව. ඒ ජනපද නිලධාරින්ටවත්, ඕවර්සියර්වරුන්ටත් දළු එකතු කිරීමෙදි කොමිස් මුදලක් දීමට කිසිම යුතුකමක් නැහැ. ජනපද නිලධාරිනුත්, තේ කම්මාන්ත ශාලාවේ පාලක පක්ෂයත්, සමුපකාර සමිති නැති කිරීමට විශාල කඩාකප්පල්කාරී ව්‍යාපාරයක් ගෙන යනව. සමුපකාර සමිති මගින් දළු එකතු කිරීමෙන්, ජනපද නිලධාරින්ට වත්, ඕවර්සියර්වරුන්ටවත් ලැබුණු කොමිස් මුදල ලැබෙන්නෙ නැහැ. ලක්ෂ 14ක් වියදම් කර සෑදූ මේ තේ කම්මාන්ත ශාලාවෙන් නියම ප්‍රයෝජන නොලැබෙනව නම් තමුන්නාන්සෙට ඒ පළාතේ තියෙන හොඳ නමත් නැති වී යන බව මම කියන්න කැමතියි.

අ. භා. 2.45

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණාකර නිශ්ශබ්ද වන්න. දැන් සර් ඇල්බට් එෆ්. පීරිස් මන්ත්‍රීතුමා මූලාසනය ගන්නවා ඇති.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ශ්‍රීමත් ඇල්බට් ඇෆ්. පීරිස් මූලාසනාරූඪ විය.**

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமணபால தகனாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ තේ කම්මාන්ත ශාලාවේ අයිතිය වැවිලි මණ්ඩලයෙන් පිටතට ගෙන සමුපකාර සමිතිවලට භාර දෙන්නය කියා සමුපකාර සමිතිත්, අපිත් ගරු ඇමති තුමාගෙන් මීට කලිනුත් ඉල්ලා සිටිය. අඩු ගණනේ හය මාසයක් වත් සමුපකාර සමිතිවලට මේ තේ කම්මාන්ත ශාලාව පාලනය කිරීමට ඉඩ දුන් නොත් මීට වඩා බොහොම හොඳින් මෙය ගෙන යන්නට පුළුවන්යයි ඔප්පු කරන් නට පුළුවන් බව මට හොඳටම විශ්වාසයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම ඒක පරීක්ෂා කරන්න හොඳටම කැමතියි.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமணபால தகனாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
වැඩියේ එපා, අත්හදා බැලීමක් වශයෙන් හය මාසයක් කල් දීල බලන්න. ඒ ඉල්ලීමට ගරු ඇමතිතුමා කැමති වීම ගැන මම බොහෝම සන්තෝෂයි. අද වැඩ කරගෙන යන පිළිවෙළට තේ කම්මාන්ත ශාලාව සම්පූර්ණයෙන් වැහෙන්න ඉඩ තියෙනව. දැනටම කළුබෝවිටියන සමුපකාර සමිතිය අවසරය ලබාගෙන පිට පැක්ටරියකටයි, දළු දෙන්නෙ. පිට පැක්ටරියකට දළු දීලා රාත් තලකට ශත 2ක්, 3ක් වැඩිපුර ලබා ගන්න ජනපද වාසින්ට පුළුවන්කම තියෙනව. ලබන මාසයේ සිට දැරංගල කම්මාන්ත ශාලාවට දළු නොදී පිට කම්මාන්ත ශාලාවලට දළු දීමේ අයිතිය අනිකුත් සමිතිත් දිසාපතිතුමා මාර්ගයෙන් ඉල්ලා තිබෙනව. ඒකට ඉඩ ලැබුණොත් කම්මාන්ත ශාලාවෙ වැඩ කිරීමට බැරි වෙනව. මම හිතන්නෙ නැහැ, මොරවක් කෝරළේ සුළු තේ වතු හිමියන්ගේ හෝ වෙනත් කාගෙන් හෝ තේ දළු ගන්න පුළුවන් වේවිය කියා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

කර්මාන්ත ශාලාව ආරම්භ කර දැන් අවුරුදු දෙකක් පමණ වෙනව. නමුත් මේ අවුරුදු දෙක ඇතුළත මෙම කර්මාන්තශාලාව මොරවක් කෝරළේ අනික් කර්මාන්ත ශාලා ගෙවූ මුදලට වඩා මුදලක් ගෙව්ව මිසක් වැඩියෙන් ගෙව්වෙ නැහැ. මේ කර්මාන්ත ශාලාව ආරම්භ කළාට පසුව එයින් ලාභයක් තිබෙනවද, එසේ නැත් නම් අලාභයක් තිබෙනවද කියා අපට දැන ගන්න පුළුවන්කමක් ලැබී නැහැ. ඇමතිතුමාගෙ පිළිතුරු කථාවෙදී දැරන්ගල වත්තෙ තත්ත්වය කුමක්ද කියා පැහැදිලි කර දෙනවා ඇති කියා මම බලාපොරොත්තු වෙනව.

වැවිලි මණ්ඩලයේ පාලන වාර්තාවෙ තිබෙනව හදාපු දළු රාත්තලකට අය කරන ගාස්තුව ශත 45ය කියා. මම ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි ඒක ඇත්තද කියා. පසු ගිය අවස්ථාවකදී ඇති වූ වැඩ වර්ජනයකදී වර්ජන ඉල්ලීමක් වශයෙනුත් ඉදිරිපත් කළ කරුණක් තමයි ශත 45 ට වැඩියෙන් අය කරන්න එපාය යන ඉල්ලීම. වර්ජනයෙන් පස්සෙ ස්ථිර ලේකම්තුමා සමග සාකච්ඡා කළ අවස්ථාවේදී එතුමා පොරොන්දු වුණා. ඊට වඩා වැඩි කරන්නෙ නැත කියා. නමුත් ශත 45ට වඩා වැඩියෙන් අය කළ අවස්ථා කීපයක්ම පෙන්වන්න පුළුවනි.

එපමණක් නොවෙයි, මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ඒ කර්මාන්ත ශාලාවෙ කෙරෙන තවත් අපරාධයක් නම් ජනපද වාසීන් විසින් සපයනු ලබන තේ දළුවලට එක වර මුදල් නොගෙවීමයි. පසු ගිය මාසයේ සැපයූ තේ සඳහා මේ මස 10 වෙනිද වන විට යම් මුදල් ප්‍රමාණයක් දී ඉතිරි මුදල මාස තුනකින් ගෙවනවාය කියා දන්වා ඇති නමුත්, මාස 6ක් පමණ එසේ කරගෙන විත් දැන් පසු වුණ ඒවාට වැඩි පුර මුදලක් දෙන්න බැරිය කියා තිබෙනව.

බාල තේ කොළ විකිණීමෙන් වැවිලි මණ්ඩලයට විශාල මුදලක් ලාභ වශයෙන් ලැබී තිබෙන බව අපි දන්නව. ඒ ලාභ මුදල ජනපදවාසීන්ට ලබා දෙන්නය කියා අපි නොයෙක් විධියෙන් ඉල්ලුව. කොතරම් ලාභ තිබුණත් අපට කමක් නැහැ, තේ දළු සපයා ඇති පිළිවෙළ අනුව ජනපදවාසීන්ට ඒ ලාබ මුදල බෙදා දෙන ක්‍රමයක් තිබෙනවා නම්. නමුත් එහෙම ක්‍රමයක් නැහැ. මම හිතනවා, 1961-62 මුදල් වර්ෂය ඇතුළත රු. 1,45,000ක ලාභයක් තිබෙනවාය කියා. අපි ඇමතිතුමාගෙන් ඉල්ලනව ඒ ලාභ මුදල ජනපදවාසීන්ට ලබා දෙන්නය කියා. අසරණ ජනපද වාසීන්ගේ දළුවලින් ගන්නා ඒ ලාභ මුදල නොයෙක් විධියෙන් අලාභ වන වතුවලට යෙදවීම ගැන අපි විරුද්ධ බව මේ අවස්ථාවෙදී ප්‍රකාශ කරන්න කැමතියි. එම නිසා මම නැවතත් ඇමතිතුමාගෙන් ඉල්ලනව, පසු ගිය අවුරුදු දෙක ඇතුළත වැවිලි මණ්ඩලය ලබා ඇති ලාභ මුදල ඒ ජනපද වාසීන් අතර බෙදා දෙන්නය කියා.

දැනට සති දෙකකට උඩදී ගරු ඇමතිතුමා පොරොන්දු වුණා, එතැන පාලක තැන වන වීරසිංහ මහතා මාරු කරනවාය කියා මා හිතන්නෙ නැහැ. ඇමතිතුමා ඒ පොරොන්දුව වෙනස් කරයි කියා. ඒ පාලක තැනට තේ සෑදීම ගැන දැනීමක් නැතිවා පමණක් නොව, එතැන වැඩ කරන කම්කරුවන්ට ඔහු බොහෝ හිරිහැර කරදර ද කරනව. ඔහු හිතාගෙන ඉන්නෙ ඇමතිතුමාටත් වඩා වැඩි බලයක් ඒ කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් ඔහුට තිබෙනවාය කියායි.

තවත් කාරණයක් නම් එක් අවස්ථාවකදී අමතිතුමා පිළිගත්තා, ඒ ජනපදයේ වාසීන්ටම ඒ කර්මාන්ත ශාලාවෙ රක්ෂාව දිය යුතුය කියා. නමුත් ඊට පටහැණිව වැවිලි මණ්ඩලය විශාල වශයෙන් මුදල් වියදම් කර, ලොරි යවා වෑන් රථ යවා හැතැප්ම හත අට ඈතින් මිනිස්සු ගේනව. ඒ ගැන ස්ථිර ලේකම්තුමාට කිව්වට පස්සෙ ඒ ක්‍රමය නවත්වා තිබෙනව. නමුත් මේ සම්බන්ධ කරුණු ඉදිරිපත් කළ කම්කරුවන් කීප දෙනෙක්ම අස් කර දමා තිබෙනව. දයාවතී කියා කාන්තාවක් ඉතාමත් අසාධාරණ විධියට අස් කළා. ඇමතිතුමාට ඒ පිළිබඳව මම ලියවිල්ලකින් දන්නුව. ඇමතිතුමා ඒ ලියවිල්ල කාට ඉදිරිපත් කළාද කියා මා දන්නෙ නැහැ. වැවිලි මණ්ඩලයටත් ඒ ගැන කිව්ව. නමුත් ඒ අවස්ථාවේදී මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරාවුල බේරීමට කිසිවෙක් මැදිහත් වුණේ නැහැ. විශෙෂයෙන්ම පෞද්ගලික ආයතනයක් නොවන නිසත්, රජයේ සංස්ථාවක් නිසත්, එම ස්ථානයේ වැඩ කරන සේවකයන්ගේ නීත්‍යනුකූල අයිති වාසිකම් පමණක් නොවෙයි, වර්ෂයාවසානයේදී එම සංස්ථාවෙන් ලැබිය යුතු ලාභ සහ වෙනත් සහනයන්ද සේවකයන්ට ලැබේයයි අප බලාපොරොත්තු වුණා. නමුත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? මෙම ස්ථානයේ වැඩ කටයුතු පෞද්ගලික කර්මාන්ත ශාලාවකට අන්ත තත්ත්වයකට වැටී තිබෙනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ස්ථානයේ සේවයෙන් අස් කරන ලද දයාවතී නමැති කාන්තාව ආපසු එම කර්මාන්තශාලාවේ වැඩට ගත යුතු බවට එම කර්මාන්ත ශාලාවේ උපදේශක මණ්ඩලයට දිසාපතිතුමා ඉදිරියේදී කරුණු ඉදිරිපත් කළා. නමුත් එයින් සහනයක් ඒ කාන්තාවට සැලසුනේ නැහැ. ඒ පිළිබඳව උපදේශක මණ්ඩලයෙන්වත් ඇමතිතුමාගෙන්වත් පිළිතුරක් ලැබුණේ නැහැ. ඊට පසුව වෙනත් කරන්නට දෙයක් නැති නිසා කම්කරු විනිශ්චය සභාවක් ඉදිරිපිට විභාග කිරීම පිණිස මේ කාරණය පිළිබඳව පැමිණිලි කළා. මේ කාන්තාව කම්කරු සේවිකාවක් වශයෙන් සේවය කළ නිසත් විශාල ආදායමක් ලැබුණේ නැති නිසත්, වෙනත් අයට වාගේ ලොකු නීතිඥයකු මේ කාන්තාව වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. මෙම පැමිණිල්ල අනුව නඩු විභාගය තිබුණේ ගිය මාසයෙයි. මෙදින මෙම කාන්තාව වෙනුවෙන් පෙනී සිටියේ අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය දහනායක) යි.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
හරි ෂෝක්නෙ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

නමුත් කියන්න කණගාටුයි, එදින මේ කාන්තාව අසනීපව සිටි නිසා කම්කරු උසාවියේ පෙනී සිටින්න නොහැකි වුණා. එම නිසා ඒ අවස්ථාවේදී විදුලි පුවතක් කම්කරු උසාවියට යැව්වා, අසනීප නිසා කාන්තාවට එන්නට නොහැකිය, ඒ පිළිබඳව වෛද්‍ය සහතිකයක් එවනවාය, විභාගය සඳහා වෙනත් දිනයක් නියම කරන්නටය කියා. මේ කාරණය ගාල්ලේ ගරු මන්ත්‍රීවරයාත් කම්කරු උසාවියට දැනුම් දුන්නා. නමුත් තමුන්නාන්සෙලාගෙ වැවිලි මණ්ඩලයෙ නිලධාරීන් මොකද කළේ? මෙම නඩුව සඳහා ඉහළම පෙළේ නීතිඥයකු සමග උසාවියේ පෙනී සිටියා. මෙ වැනි නඩු ඉතාමත්ම සුළුවෙන් විසඳන්ට පුළුවන් වුණත් ඉහළම පෙළේ නීතිඥයන් සමගයි පෙනී සිටින්නෙ. මෙබඳු ආරාවුල් ඇති වුණාම, සුළු සුළු ආරාවුල් ඇති වුණාම, තමුන්නාන්සෙගෙ වැවිලි මණ්ඩලය කරන්නෙ ලොකු ලොකු නීතිඥයන් ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා ප්‍රශ්නය කොතරම් සුළු වුවත් විශාල මුදලක් වියදම් කරනව. මේ කාරණයේදී පවා, සාමාන්‍යයෙන් පෞද්ගලික කොම්පැනියක්වත් නොකරන අන්දමේ වැඩ පිළිවෙලක් අනුගමනය කළා. එදා ගාල්ලේ කම්කරු උසාවියට පැමිණි තමුන්නාන්සෙගෙ වැවිලි මණ්ඩලයෙ නිලධාරීන් ඉල්ලා සිටියෙ මොකක්ද? එදිනට පැමිණෙන්න නොහැකිනම් මෙම නඩුව තවදුරටත් විභාග නොකර ඉවත දමන ලෙසයි. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මෙවැනි ප්‍රතිපත්තියක් රජය අනුගමනය කරනවා නම් එය සාධාරණද කියා මම ප්‍රශ්න කරනව. ඉතාම දරුණු කොම්පැනි කාරයකුගෙන් වුණත් මෙවැනි අවස්ථාවකදී සහනයක් ලබාගන්න පුළුවනි. නමුත් රජයේ සංස්ථාවකින් එවැන්නක් බලාපොරොත්තු වෙන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනව. එම ස්ථානයේ සේවකයකු වශයෙන් සෑහෙන කලක් වැඩ කළ අසරණ කාන්තාවක් සාධාරණය ඉටු කර දෙන ලෙස පැමිණිලි කළාම, එය විභාග කරන අවස්ථාවට අසනීප නිසා එන්නට බැරි වුණාම, රජයෙන් ඉහළ පෙළේ නීතිඥයන් පෙනී සිටි පලියට, ඒ අයට විශාල ගාස්තු ගෙවන්නට වූ පලියට, එබඳු ඉල්ලීමක් ඉවත ලෑම සාධාරණද කියා මම ඇමතිතුමාගෙන් අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

ඒ සමගම මතක් කළ යුතු දෙයක් තිබෙනව. මෙවැනි ආරාවුලක් ඇති වුණු අවස්ථාවෙදි එය සුළුවෙන් විසඳීමට උනන්දුවක් නොදැක්වීම නිසා රජයට විශාල මුදලක් වියදම් කරන්නට වෙනව. ඇත්ත වශයෙන් මේ ප්‍රශ්නය බේරීමට රජයට කිසිම මුදලක් වැය වෙන්නෙ නැහැ. නමුත් අද වැවිලි මණ්ඩලයෙන් උසස් පෙළේ නීතිඥයන් පෙනී සිටිනව. මේ අයට විශාල ගාස්තුවක් ගෙවන්නට වෙනව. ඒ සමගම එම කටයුතු සඳහා යන නිලධාරීන් වෙනුවෙන් විශාල මුදලක් වැය කරන්නට සිදු වෙනව. නමුත් මේ කිසි වියදමක් නැතුව මේ ප්‍රශ්නය විසඳන්ට පුළුවන් ක්‍රම තිබෙද්දි රජය නිරපරාදේ මුදල් වියදම් කරනව. මේ විධියට අනන්ත කාරණා මේ වැවිලි මණ්ඩලය ගැන කියන්නට පුළුවනි. කෙසේ හෝ වේවා, දැරංගල තේ කර්මාන්ත ශාලාව පිළිබඳ වැවිලි මණ්ඩලය අනුගමනය කරන ක්‍රියා කලාපය ගැන, එහි කෙරෙන වැරදි සම්බන්ධයෙන් මේ වන තෙක් පරීක්ෂණයක් නොපැවැත්වීම ගැන, එවැනි තත්ත්වයක් දිගින් දිගටම පවත්වාගෙන යාමට ඉඩ දීම ගැන ගරු ඇමතිතුමා ලජ්ජා වෙන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් මෙයට වඩා කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. තවත් එක් කාරණාවක් ගැන පමණක් සඳහන් කර මගේ කථාව අවසන් කරනව.

මෙම කර්මාන්ත ශාලාව සඳහා රජයෙන් ලක්ෂ 14ක පමණ මුදලක් වියදම් කර තිබෙනව. අද මොරවක්කෝරලේ පමණක් නොවෙයි, මුළු දකුණු පළාතේම මෙම කර්මාන්ත ශාලාව තරම් හොඳ අංග සම්පූර්ණ තේ කර්මාන්ත ශාලාවක් නැති බව කියන්න පුළුවනි. නමුත් පසුගිය අවුරුදු කීපය තුළ වැඩ කරගෙන ගිය ආකාරයට තව දුරටත් වැඩ කර ගෙන ගිය හොත් ඒ කර්මාන්ත ශාලාවෙන් ප්‍රයෝජනයක් ගන්නට බැරි තත්ත්වයක් ඇති වන බව මතක් කර දිය යුතුව තිබෙනව. දැනට මත් එහි යන්ත්‍ර උපකරන නරක් වන බව, ක්‍රියා විරහිත වන බව, මට දැන ගන්නට ලැබී තිබෙනව. අවස්ථා කීපයක දීම එසේ සිදු වීමට හේතු වී තිබෙන්නෙ, එම කර්මාන්තශාලාව භාරව සිටින සුපිරින්ටෙන්ඩන්ට්වරයා තේ කර්මාන්තය පිළිබඳව හෝ යන්ත්‍ර සූත්‍ර ගැන කිසිම දැනීමක් නැති පුද්ගලයකු වීමයි. මේ නිසා, අවස්ථා ගණනකදී යන්ත්‍ර සූත්‍රවලට අලාභ හානි සිදු වී තිබෙනව.

ඒ නිසා අපි ඇමතිතුමාට කියා සිටින්නේ ඇමතිතුමා ජනපද ඇති කර ජනතාවට විශාල සහනයක් ලබා දීමට බලාපොරොත්තු වුණා නම් ඒ සහනය දිය හැක්කේ පුළුවන් ඉක්මනින් මේ තේ කර්මාන්තශාලාව වැවිලි මණ්ඩලයෙන් පැත්තකට ගෙන එය ජනපදවාසීන්ගේ සමුපකාර සමිතිවලට පැවරීමෙන් බවයි.

දැනට අවුරුද්දකට පමණ පෙර ජනපද වාසීන් හා අපි කරුණු ඉදිරිපත් කිරීම නිසා එදා මාතර සිටි උප දිසාපතිවරයා වෙනත් ප්‍රදේශයකට මාරු කර හැරියා. ප්‍රන්සිස් පිටර් නමැති ඒ උප දිසාපතිවරයා මේ මස පළමුවන දා සිට මාතර දිසාපතිවරයා හැටියට එවා තිබෙනවා. ඔහු උප දිසාපතිවරයා වශයෙන් සිටියදී ඔහුට විරුඬව කරුණු ඉදිරිපත් කළ ජනපදවාසීන්ට මේ නිසා බලවත් කරදරයකටයි, මුහුණ පාන්නට සිදු වන්නේ. ඔහු උප දිසාපතිවරයා වශයෙන් සිටි කාලයේදී නිලධාරීන්ගේ පැත්ත ගෙන ජනපදවාසීන්ට අහිත කර වැඩ කළා. නිලධාරීන් කියන අසත්‍ය දේ සත්‍ය හැටියටත් ජනපදවාසීන් කියන සත්‍ය දේ අසත්‍ය හැටියටත් පිළිගෙන එදා ඔහු ක්‍රියා කළා. ඒ නිසා අද ඒ මහත්මයාම මාතර දිසාපති හැටියට වැඩ කරන්නට ගියොත් ජනපදවාසීන්ගේ ඉදිරි ගමනට ඉන් මහත් බාධා ඇති වන්නට පුළුවනි. ඒ නිසා ප්‍රන්සිස් පිටර් මහත්මයා වෙනත් ප්‍රදේශයකට යවා වෙන කෙනෙක් මාතර දිසාපති හැටියට පත් කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 3

දැන් අළුතෙන් ආරම්භ කරන ජනපද තිබෙනවා. ඒවායේ දියුණුව බලාපොරොත්තු විය හැක්කේ පළාතේ දිසාපතිවරයාගෙ ක්‍රියා අනුවයි. දිසාපතිවරයා ජනපදවාසීන් සමග කිට්ටු සම්බන්ධතාවයකින් වැඩ කිරීමට සූදානම් නැති නම්, නිලධාරීන් කියන දේ අනුව පමණක් වැඩ කරනවා නම්, එවැනි පෙදෙසක තිබෙන ජනපදවලින් සාර්ථක ප්‍රතිඵල ලබාගන්නට පුළුවනක් වන්නේ නැහැ. මේ දිසාපතිවරයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේ පැමිණීම සම්බන්ධයෙන් අපේ ප්‍රදේශයේ ජනපදවාසීන් තුළ තද නොසන්සුන්තාවක් තිබෙනවා. උප දිසාපති වරයා වශයෙන් සිටි කාලයේදී ඒ මහතා කළ පළිගැනීම් ක්‍රියා නිසා, ඒ ඒ අයගේ ඉඩම් අවලංගු කිරීම් ආදිය නිසා, ජනපද වාසීන් රැස්වීම් තබා ඔවුන්ගේ විරුඬත් වය ප්‍රකාශ කළා. ඇමතිතුමාට පවා කරුණු ඉදිරිපත් කළා.

කරුණු මෙසේ හෙයින් මේ මහත්මයා මාතර දිසාපතිවරයා හැටියට සිටීමෙන් එහි ජනපදවාසීන්ට සෙතක් නොවන බව පෙනෙනවා ඇති. ඒ නිසා ජනපදවලට ආදරයක් තිබෙනවා නම්, මේ මහත්මයා මාරුකර ජනපද හා ඒවායේ වැසියන් පිළිබඳව යම් කිසි දැනුමක් ඇති කෙනෙක් ඒ ප්‍රදේශයේ දිසාපතිවරයා හැටියට පත් කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මාතරට දැන් පත් කර සිටින දිසාපතිතුමා මාරු කරන ලෙසත්, දැරංගල තේ කර්මාන්තශාලාව ජනපදවාසීන්ගේ සමූපකාර සමිතිවලට අයිති කර දෙන ලෙසත් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க—காலி)*
(Dr. W. Dahanayake—Galle)

I wish to make a few observations on a few of the departments under the Minister of Land, Irrigation and Power.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

How long are you taking?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

Half an hour.

The first of these departments is the Department of Electrical Undertakings. There is a branch of this department in Galle. This is being thoroughly neglected and the Electrical Engineer in Galle has assumed for himself imperial powers. The work in this department is hopelessly neglected so much so that not even half the voted expenditure for each year is utilized.

The number of labourers in the cadre should be about 130 but they have now about 40 labourers. The work in this division has increased vastly during the last 10 years. For example, the number of sub-stations that have to be looked after in the Southern Division has increased from 2 to 8. The number of engine stations has increased from 7 to 32. The number of depots has increased from 2 to 6. The total length of transmission lines is now 165 miles but the staff that has to work in this division is very much below strength. I have already told you that the sanctioned cadre of labourers is about 130 but only about a fourth of them are at work now. Similarly even at the office the number of those who are at work now is below the sanctioned strength.

I have pointed out that it is necessary to increase the staff by at least 2 clerks, I timekeeper, 1 storekeeper and a typist. Nothing has been done and not only is the field work thoroughly neglected but even office work connected with the labourers is very much behind time. For instance, the work connected with payments to labourers is not done on time. The result is that there is grave dissatisfaction.

Now the engineer in charge of the Southern Division has ordered the employees not to make any complaints to him. He has issued notice asking the employees not to see him in his office. I have brought all these matters to the notice of the Hon. Minister and of the Permanent Secretary but nothing has yet been done. The most ugly feature of the whole matter is that not even half the voted expenditure for each year for various works in the Southern Division is spent by this department. Everything is in a state of neglect. Even the office is not properly kept.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]
They have recently gone and installed the office in a nook so that dark deeds may be committed——

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

In broad day-light!

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

——without the knowledge of anybody.

The other day I discovered that the motor pump in the well at the Sangamitta Maha Vidyalaya had not been repaired for 6 months; 3,000 girls had been without water for two school terms and the Electrical Department had done nothing about it.

I think there is sabotage in the Electrical Department down in the Southern Province. All these remarks of mine refer to the Government Electrical Department that functions in Galle.

Other work also connected with the Government Electrical Department in the Southern Division is in a chaotic condition. The transmission lines of the Laxapana extensions are being installed in the Galle District. There again, you find that a very sorry state of affairs has arisen. To my knowledge, the officers responsible for taking these transmission lines have decided upon cutting down a large number of valuable trees belonging to people who cannot afford to lose these trees. Well, if the cutting down of such trees is inevitable there is no help for it; but I found in several instances that the officers concerned had saved the trees of wealthy people and had decided to cut down the trees of poorer people. I found that in certain places the estates of richer folk had been avoided and the cultivations of the poorer people had been taken in.

All these matters have been brought to the notice of the proper authority and we have asked for inquiries into the proposals for acquisition. It is a very strange thing that the department has not even allowed the inquiries to be held. If a transmission line is to go through a particular field or garden the owner of the field or garden has the opportunity of stating his objections before the Government Agent. Who is the acquisition authority? The owner of the field or land sends up his objections to the Permanent Secretary to the Ministry of Land, Irrigation and Power, and the normal procedure is for an inquiry to be held by the Government Agent. In the case of transmission lines that are going through Galle, no such inquiries have been held for over six months on the objections that have been raised. Why are inquiries not held? I presume that the reason is that the officers of the Electrical Department fear exposure. They know that their tricks will be discovered because they have, in tracing the route of the transmission lines, avoided the plantations of wealthy people and deliberately made the ordinary man suffer. We do not want this type of crooked, corrupt action on the part of the top men in the Electrical Department. This matter has been pointed out time and again, but inquiries have not yet been held on the acquisitions.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The Government Agent is the person who inquires into them. Under the law, the Government Agent is the authority.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

The point is that he has not done so for over six months. The Government Agent of Galle says that he has not been able to hold any inquiries because the papers from the Ministry of Land, Irrigation and Power have not reached him yet.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී.ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Why the Ministry ? It goes straight to the Government Agent, not through my Ministry.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

The parties concerned have a grievance that those inquiries have not yet been held. When I make inquiries at the Kachcheri, I am told that they are unable to hold the inquiries because the papers have not reached them.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

That has nothing at all to do with the Ministry.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

If the Hon. Minister says that his Ministry has nothing to do in the matter, allow me to point out that when a land is to be acquired, in the first instance those who have objections to raise do so and address their letters to the Permanent Secretary to the Ministry of Land, Irrigation and Power. You cannot take possession of any land unless you call for objections, inquire into the objections and give an order.

අ. භා. 3.15

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I wish to correct one point. When an electricity line goes over a land, we do not acquire the land ; we only cut down the trees.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

In order to cut down the trees do you not hold an inquiry ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Yes. The Government Agent is the person who holds the inquiry, and appeals are made direct to him, not to the Ministry.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

According to the notice issued to the people, they have sent up their objections to the proper authority, but no inquiries have yet been held. The officers of the Government Electrical Department ride roughshod over the rights of these people. What we want is a full inquiry. An inquiry is not granted, and I am sorry that an inquiry is not granted because the officers of the Government Electrical Department fear an exposure.

I can point out that in a particular place the transmission line has been taken in such a way as to avoid the land of a particular individual. I, as a Member for the area, can give instances in which the land of a wealthy man has been avoided. These things happen in a very peculiar way. The man who has the ability to approach the officers by the backdoor gets the cvhance of saving his trees. The poor man gets no such chance.

What we want is that a transmission line should be taken in the best possible way without favouring any particular party. That is not done by the Government Electrical Department. That is my grievance. And I can tell this to the Hon. Minister. I am not the only Member of Parliament who makes this charge against the officers of the Government Electrical Department. I have heard so many other hon. Members making the same charge.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I accept that ; it is true ; but the appeal under the Electricity Act is to the Government Agent of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]
district. You must make the appeal to him. He can hold an inquiry and even overrule the decisions of the electrical engineers.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

Whatever it may be I can only say this. No action has been taken to objections raised where Galle is concerned, and I keep on asking both the Government Agent as well as the Ministry to take action, but neither party takes action.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I will tell the G. A. to inquire promptly into all these cases.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

Very well. So much for the paralytic disease that has overtaken the Government Electrical Department.

What can the Hon. Minister say about the votes assigned for the Southern Division for various electrical works not being expended fully ? What can the Hon. Minister say about a water pump not being repaired for six months ? What can the Hon. Minister say about overtime payments not being made to labourers for six months ? What can the Hon. Minister say about the cadre of labourers not being properly filled ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I agree with you.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

What can he say about the refusal of this department to give even an extra store-keeper to the Southern Division ? The work down there is being thoroughly neglected. So, I want the Hon. Minister, who has a large heart and a kindly disposition besides being a very efficient Minister, to look into the doings of the Government Electrical Department. I agree that the work of the department has expanded a great deal during the last ten years, but the people are not getting their due in regard to these various expansion schemes.

Allow me to make a few observations on another department of the Ministry, the Forest Department. Is the Forest Department a public utility department or is it not so ? Why is it that the needs of the ordinary man in regard to timber are not satisfied by the Forest Department ? We have in the Galle District a district depot at Boossa. That depot is located in a very central place, and one imagines that the Forest Department Depot at Boossa should be able to supply at least a fair proportion of the needs of house builders who ask the Government for their timber supplies. But what is the true position in Boossa ? Nobody can get house timber at Boossa.—[*Interruption.*] as the hon. Member for Balapitiya Mr. Lakshman de Silva says, without giving a bribe. Let me repeat what the hon. Member for Balapitiya has to say : you have to go about a hundred times before you can get your needs of timber from the Boossa depot. I know of cases where people have waited for three years and have not been able to get their timber from the Boossa depot.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The Buttala depot is also like that.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

So all depots are like this ! What is the use of this Forest Department ? I asked the question originally whether this is a public utility department or a department that is merely menat for scientific and research work in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

forestry. If the latter is the case let us be told so. Let not the people be deceived. I have pointed out that the Forest Department does not give the normal requirements of timber to the house builders. But strange to say,the Forest Department has acquired a hibit of being able to satisfy the needs of contractors. That is the charge I make against the Forest Department. They have timber to serve contractors but they do not have enough timber to give the ordinary house builder. Whenever there is any timber available, that timber goes to some contractor.

ලක්ෂ්මන් ද සිල්වා මයා. (බලපිටිය)
(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

Not even a co-operative society can get timber from this depot.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

That is right. The hon. Member for Balapitiya has experienced all the ills of inefficiency and corruption prevalent in the Forest Department.

I remmeber the case of the Telikada Maha Vidyalaya which had to put up a number of buildings within a specified time. For over a year they found it difficult to obtain their timber requirements from Boossa. They made a last minute appeal to me ; I had to send a large number of telegrams in different directions, and all that we obtained were replies that there was no timber forthcoming. Schools cannot get their timber supplies, co-operative societies cannot get their timber supplies or the ordinary housebuilder cannot get his timber supplies, but the contractor can get his timber supplies from Boossa. What is the use of that department ? I think the best thing to do is to close it down. We have watched its activities for the last several years. We have kept on pointing out that the department is not functioning properly. The result of our criticism is that there is further deterioration in the service offered by the department. I am wondering what all this is due to. What is wrong with the Forest Department ?

The other day I visited the carpentry workshop at Amparai. That workshop is doing excellent work. It is a mechanized carpentry workshop and it is something of which the Minister can well be proud, but its main grievance is that the Forest Department is not able to give it the necessary timber in adequate quantities or give it the proper qualities of timber that are needed. If the Forest Department is unable to supply a carpentry workshop its requirement, that is, if one Government department cannot meet the needs of another Government department, what is the use of this Forest Department ?

අ. භා. 3.30

Now, that happens in distant Amparai. I had previously heard and knew intimately of what is happening in my own town at Gintota. The Gintota Plywood Factory is unable to get its requirements of timber satisfactorily from the Forest Department. The Forest Department is expected to feed the Gintota Plywood Factory with timber in adequate quantities and with the correct types, but the correct type of timber is not given. Even in regard to quantity there are periodic shortages. One wonders what is going to happen as the years go on. One wonders whether, in the present circumstances, the Plywood Factory will be able to continue its existence.

That is not the only place in which such a story is true. Take the carpentry workshop at Koggala. There again the timber requirements which are channelled through the Small Industries Corporation——

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

May I disturb you for a moment ? The Plywood Factory is supplied with 14,000 cu. ft. of wood now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனுயக்க)
(Dr. W. Dahanayake)

Finally, it is my fervent hope that the Hon. Minister will give earnest consideration to all my requests during the coming financial year.

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

The Sitting is suspended for 10 minutes.

රැස්වීම ඊට අනතුරුව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 5.4 ට නැවත පවත්වන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යූ. බී. වන්නිනායක මයා.** (යාපහුව)

(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)

(Mr. U. B. Wanninayake—Yapahuwa)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, දැන් සාකච්ඡාවට භාජන වී තිබෙන මෙම අමාත්‍යාංශය ඉතා වැදගත් එකක් බව අපි කවුරුත් ඒකමතිකව පිළිගන්නවා. මේ රටේ ආර්ථික අනාගතය හුඟක් දුරට සැල සෙන්නේ මේ අමාත්‍යාංශයේ කටයුතුවල සාර්ථකත්වය උඩ බව අප කාටත් හොඳ ටම වැටහෙනවා. අප විශේෂයෙන් බලා පොරොත්තු වන කාර්මික දියුණුවට පවා අවශ්‍ය අරමුදල් අපට ලබා ගැනීමට සිදු වී තිබෙන්නේ මේ කෘෂිකාර්මික ව්‍යාපාර වලින් ලැබෙන ආදායමෙනුයි. එම නිසා තමයි, මේ මන්ත්‍රීවරුන් මෙපමණ උනන්දු වකින් හා ඕනෑකමකින් මේ අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කරගෙන යන්නේ. මේ රටේ අවශ්‍යතාවන් අනුවත්, මේ රටේ අවුරුද්දක් අවුරුද්දක් පාසා ශීඝ්‍ර අන්දමට දියුණු වේ ගන යන ජනගහනය අනුවත්, රජය විසින් වරින් වර ඉදිරිපත් කර තිබෙන ඉලක්කම් අනුවත්, මේ රටේ ඉඩම් සංවර්ධනයක් සිදු නොවන බව කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කිරීමට සිදු වී තිබෙනවා. ඉඩම් සවංර්ධනය පිළිබඳ මුළු ඉලක්කම් අංශය ගැන මා මේ අවස්ථාවේදී කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. වී නිෂ්පාදනය කරන පළාතකින් පැමිණෙන මන්ත්‍රීවරයෙක් හැටියට මේ අවස්ථාවේදී වී නිෂ්පාදනය ගැන පමණක් වචන සවල්ප යක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

මට දී තිබෙන කාලය කෙටි නිසා විස්තර සහිතව සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා ප්‍රකාශ කිරීමට අදහස් කරන කාරණය අවබෝධ කිරීමේ අදහසින් පහත නම් සඳහන් පොතෙන් ලබාගත් සංඛ්‍යා ලේඛන වලින් කරුණු දෙකක් තුනක් පමණ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙයයි එය පොතේ නම.

"A Report on Paddy Statistics" issued by the Department of Census and Statistics in the year 1956.

ඒ පොතේ 19 වැනි පිටුවේ, ඉතා පැහැදිලි අන්දමට විස්තර සහිතව මේ රටේ වී නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර තිබෙනවා. ඒ සංඛ්‍යා ලේඛන සියල්ල ම දැන් කියවීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් ඒ සංඛ්‍යා ලේඛන පරීක්ෂා කරන්නෙකුට හොඳට පෙනෙන එක කාරණයක් තිබෙනවා. මොකක්ද ඒ කාරණය ? 1951 වන අවුරුද්දේදී මේ රටට වුවමනා වූ සහල් ප්‍රමාණයෙන් සියයට 36 ක් මේ රටේම නිපදවන්නට යෙදුණා. ඒ කාරණය මේ සංඛ්‍යා ලේඛනවල තිබෙනවා. ඒ අවුරුද්ද තුළ නිපදවූ සහල් ප්‍රමාණයත්, ඒ අවුරුද්ද තුළදී රටට අවශ්‍ය වූ සහල් ප්‍රමාණයත් අනුව ඒ දෙකේ සියයට ගණන 36 යි. ඒ 1951 අවුරුද්දේදී. 1955 වන විට මේ සියයට 36 යේ ප්‍රමාණය සියයට 53 දක්වා දියුණු කර තිබෙනවා. ඒකත් මේ සංඛ්‍යා ලේඛන වලින් හොඳ හැටි පෙනෙනවා. ඒ නිසා සැලකිය යුතු දියුණුවක්, පුළුල් වීමක්, දේශීය වී නිෂ්පාදනය අතින් ලංකාව ලබා තිබෙන බව ඒ සංඛ්‍යා දෙකින් හොඳටම අවබෝධ වෙනවා. 1951 අවුරුද්දේ අපට වුමනා කරන සහල් ප්‍රමාණයෙන් සියයට 36 ක් අප විසින් නිපදවන්නට යෙදුණා. 1955 වන විට ඒ ප්‍රමාණය 53% දක්වා වැඩි කරන්ට පුළුවන්කම ඇති වුණා. මේක සැලකිය යුත දියුණුවක් ; 17% ක දියුණුවක් ඇති වුණා. නමත් 1963 දී, ඊට අවරුදු අටකට පසුව, සිද්ධ වුණේ මොකක්ද ? 1963 දී ලංකාවට වුවමනාවූ සහල් ප්‍රමාණයත් ලංකාවට පිට රටින් ගෙන්වූ සහල් ප්‍රමාණයත් 1963 පිළිබඳ මධ්‍යම බැංකු වාර්තාවේ 37 වැනි පිටේ සඳහන් කර තිබෙනවා. ඒ සංඛ්‍යා ලේඛන අනුව අද, අවුරුදු අටකට පසුව, අපට වවමනා සහල් ප්‍රමාණයෙන් 58% සි නිපදවන්නෙ. සියයට 36 වැඩිවෙමින් ඒ ප්‍රමාණය 1955 දී 53% ක් වුණා. අවුරුදු අටකට පසුව දැන් ඒ ප්‍රමාණය 58% ක් වී තිබෙනව. වී නිෂ්පාදනයේ වැඩිවීමක් ඇති වී තිබෙන බව මා පිළිගන්නව. නමුත් මා අවබෝධ කරවන්නෙ අර මුල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු 5 තුළ ඇති වූ ප්‍රමාණය, වේගය, පසුගිය අවුරුදු 8 තුළ ඇති වූයේ නැති බවයි.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
ඒ කාලය තුළ ජනගහණය වැඩි වුණා.

**වන්නිනායක මයා.**
*(திரு. வன்னிநாயக்க)*
(Mr. Wanninayake)
ඒ දවස්වලත් අපේ වැසියන් නිකම් සිටියෙ නැහැ. ඒ දවස්වලත් ජනගහණය වැඩි කළා.

දස අවුරුදු සැලැස්ම අනුව, මේ රටට වුව මනා සහල් ප්‍රමාණයෙන් 75% ක් 1968 දී නිෂ්පාදනය කිරීම තමුන්නාන්සේලාගේ ඉලක්කයයි. ඒ නිසා අවුරුද්දෙන් අවුරුද්ද නිෂ්පාදනය වැඩි කරන්ට ඕනෑ. දැන් තියෙන හැටියට මේ අවුරුදු 4 ඇතුළත තව 17% කින් නිෂ්පාදනය වැඩි කරන්ට ඕනෑ. ඒ ඉලක්කය සඵල කර ගන්න මේ රජයට බැරි වන බව අපට පැහැදිලිවම දැන් පේනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)
Order, please! The hon. Appointed Member, Mr. R. S. V. Poulier, will now take the Chair.

අනතුරුව ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් මූලාසනයෙන් ඉවත් වූයෙන්, පත් කරන ලද මන්ත්‍රී ආර්. එස්. වී. පෝලියර්, ඕ. බී. ඊ., මහතා මූලාසනාරූඪ විය.

**වන්නිනායක මයා.**
*(திரு. வன்னிநாயக்க)*
(Mr. Wanninayake)
දස අවුරුදු සැලැස්ම අනුව රජයේ ඉලක්කය 1968 වන විට මේ රටට වුවමනා සහල් ප්‍රමාණයෙන් 75% ක් නිෂ්පාදනය කිරීමයි. 1951 දී අපට වුවමනා සහල් ප්‍රමාණයෙන් 36% යි නිෂ්පාදනය කළේ. 1955 වන විට, අවුරුදු 5 ක් ඇතුළත, ඒ ප්‍රමාණය 53% දක්වා වැඩි කළා. ඒ කියන්නෙ 17% ක් වැඩි වුණා. නමුත් ඊට පසු, අවුරුදු 5 ක් ඇතුළත, මේ ප්‍රමාණය වැඩි වී තිබෙන්නෙ 5% ක් පමණයි. මට වුවමනා කළේ ඒ කාරණය අවබෝධ කරවීමටයි.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)
දැන් පෙනාකට හාල් සේරු 2 ක් දෙනවා. ඒ කාලයෙ හාල් සේරු 1 ක් නැත්නම් සේරු 3/4 ක් පමණයි දුන්නෙ.

**වන්නිනායක මයා.**
*(திரு. வன்னிநாயக்க)*
(Mr. Wanninayake)
නමුත් 1968 වන විට ලංකාවට වුවමනා සහල් ප්‍රමාණයෙන් සියයට 75 ක් නිපදවන්නෙ කොහොමද?

අපි ඊළඟට අක්කරයකින් නිපදවන වී ප්‍රමාණය ගැන බලමු. ඒ සම්බන්ධවත් මා ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. 1951 දී අක්කරයකින් නිපදවූ සාමාන්‍ය නිෂ්පාදනය බුසල් 26.5 යි. 1955 වන විට මේ ප්‍රමාණය බුසල් 32.5 දක්වා වැඩි වුණා. 1963 මධ්‍යම බැංකුවේ වාර්තාව අනුව අක්කරයකින් නිපදවන වී ප්‍රමාණය බුසල් 38 යි. ඒ අනුව බලන විට වැඩිවීමක් ඇති වී තිබෙන බව ඇත්තයි. එහෙත් වැඩිවීමේ වේගයේ ප්‍රමාණය පසුගිය අවුරුදු කීපය තුළදී අඩු වී තිබෙන බව හොඳ හැටි ප්‍රත්‍යක්ෂ වෙනවා. අක්කරයකින් නිපද වන වී ප්‍රමාණය ගැන මේ රජයේ ඉලක්කය මොකක්ද? දස අවුරුදු සැලැස්ම අනුව 1968 දි අක්කරයකින් වී බුසල් 48 ක් නිපදවන්ටයි, බලාපොරොත්තු වෙන්නෙ. එහෙත් මේ ඉලක්කය ළඟට කිට්ටු වෙන්ට මේ රජයට බැරි බව පසුගිය අවුරුදු වලදී ලබා තිබෙන ප්‍රගතියෙන් හොඳටම ඔප්පු වෙනවා.

අ. භා. 5.15

දැන් අවුරුදු කීපයකට පෙර මේ රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් සැලැස්මක් නිකුත් කරන්ට යෙදුණා. ඒකට කීවෙ "ඇග්‍රිකල්චරල් ප්ලෑන්" කියලයි. ඒ අනුව බලාපොරොත්තු වුණා, 1963 වන විට ලංකාවට වුවමනා සහල් ප්‍රමාණයෙන් සියයට 75 ක් මේ රටේ නිපදවන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මන්ත්‍රීනායක මයා.]

කරුණා කර ඒ පොතේ 9 වැනි පිටුව පෙරළා බැලුවොත් ඒ කාරණය හොඳහැටි පැහැදිලි ලෙස පෙනී යයි. 1963 වන විට ලංකාවට වුවමනා සහල් ප්‍රමාණයෙන් සියයට 75 ක් මේ රටේම නිපදවාගන්න ඒ අනුව බලාපොරොත්තු වුණා. ඒ පරමාර්ථය ඉටු වී නැති බව අප කාටත් දැන් පෙනී යනව. දැනට නිපදවන්නෙ සියයට 58 ක් පමණයි. ඒ වාගේම "කෘෂිකාර්මික සැලැස්ම" නමැති ඒ ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනව, 1963 වන විට අක්කරය කින් නිපදවන වී ප්‍රමාණය බුසල් 48 දක්වා වැඩි කරගන්ට බලාපොරොත්තු වන බව. එහෙත් දැනට ලැබෙන්නෙ 38 ක් පමණයි. 1963 ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාවේ 37 වැනි පිටුවේ සඳහන් කර තිබෙනව, අක්කරයකින් ලැබෙන වී ප්‍රමාණය බුසල් 38 ක් බව. එම නිසා ඒ ඉලක්කයත් සැලැස්මට අනුව සාර්ථක කර ගන්ට බැරි වූ බව පිළිගන්ට සිද්ධ වෙනව කියා මා හිතනව. සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් මා මීට වඩා කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ. මගේ කථාවෙන් මා බලාපොරොත්තු වෙන්නෙ, මගේ ආසනයෙ, අපේ පළාතෙ, කටයුතුවල පවතින දුර්වලකම් කීපයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමටයි. එම නිසා වී නිෂ්පාදනය ගැන මීට වඩා යමක් කියන්ට යන්නෙ නැහැ. එහෙත් මා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනවලින් හොඳටම පැහැදිලි වෙනව, මේ රජය, රටේ අවශ්‍යතා අනුව, අවුරුදුපතා වැඩි වන ජනගහණය අනුව, මේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කළ සැලැස්මවල ඉලක්ක අනුව මේ රටේ ඉඩම් සංවර්ධනය —විශේෂයෙන් වී ගොවිතැන—සාර්ථක කර නැති බව.

මා මුලින් කියන්ට යෙදුණා, මා නියෝජනය කරන පළාත බොහෝ සේ වී නිෂ්පාදනය කරන්නන් ජීවත්වන පළාතක් බව. දැන් මා බලාපොරොත්තු වෙන්නෙ, අපේ පළාත්වල වී ගොවිතැන දියුණු කිරීමට ඇති බාධාවන් කීපයක් ගැන කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරන්ටයි. පළමුවෙනි බාධකය හැටියට තිබෙන්නෙ, අපේ පළාතේ තිබෙන කුඹුරු අවුරුද්දට දෙකන්නක් වැඩ කිරීමට සෑහෙන තරම් ජල පහසුකම් අපට නොලැබීමයි. සාමාන්‍යයෙන් සෑම අවුරුද්දක්ම පාහෙ එක කන්නයි, වැඩ කරන්න වෙන්නෙ. අවුරුදු හතරෙ පහේ කාල සීමා තුළ ඒ අන්දමටත් කරන්න බැරි අවස්ථා තිබෙනව. එසේ වන්නෙ, වතුර ලැබීමෙ දුර්වලකම් නිසයි. ඇතැම් කන්නවලදි කිසිම වැඩක් කරන්න බැහැ. වතුර නැති නිසා. එවැනි අවස්ථා වක් දැන් පැමිණ තිබෙනව. මේ දවස්වල බොහෝ කුඹුරු වැඩ කර නැති බව කියන්න ඕනැ. එම නිසා ඒ පළාතෙ වී ගොවිතැන දියුණු කිරීමට වුවමනා නම් පළමුවෙන්ම ජල පහසුව සැලසිය යුතු බව කිවයුතුයි.

අපේ ප්‍රදේශයට සාමාන්‍යයෙන් කියන්නෙ වැව් ප්‍රදේශය කියායි. අපේ ප්‍රදේශයෙ සෑම ගමකටම පාහෙ වැවක් බැගින් තියෙනව. ඇතැම් ගම්වලට වැව් දෙක බැගිනුත් තියෙනව. මේව, පරාණ කාලෙ සෑදූ වැව් බව කියන්න කැමතියි. වැසි කාලසීමාවලදී මේ වැව්වලට වතුර පුරව ගන්නව. ඒ වතුර ප්‍රයෝජනයට ගෙන ක්‍රමානුකූලව වී ගොවිතැන් කළා. නමුත් කාලයාගේ ඇවෑමෙන් එම වැව් විශාල ගණනක් දැන් ගොඩ වෙලයි තියෙන්නෙ. ඒවයෙ ඒ කාලෙ තිබුණු ජම්බුර ප්‍රමාණය දැන් නැහැ. කෙටියෙන් කියනව නම්, ඉස්සර තිබුණු ජම්බුර ප්‍රමාණයෙන් බාගයක් වත් දැන් නැහැ. වැ කඳුවිල තත්ත්වයත් ඉතාම දුර්වලයි.

කුඹුරු පණතෙ දුර්වලකම් නිසා නොවෙයි, එසේ වී තිබෙන්නෙ. කුඹුරු පණතින් අදහස් කළේ හොඳ දෙයක්. කුඹුරු පණතෙ ඇතැම් පරමාර්ථ හොඳයි; නමුත් එය ක්‍රියාවෙ යොදවන ආකාරය නිසා අපේ වැව්වල තත්ත්වය ක්‍රමක්‍රම යෙන් දුර්වල වේගෙන යනව. මෙය භයානක දෙයක් බව කියන්න ඕනැ. අපේ පළාත්වල වැසියන්ට තියෙන ඉතාම වටිනා වස්තුව තමයි, වැව්. වැව් දුර්වල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුණොත් එම වැසියන්ගෙ ජීවිතත් ඒ අනුවම දුර්වල වෙන බව අප කාටත් වැටහෙනව. දැන් අපේ වැව් බැම්මිවල පැලැටි වැවීගෙන යනව. ක්‍රමක්‍රමයෙන් එම පැලැටි ලොකු ගස් බවටත් පරිවර්තනය වීගෙන එනව. කුඹුරු පණත යටතෙ කටයුතු කිරීමට පත් කර ඇති ගොවි කාරක සභා ක්‍රමානුකූලව රැස් නොවන නිසා, ඒ අය ක්‍රමානුකූලව වැඩ නොකරන නිසා, අපේ වැව්වල තත්ත්වය, විශෙෂයෙන් අපේ වැව් බැම්මිවල තත්ත්වය සීඝ්‍රාකාරයෙන් පිරිහීගෙන යන බව පේනව. එසේ වන්නට හේතුව එම කාරක සභා වෙනුවෙන් වගකීමක් ඇතිව වැඩ කරන්න මාසික වේතනයක් ලබන නිලධාරීන් නොමැති වීමයි. ගැමියන් කීප දෙනකු තෝරා කාරක සභාවක් වශයෙන් පත් කර ගන්නව. නමුත් ඒ අයට විවේකයක් ලැබෙන්නෙ නැහැ, මෙවැනි පොදු දේ සඳහා කාලය ගත කරන්න. නමුත් ඒ සඳහා මාසික වේතනයක් ලබන, ඒ වෙනුවෙන් ඇප කැප වුණු නිලධාරීන් සිටිනව නම් එම කාරක සභා රැස්වීම් පවත්වා විධිමත් පරිදි කටයුතු යොදන්න පුළුවනි.

ගොවි පාලක ලේකම්වරුන් ඉතා උනන්දුවෙන් කටයුතු කරන්න මුල් කාලයෙ පටන් ගත්ත. වැඩි කලක් යන්න පෙර එම රක්ෂාවෙ සථිර මාසික වේතනයක්වත් නැති නිසා වෙනත් රක්ෂාවල් සොයා ගෙන ඔවුන්ගෙන් වැඩි දෙනා අයින් වුණා. මේ කුඹුරු පණත යටතෙ පත් කරන ගොවි කාරක සභා ක්‍රියාශීලි කාරක සභා හැටියට පත් කර ගන්න වුවමනා නම්, මාසික වේතනයක් සහිතව වගකීමක් ඇති නිලධාරීන් පත් කරන්න ඕනෑ. එක් කාරක සභාවකට එක් අයකු බැගින්වත් අඩු ගණනෙ පත් කරන්න ඕනෑ. එම නිලධාරියා වෙනුවෙන් ගෙවිය යුතු වැටුප ආණ්ඩුව මගින් හෝ කාරක සභාව මගින් හෝ ගෙව්වට කමක් නැහැ. නමුත් එම නිලධාරියාට මාසයෙ අවසාන යෙදී නියමිත වශයෙන් වේතනය ලැබෙන්න සලස්වන්න ඕනෑ. වේතනයක් නොමැතිව මේ වෙනුවෙන් කාලය ගත කිරීමට සුදුසු තරුණයන් තෝරා ගැනීම දුෂ්කරයි.

අපේ වැව්වල තත්ත්වය ක්‍රමක්‍රමයෙන් හීන වේගෙන යාම ඉතා භයානක දෙයක් බව නැවත වරක් මතක් කරන්න ඕනෑ. අධික වර්ෂාව පවතින කාලවලදි එම වැව් බැම් දුර්වල නිසා කඩාගෙන යනව. අපේ ප්‍රදේශයෙ වැව් පාවුලයි ගම් තියෙන්නෙ; ගම් පාවුලයි වෙල් තියෙන්නෙ; මේ සියල්ලටම උස් පෙදෙසකයි හේන් තියෙන්නෙ. ඒ විධියටයි, අපේ ප්‍රදේශයෙ සේරම ගම් සැදිල තියෙන්නෙ. යම්කිසි විධියකින් බැම්ම කැඩුණොත් ගම විනාශයි. පසුගිය අවුරුද්දෙදි මීගලෑව කියන වැවේ බැම්ම කැඩුණා. බැම්ම කැඩෙන බව කල් තියාම තේරුම් ගැනීමට පුළුවන් වූ නිසා එතනින් ඉවත් වී යාමට සමහර මිනිසුන්ට ඉඩ ලැබුණා. පැන යාමට පුළුවන් වූ අය බේරුණා. වේගයෙන් ගලා ආ ජල පහරට සියල්ලක්ම පාහේ ගසාගෙන ගියා. ඒ නිසා ගොවි මණ්ඩල මගින් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සකස් කරනු ලබන වෙන යම්කිසි සංවිධානයක් මගින් හෝ වෙනත් මොනම ක්‍රමයකින් හෝ කල් නොයවා ඉතාම ඉක්මනින් බැම්ම හරිගස්සන්නෙ නැත්නම් එයින් ඒ පළාත් වාසීන්ට මත්තට භයානක ඉරණමකට මුහුණ දෙන්න සිදු වෙනව. වැඩි කල් යන්ට මත්තෙන් පළාත්වාසීන්ට මුහුණ දීමට සිදු විය හැකි භයානක විපත් මගහරවා ගත යුතුව තිබෙනව.

මා මුලින් කිව්වා වාගේම කාලයාගේ ඇවෑමෙන් වැව් බොහොමයක් දැන් හුඟක් දුරට ගොඩ වෙලා තියෙනව. කලින් කලට ඇති වන වර්ෂාවට පස සෝදාගෙන ඒමෙන් එකතු වන විශාල පස් තොගවලින් වැව් බොහෙමයක් ගොඩ වෙලා තියෙනව. ඒ නිසා දැන් සමහර වැව්වල තිබෙන්නෙ ඉස්සර තිබුණු ජම්බරෙන් භාගයක්වත් නැති තරමටයි. ඒ නිසා දැන් මේ වැව්වල අල්ලන වතුරත් හුඟක් අඩුයි. එපමණක් නොවෙයි, වාෂ්ප වන වතුර ප්‍රමාණයත් වැඩි වෙනව. යම් තැනක තිබෙන වතුර ගැඹුරින් අඩු නම් එය වාෂ්ප වීමේ වේගයත් වැඩියි. ඒ අනුව ගැඹුර නැති තැනක ජලාශයක් තිබෙනවා නම් එතන වාෂ්ප වීමත් ඉක්මනින් සිද්ධ වෙනව. වෙනත් බොහෝ ප්‍රදේශවලට ලැබෙන වර්ෂ පතනය ගැන සලකා බලන විට මේ ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

සැහෙන්ට ඉහළයි. යම් පළාතකට අවුරුද්දකට අඟල් පණහේ සිට හැත්තෑ පහ දක්වා වර්ෂාපතනයක් ලැබෙනවා නම් එය සාමාන්‍යයෙන් ඉහළ ප්‍රමාණයක් හැටියට ගණන් ගන්න පුළුවනි. අවුරුද්දකට ලැබෙන මුළු වර්ෂා ප්‍රමාණය අඟල් 50-75 දක්වා නිසා එය සැහෙන්ට ඉහළ වර්ෂා පතනයක් හැටියට සලකන්න පුළුවනි. එහෙත් මේ වර්ෂාපතනය අවුරුද්ද තුළ ඒකාකාරව බෙදී යන්නෙ නැහැ. මාස දෙකක් නැත්නම් තුනක් ඇතුළතයි මේ මුළු වර්ෂාවම ලැබෙන්නෙ. ඉතිරි මාස දහය නැත්නම් නමය පායන නිසා—අවුරුද්දේ සෑම මාසයක් තුළම විසිරී නොයන නිසා —වියලි කාලයේදී ඒ වැව්වල ජලය වාෂ්ප වී යාම බහුලව කෙරෙනව. ඉස්සර වැව් වලින් ලැබුණු තරම් ජල ප්‍රමාණයක් දැන් ලබා ගන්න බැරි වී තිබෙන්නෙ ඒ නිසයි. මේ ගැන වරින්වර යෝජනා කිහිපයක් ඉදිරිපත් කර තිබෙනව. මේ වැව් භාරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න බැරිද කියා වරින්වර ප්‍රශ්න කර තිබෙනව. ඩ්රෙජර් යන්ත්‍ර පාවිච්චි කොට වැව් භාරන්න බැරිදැයි ඇහුවා. මේක අධික වියදමක් යන වැඩක්ය කියල ඒ දවස්වල කිව්ව. දැන් ඉතින් අමුතු ක්‍රමයක්වත් යොදා එය කරන්න යනවද දන්නෙ නැහැ. මේ වැව් තරමක්වත් ගැඹුරු කිරීමෙන් ජල ප්‍රශ්නය විසඳීමට ක්‍රියා මාර්ගයක් සකස් කරන ලෙස මීට පෙර වතාවක කළ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් දෙපාර්තමේන්තුව කියා සිටියෙ ඒ පිළිබඳව යන වියදම අධික නිසා එය භාර ගන්න බැරි වැඩක්ය කියායි.

නවීන ක්‍රමයට අනුව ගොවිතැන් කිරීම තවමත් ඒ පැත්තේ බහුලව කෙරෙන්නෙ නැහැ. දැනට වඩා උනන්දුවක් දක්වා නවීන ක්‍රම යොදා ගොවිතැන් කිරීමේ පහසුකම් ලබා දුන්නොත් ඇත්ත වශයෙන්ම අක්කරයකින් දැනට ලැබෙන අස්වැන්න ප්‍රමාණයට වඩා බෙහෙවින් උසස් අස්වැන්නක් ලබා ගන්න පුළුවන් වෙනව. ඒ නිසා පැළ සිටුවීම, පොහොර යෙදීම ආදි කටයුතු සම්බන්ධයෙන් නවීන ක්‍රම වඩ වඩා යොදා ගන්න ඕනෑ. දැනට නවීන ක්‍රම අනුව ගොවිතැන් කටයුතු කෙරීගෙන යන්නෙ බොහොම සුළු වශයෙනුයි. දැනට වඩා පහසුකම් සලසා දුන්නොත් ඒ පළාත්වාසීන්ට තමන් නිෂ්පාදනය කරන වී ප්‍රමාණය වැඩි කර ගන්නට පුළුවන් බව කියන්න කැමතියි. පරම්පරාගතව වී ගොවිතැන් කරන ඒ පළාත්වල ගොවි ජනයා ජනපදවලට ගිහිල්ල වැඩ කරන සමහර උදවිය වගේ අමුතුවෙන් ගොවිතැන ඉගෙන ගන්න උත්සාහ කරන පිරිසක් නොවෙයි. ඒ නිසා පරම්පරාගතව ගොවිතැන් කරන ඒ පළාත්වැසීන්ට නවීන පහසුකම් සහ වෙනත් පහසුකම් හරියාකාර ලබා දෙන්න පුළුවන් නම් ඒ නිසා විශේෂයෙන් ධෛර්යට පත් වන ඒ ජනයාට වී නිෂ්පාදනය සම්බන්ධයෙන් විශාල දියුණුවක් ලබා ගන්න පුළුවනි.

මා නියෝජනය කරන යාපහුව කොට්ඨාශයේ ජනපද ගැනත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. මගේ කොට්ඨාශයේ ජනපද කීපයක් තිබෙනව. අබකොළවැව, අතරගල්ල, පාලුකඩවල, උස්ගල සියඹලන්ගමුව යනාදිය තිබෙන්නෙ මගේ කොට්ඨාශයේ. ඒ අතර රාජාංගන ජනපදයෙනුත් කොටසක් මගේ කොට්ඨාශයට අහු වෙනව. මේවා ඒ තරම් සාර්ථක ජනපද නොවෙයි. මේ දවස්වල ඒවායේ වාසය කරන සමහර උදවියට බීමට වුවමනා කරනජලය පවා නැති නිසා බවුසර් මගින් ජලය සපයන්න ඕනෑ. ඒ පිළිබඳව විශාල වියදමක් යනව. ඒ පළාතේ සමහර තැන්වල ළිං හාරා තිබෙන නමුත් ඒවායේත් වතුර නැහැ. සමහර තැන්වල ළිං ඇත්තෙත් නැහැ. ඒ නිසා ගොවිතැන් කිරීමට ජලය සැපයීම තබා බීමට අවශ්‍ය වතුර ටිකවත් බවුසර් මගින් හෝ ගෙන ගොස් ජනපද වාසීන්ට දෙන්න වෙලා තියෙනව. ඔය විධියයි ඒ ජනපදවල තත්ත්වය. මේ වැව් තුන ප්‍රතිසංස්කරණය කරලයි, මේ ව්‍යාපාරය ආරම්භ කර තිබෙන්නේ. නමුත් දැන් පෙනී යන්නේ ඒ ව්‍යාපාරය මගින් ජලය සැපයිය හැක්කේ එක් කන්නක් සඳහා පමණක් බවයි. ස්ථිර වශයෙන්ම ජනපද වාසීන්ට ජලය සපයන්නට පුළුවන් එක කන්නක් සඳහා පමණයි. එයිනුත් එක කොටසකට වතුර සැපයීම අවදානම් තත්ත්වයක පවතිනවා. අනික් කන්නේ දී නම් වතුර සැපයීම ගැන වැඩි විශ්වාසයක් තබන්න බැහැ. ඒ නිසා ජනපද වාසීන්ට ජීවත් වන්නට සිදු වී තිබෙන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්දකට වරක් ගොවිතැන් කර ලැබෙන ආදායමෙනුයි. එය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. අබකොළ වැව, අතරගල්ල, පාලුකඩවල යන වැව් විශාල කර දෙකන්නම වැඩ කිරීමට හැකි වන පරිදි ජලය සපයා දීම සඳහා සැලැස්මක් සාදා තිබෙන බව කියනවා. මාත් මේ සම්බන්ධයෙන් සමහර වාර්තා දැක්කා. නමුත් මේ වැඩ පිළිවෙළ කවදා කෙරේද කියා හිතන්න අමාරුයි. දැනට නම් ජනපද වාසීන්ට ගත කරන්න සිදු වී තිබෙන්නේ ඉතාමත් දුක්ඛිත ජීවිතයක්. අවුරුද්දකට වරක් කුඹුරුවලින් ලැබෙන අස්වැන්නෙන් පමණක් තඩත්තු වන්නට බැහැ. ඒක බොහොම අමාරු වැඩක්.

අ.භා. 5.30

ජනපද වාසීන්ට දී තිබෙන ගොඩ ඉඩම්වල වැවිලි ඇති කරන්නට බැරිදැයි ඊළඟට තවත් ප්‍රශ්නයක් පැන නඟිනවා. නමුත් ඒ ප්‍රදේශයේ තත්ත්වය අනුව බලන විට ගොඩ ඉඩම්වල වැවිලි යොදා වැඩි නිෂ්පාදනයක් ඇති කරන්න බැහැ. ඇළවල් අයිනේ සහ වැව් අයිනේ පොල් ගස් කීපයක් වවා ගන්නට පුළුවන් වුණත් එහි ගොඩ ඉඩම්වල වැඩි ප්‍රයෝජනයක් ලබා ගත හැකි වැවිල්ලක් යොදන්නට බැහැ. මුළු වර්ෂය ගැනම කල්පනා කරන විට අවුරුද්දේ වර්ෂාපතනය සෑහෙන ප්‍රමාණයකට ඇතත් මාස කීපයක් දිගටම ඉඩෝරය තිබෙන නිසා ගොඩ ඉඩම්වල වවන දැ විනාශ වෙනවා. ඒ නිසා කුඹුරු වැඩ කරන කාලය හැර අනික් කාලයේදී එහි වැසියන් බොහෝ ඈත ප්‍රදේශවල තිබෙන කම්කරු වැඩ සොයාගෙන යනවා. සමහර විට හැතැප්ම 50ක් 60ක් තරම් දුර කම්කරු වැඩ සඳහා යනවා. කුඹුරු වැඩ කරන්න බැරි කාලයේදී එහි වැසියන් සුළු ආදායමක් ලබන්නේ ඒ විධියටයි.

පාලුකඩවල දෙවැනි කොටස සාමාන්‍ය නිවාස ක්‍රමයක් මිස ජනපද ක්‍රමයක් නොවෙයි. මෙසේ වී තිබෙන්නේ මලදී සංවිධානය කිරීමේදී වූ අඩුපාඩුවක් නිසාදැයි මා දන්නේ නැහැ. එසේ නැත්නම් ඒ ප්‍රදේශයේ හැටියට ජනපදයක් සංවිධානය කිරීමට අමාරුකමක් තිබෙනවාද කියාත් මා දන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ ජනපදවල සිටින මිනිසුන් ඉතාමත් දුක්ඛිත ජීවිත ගත කරන බව මතක් කරන්නට සිදු වී තිබෙනවා. හැබැයි ජනපද වාසීන්ගෙන් එක්තරා සුළු ප්‍රමාණයක් වූ සියයට ගණනක් නම් සෑහෙන ආදායමක් ලබනවා. වැව් අසල හා ඇළවල් අයිනේ ඉඩම් තිබෙන අයයි, ඒ විධියට සෑහෙන ආදායමක් ලබන්නේ.

තවත් කාරණයක් කියන්නට තිබෙනවා. ජනපදවල ක්‍රම දෙකකට බදු අය කරනවා. අතරගල්ල ජනපදයෙන් අය කරන වාර්ෂික බද්ද මෙන් දෙගුණයක් අබකොළ වැව සහ පාලුකඩවල ජනපදවලින් අය කරනවා. මා මේ ගැන බොහෝ දුරට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඉඩම් දුන් කාල සීමාව අනුව එසේ බදු අය කරන බවයි, දෙපාර්තමේන්තුව කියන්නේ. මේ විධියට තර්ක කළත්, ජනපද වාසීන්ට මෙය තේරුම් ගන්න බැරි කාරණයක්. මම දන්නව, දෙපාර්තමේන්තුව ඒකට ඉදිරිපත් කරන හේතුව කුමක්ද කියා. එකක් දුන්නෙ එක කාල සීමාවකදිය, අනික් එක දුන්නෙ වෙනත් කාල සීමාවකදිය කියනව. කඩදාසිවලින් ඒවා කීවත් ජනපද වාසීන්ට ඒවා තේරෙන්නෙ නැහැ. එකට එක යාව තිබෙන ඉඩම් දෙකකින්, එකකින් අය කරනව වගේ දෙගුණයක් අනික් එකෙන් අය කරන බවයි, ඔවුන් කියන්නෙ. ඒවායේ වටිනාකම අනුව බැලුවත්—ඒවායෙන් නිෂ්පාදනය කරන්න පුළුවන් දේ ගැන බැලුවත්—වැඩි බද්ද සාධාරණ නැති බව පෙනෙන්න තියෙනව. සමහර විට වැඩි බද්ද ගන්න ඉඩම අඩු බද්ද ගන්න ඉඩමට වඩා නිසරු වන්න පුළුවන්. මේ ගැන යම් කිසි වැඩ පිළිවෙළක් යෙදීම හොඳය කියා මම සිතනව.

මී ළඟට උස් ගල සියඹලන්ගමුව ව්‍යාපාරය ගැන වචනයක් කියන්න ඕනැ. මේ ව්‍යාපාරය අනික් ව්‍යාපාරවලට වඩා වෙනස්. ඇඩ්වාන්ස් කොලනිසේෂන් ස්කීම් කියලයි, මේ විධියෙ ව්‍යාපාරවලට කියන්නෙ. අනික් ව්‍යාපාරවල නම් කලින් ඉඩම් සකස් කරල, ගෙවල් හදල ඊට පසු ජනයා පදිංචි කරවනව. මේ ව්‍යාපාරවල මහජනයා කලින් පදිංචි කරවිල ඊට පස්සෙ කැලෑ එළි කරල, ගෙවල් හදල, කම්බි ගහල වාරිමාර්ග පහසුකම් සැපයීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

ආදිය කරනව. ඒක හොඳ සැලැස්මක් අනුව සකස් කරල තියෙන බව මමත් පිළිගන්නව. නමුත් නොයෙකුත් දෙපාර්තමේන්තුවලින් කරන්නට තිබුණු වැඩ කලට වේලාවට නොකළ නිසා උස් ගල සියඹලන්ගමුව ව්‍යාපාරයට ගෙන ගොස් ඇමූ ජනපද වාසීන්ට අවුරුදු 4ක්, 5ක් ඉතා දුඃඛිත ජීවිතයක් ගත කරන්න සිදු වුණා. අදත් ඒ ව්‍යාපාරයේ වාරිමාර්ග පහසුකම් සම්පූර්ණයෙන් සපයා නැහැ. ඉඩම් කොමසාරිස්තුමාට වාර්තා මගින් හුඟක් දුරට කරුණු කියා සිටිය. එතුමා හුඟක් මහන්සියෙන් කටයුතු කරල, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නොයෙකුත් නියෝග කරල ඒ පහසුකම් හුඟක් දුරට ඇති කර දීම ගැන මම එතුමාට කෘතඥ වෙනව. නමුත් ඒ අඩුපාඩුකම් මුළුමනින්ම සම්පූර්ණ වී නැහැ. මේ අවුරුද්ද අවසානයේදී සම්පූර්ණ කරනවය කියනව. ඒ පිළිවෙළට වේවිද දන්නෙ නැහැ. ගෙවල් අඩුපාඩුව දැන් අවුරුදු 4ක් 5ක් තිස්සෙ තියෙනව. ඈත පළාත්වලින් ගෙනැවිත් ඇමූ ජනයාට, ඉන්නට ගෙයක් නැතිව, වැඩ කරන්නට කුඹුරක් නැතිව, ළමයින් යවන්නට පාසලක් නැතිව ජීවත් වීම අමාරුයි. ඒ අඩුපාඩුකම් දැන් ක්‍රම ක්‍රමයෙන් සම්පූර්ණ කරගෙන යනව. නමුත් ඒ අය ජනපදයට ගිහින් දැන් අවුරුදු 5ක් පමණ වෙනව. මේ කරුණු තවම සම්පූර්ණ වෙලා නැහැ. ගිය අවුරුද්දෙ මේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන විට ගරු ඇමතිතුමා කීව, මේ ක්‍රමය ගැන වැඩි විශ්වාසයක් නැත, අත්හදා බැලීමක් වශයෙන්ය මේ ක්‍රමය ඇති කළේ, දැන් මේ ක්‍රමය අත්හැර දමන්න යනවය, මීට පස්සෙ එහෙම කරන්නෙ නැත කියා. නමුත් රාජාංගන ව්‍යාපාරයේ දැන් හුඟක් දුරට වැඩ කර ගෙන යන්නෙ ඒ ක්‍රමයට බව මට පෙනෙනව. ළඟදී රුවන්වැල්ල පැත්තෙන් පිරිසක් ගෙන ගොස් අනුරාධපුර පැත්තෙ පදිංචි කළාය කියා මට දැන ගන්න ලැබී තිබෙනව. සුමානයක් පමණ ඉඳල කොටසක් ආපසු ගියාලු. ඈත පළාත්වල අයව ගෙන ගොස් කැලේට දාල, සුළු පහසුකමක් දීල නවත්වන්න බැහැ. අවට පළාත්වල අය නම් ඒ තත්ත්වයට අනුව ඉඩම් දියුණු කිරීමට හුඟක් මහන්සි දරණව. සමහර විට ඉන්න පළාත්වල විශාල දුෂ්කරකම් තිබෙන නිසා අනික් දුෂ්කරකම් ගැන සලකන්නෙ නැතිව හුඟක් දෙනෙක් ඒ ඉඩම්වල පදිංචියට යනව. ඒ අයට ගෙවල් සාදා ගැනීමට දෙන මුදල ප්‍රමාණවත් නැහැ. රුපියල් දාහක පමණ මුදලක් දෙන්නෙ. සාමාන්‍යයෙන් ගණන් බලා තිබෙන පිළිවෙළට ගෙයක් සාදා ගැනීමට රුපියල් දෙදහක් පමණ වුවමනා කරනව.

රාජාංගන ව්‍යාපාරය ගැනත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. ඒ ව්‍යාපාරයෙන් කොටසක් පිහිටා තිබෙන්නෙ උතුරු මැද පළාතේ. අනික් කොටස පිහිටා තිබෙන්නෙ වයඹ පළාතේ හෙවත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ. මේ රාජාංගන ව්‍යාපාරය යටතේ ඉඩම් දෙන ක්‍රමය ගැන—ඉඩම් දීම සඳහා දැනට සකස් කර තිබෙන ක්‍රමය ගැන—ඇත්ත වශයෙන් අපේ කිසිම පැහැදීමක් නැහැ. නිවිතිගල මන්ත්‍රීතුමා කීවාක් මෙන් සබරගමු පළාතේ තිබෙන වාරිමාර්ග ක්‍රමයකට ඒ අවට ගම්වල ඉඩම් නැති අය සිටිද්දී ඈත ප්‍රදේශවල අය ගෙන ගොස් පදිංචි කිරීම සුදුසු නැහැ. ඉඩම් තියෙන අයට ඉඩම් දෙන්නය කියා කව්රුවත් කියන්නෙ නැහැ. දුර පළාත්වලින් ජනයා ගෙන ගොස් පදිංචි කිරීමේ තේරුමක් නැති බවයි, මගේ තර්කය. ඒ ඇයි? කවදා හෝ ආණ්ඩුවට ඒ අවට ඉඩම් නැති ජනයාට, ඉඩම් දෙන්නට වෙනව. එත කොට මොකද සිදු වන්නෙ? ඒ ගම්වැසියන් අරගෙන වෙන දිස්ත්‍රික්කයක ඉඩම් තියෙන තැනකට දාන්න වෙනව. කාර්මික වේවා, කෘෂිකාර්මික වේවා යම් කිසි ව්‍යාපාරයක් පටන් ගත්තම ඒ ව්‍යාපාරය යටතේ අවට සිටින රක්ෂාව නැති අයට රක්ෂාව දෙන්න ඕනෑ; ඉඩම් නැති අයට ඉඩම් දෙන්න ඕනෑ. ඒ විධියට අවට සිටින අයට දෙන්න පටන්ගත්තත් ඒ අයගේ සංඛ්‍යාව ඒ තරම් විශාල වේවිය කියා මා හිතන්නෙ නැහැ. ඒ මොකද? ඒ අවට සිටින්නේ හුඟක් දුරට ඉඩම් තිබෙන අයයි. එම නිසා ඉඩම් දෙන්න සිද්ධ වන්නෙ ඉඩම් නැති ටික දෙනකුට පමණයි. ඒ ප්‍රතිපත්තිය අනුව මේ කටයුත්ත කරනවා නම් නිවිතිගල මන්ත්‍රීතුමා කී කාරණය සිද්ධ වන්නෙත් නැහැ. එක් ප්‍රදේශයක තිබෙන කෘෂිකම් ව්‍යාපාරයකට පිට පළාත්වලින් මිනිසුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙනැවිත් පදිංචි කරවීමෙන් සිද්ධ වන්නෙ ඒ ප්‍රදේශයේ ඉඩම් නැති ජනතාවට දෙන්නට ඉඩම් නැති වීමයි. කවදා හෝ දවසක ඒ ප්‍රදේශයේ ඉඩම් නැති අයටත් ඉඩම් දෙන්න සිදු වන බව මතක තබා ගන්න ඕනෑ. මේ ප්‍රතිපත්තිය අනුගමනය කළ විට මොකද වෙන්නෙ? ඒ තත්ත්වයට පැමිණි දවසක එක්කො රත්නපුරේ නැත්නම් කෑගල්ලෙ, එහෙමත් නැත්නම් මාතර ආදී දිස්ත්‍රික්කවලට ඒ ජනතාව යවන්න සිද්ධ වෙනව. කෘෂිකාර්මික ව්‍යාපාරයක් හෝ වේවා, වෙනත් කාර්මික ව්‍යාපාරයක් හෝ වේවා, යම් ප්‍රදේශයක ආරම්භ කළ විට ඒ ප්‍රදේශයේ ඉඩම් සහ රක්ෂා නැති අය ගැන පළමුවෙන් සලකන්න ඕනෑ.

දැනට වේයන්ගොඩ පළාතෙ පිහිටුවා ඇති රෙදි වියන කම්මාන්ත ශාලාවට කම්කරුවන් බඳවා ගන්නෙ ඒ අවට ප්‍රදේශවලිනුයි. එය ඉතාමත් යුක්තිසහගතයි. අන්න ඒ වාගේ අනික් සෑම දෙයක්ම සම්බන්ධයෙන්ම ඒ ප්‍රතිපත්තිය අනුගමනය කරන්න ඕනෑ. එම නිසා ඉඩම් දීමේ ව්‍යාපාරවලදී පළමුවෙන්ම ඒ අවට ඉඩම් නැති අයට ඉඩම් ලබා ගැනීමට අයිතියක් තිබෙනව නොවේද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි. [බාධා කිරීම්] ඒ සඳහාත් මොකක් හෝ කම්මාන්තයක් ආරම්භ කරන්න ඕනෑ. ව්‍යාපාර ආරම්භ කිරීමේදී පළමුවෙන්ම ඒ ව්‍යාපාර පවත්වන තැන් අවට සිටින අය ගැන සැලකිය යුතු බවයි මම කියන්නෙ.

මෙය කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් නොව, නිවිතිගල මන්ත්‍රීතුමා කී හැටියට සබරගමුව පළාතෙත් හුඟක් දුරට සිදු වීගෙන යන බව පේනව. මේ අනවශ්‍ය කරදර හිරිහැර සිදු වන නිසා අප පෙන්වා දුන් ප්‍රතිපත්තිය අනුව ඒ කාර්‍ය්‍යය කරන්නේ නම් ඉතාමත් ඥානාන්විත බවයි මගේ හැඟීම.

මී ළඟට රජයේ ඉඩම් දීම ගැනත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ඉඩම් දීමේ ක්‍රමයේ ඇති දුර්වල කම නිසා අපේ පළාත්වාසීන්ට විශාල කරදරවලට මුහුණ පාන්නට සිද්ධ වෙනව. නිත්‍යානුකූලව දුප්පත් කෙනකුට රජයෙන් ඉඩමක් ලබා ගැනීම නම් කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා වාගෙයි. ඉඩම් ඉල්ලා ඉල්ලුම් පත්‍ර දැම්මට පස්සෙ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන්නෙ අවුරුද්දක් දෙකක් ගත වුණාට පසුවයි. ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම් දීමට සුදුසු 50 ක් පමණ තෝරා ගන්නව. ඊට පස්සෙ මිනින්දෝරුවන්ට කියනව ඒව මනින්නය කියා. නමුත් තවත් අවුරුදු දෙකක් පමණ යන තුරු මැනීම කෙරෙන්නෙ නැහැ. ඒ මොකද? මිනින්දෝරුවො නැතිකම නිසයි. අවුරුදු දෙක තුනකට පස්සෙ ඉඩම් මැනීමත් අවසන් කර ඉඩම් දෙන්න බැලුවම තෝරා නියම කර ගත් අය නොවෙයි ඒ ඉඩම්වල ඉන්නෙ. වෙනත් අය ගොස් ඒ ඉඩම් අල්ලාගෙන බලහත්කාරයෙන් පදිංචි වෙලා. ඊළඟට කරන්නෙ පෙත්සම් ලිවීමයි. ඔය කලබලය උඩ පෙත්සම් ගණනාවක් ලැබෙනව. මීට හේතු රාශියක් තිබෙනව. පළමුවෙනි හේතුව අවශ්‍ය වැඩ කටයුතු කලටවේලාවට කිරීම සඳහා නිලධාරීන් නැතිකමයි. දෙවැනි කාරණය ඉන්න අයට වුවද එහා මෙහා යාමට වාහන නැතිකමයි. ඒ පළාත්වල ගමන් කිරීම සඳහා ඒ නිලධාරීන්ට ජීප් රථ අවශ්‍යයි. සමහර විට එක නිලධාරියෙක් තම කාර්‍ය්‍ය අවසන් කර එනතුරු අනික් නිලධාරියා බලා ගෙන ඉන්න ඕනෑ. සමහර විට තිබෙන වාහනය ක්‍රියා විරහිත වූ විට එය අලුත්වැඩියා කරන තුරු මාස පහ හය බලාගෙන ඉන්න ඕනෑ. ඔය විධියට බලන විට සතුටුදායක අන්දමට ඉඩම් පිළිබඳ කටයුතු නිරවුල් කිරීමට බැරිව ඇත්තේ වාහන පිළිබඳ තත්ත්වයත් බොහෝ දුරට බාධකයක් වන නිසයි.

අ. භා. 5.45

තවත් කාරණයක්. සමහර නිලධාරීන් ගේ ගමන් ගාස්තු කපා දමා තිබෙනව. ඒ නිසා මේ වැඩ කටයුතු හුඟක් දුරට ප්‍රමාද වෙනව. මම පිළිගන්න හැටියට, අපේ පළාතේ මහජනතාවට ඇති වී තිබෙන විශාල සච්ටන රාශියක් ඉඩම් ඉක්මනින් බෙදා දීමෙන් නිරාකරණය කර ගන්නට පුළුවනි. එම නිසා දැනට කරනවාට වඩා ශීඝ්‍ර අන්දමින්, ක්‍රමානුකූල අන්දමින් මහ ජනතාවට ඉඩම් ලබා දීමට පහසුකම් සැළසිය යුතු බව මතක් කර සිටිනව. අර මුලින් සඳහන් කළා වාගේ ඇති වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. නිනායක මයා.]

තිබෙන තත්ත්වයේ හැටියට නම්, ඉඩමක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් දමා ඊට සතුටුදායක පිළිතුරු ලබා ගැනීමට අවුරුදු තුන හතරක් ගත වෙනව. ඒ විධියට කාලයක් තිස්සෙ බලාගෙන සිට ඉඩම ලබාගත්තට පසු එම ඉඩමෙ අයිතිවාසිකම ලබාගන්නට, ඒ ඉඩමෙ කවුරුන් හෝ ගිහින් බලහත්කාරයෙන් අල්ලා ගෙන සිටින නිසා පුළුවන්කමක් නැහැ. ඊළඟට මෙසේ බලහත්කාරයෙන් පදිංචිව සිටින අය අස් කිරීම සඳහා නඩු දමන්නට සිදු වෙනව. ඒ අනුව තීන්දුවක් ලබා ගන්නට පෙර නියෝගයක් යවනව ඒ නඩුව අස් කර ගන්න. මේ නිසා ඉඩම් කච්චේරියෙන් ඉඩම් දීම සඳහා තෝරා ගත් පුද්ගලයන්ට ඉඩම නොදී බලහත්කාරයෙන් පදිංචි වූවන්ට ඉඩම දෙන්න සිද්ධ වෙනව.

මෙවැනි සිද්ධීන් නිසා සට්ටන නිසා ඒ ප්‍රදේශවාසීන් තුළ විශාල කලකිරීමක් තිබෙනව, ඉඩම් බෙදා දීමේ ක්‍රමයෙහි ඇති දුර්වලකම් ගැන. මේ සියලු දෙයට ප්‍රධාන හේතුව නම් සෑහෙන ප්‍රමාණ නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වීමයි. ඊළඟ හේතුව සෑහෙන ප්‍රමාණයක් වාහන නොමැතිකමයි. යම් කෙනෙකු ඉඩමක් ඉල්ලුව ම ඒ ගැන ඉක්මනින් සොයා බලා, සැලකිය යුතු කාලසීමාවක් ඇතුළතදී එය නිරාකරණය කර දෙනවා නම් මේ විධියේ සට්ටන ඇති වෙන්නෙ නැහැ. මේ නිසා අද ඉඩම් ලැබිය යුතු තැනැත්තන් මෙන් ම ඉඩම් ලැබීමට නුසුදුසු තැනැත්තනුත් තමන්ට අභිමත හැටියට තමන්ට ඕනෑ ඉඩමක ඕනෑ තැන් වලින් එළි කරගෙන පදිංචි වී සිටිනව. නමුත් නීත්‍යනුකූල අන්දමට ඉඩමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත් යවා කටයුතු කරන්නට ගියොත් දීර්ඝ කාලයක් ගත වෙනවා පමණක් නොවෙයි, තමන් බලාපොරොත්තු වූ ඉඩම් කොටස ලැබෙන්නෙ නැහැ. එම නිසා ඉඩම් බෙදා දීමේ ක්‍රමය මෙයට වඩා ක්‍රමානුකූල අන්දමටත් මෙයට වඩා ඉක්මනටත් ක්‍රියාත්මක කරන්ට හැකි පිළිවෙළක් ළඟදීම යොදනවා නම් හොඳ බව මතක් කරනව. ඇත්ත වශයෙන් මගේ ප්‍රදේශයේ ජනතාවට මුහුණ පාන්නට වන කරදර අපමණයි. එහෙත් මා සඳහන් කළ ක්‍රම උපයෝගි කර ගන්නවා නම් මේ එකද ප්‍රශ්නයක්වත් මතු වෙන්නෙ නැහැ.

මේ සම්බන්ධයෙන් තවත් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනව. ඉඩම් බෙදා දුන්නාට පසු බලපත්‍ර ලබාගැනීමේ දුෂ්කරතාවයක් තිබෙනව. සාමාන්‍යයෙන් ඉඩම්වලට බලපත්‍ර දිය යුතුයි. නමුත් සමහරුන්ට ඉඩම් ලැබී අවුරුදු දෙක තුන නැති නම් හතර ගත වී තිබෙනවා බලපත්‍ර ලබා ගන්නට. මේ කාරණයට හේතුව ගැන මම පරීක්ෂා කර බලන විට මට පෙනී ගියා, මෙසේ වෙන්නෙ නිලධාරීන්ගේ හිඟ කම නිසා බව. ඒ කටයුතුවලට අවශ්‍ය තරම් නිලධාරීන් නැහැ. එම නිසා දිනෙන් දිනම ඒ වැඩ කටයුතු අතපසු වී යනව. කවුරුන් හෝ අඳුනන කෙනෙකුගේ මාර්ගයෙන් ගොස් මෙම කටයුත්ත ගැන උනන්දුවක් දැක්වුවොත් ඉක්මනින් ඉල්ලුම් බලපත්‍රය ලබා ගන්න පුළුවනි. එහෙම නැත්නම් අවුරුදු දෙකක් තුනක්, සමහර විට හතරක්, පසු වන තුරු ලබා ගන්නට අමාරුයි. මෙයට සම්පූර්ණ හේතුව සෑහෙන පමණ නිලධාරීන් ඒ ඒ ස්ථානවල නොමැතිකමයි.

තවත් එක් කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ ගෙවල් හදා ගැනීමට ආධාර මුදලක් රජයෙන් දෙනවාය කියා ගම්වාසීන්ට කිව. සමහර අය රජයේ සැලැස්මවල් අනුව ඒ ගෙවල් හදනව. නමුත් ඒවාට ආධාර මුදල් ලබාගැනීම මහ උග්‍ර ප්‍රශ්නයක් වී තිබෙනව. සමහර උදවිය ලියුම් ගණනාවක් ලියාවත් පිළිතුරක් ලැබී නැහැ. සමහරුන්ට ලැබී ඇති පිළිතුරු නම්, මේවාට දීමට මුදල් නොමැත, කියායි. මේ නිසා ආධාර මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් වීමට බොහෝ උදවිය අධෛර්යමත් වී සිටිනව.

අපේ කැලෑවලට කර තිබෙන බලවත් අපරාධය ගැනත් මේ අවස්ථාවෙ සඳහන් කරන්නට ඕනෑ. අපේ ගම්වාසීන්ගේ ජීවිකාව සෑහෙන තත්ත්වයකින් ගෙන යාමට කැලෑ තරමක් දුරට අවශ්‍යයි. නමුත් අද ඒ ප්‍රදේශයේ කැලෑ සම්පූර්ණයෙන්ම වාගේ විනාශ කර තිබෙන බව මා ඉතා කනගාටුවෙන් මේ සභාවේදී මතක් කර සිටිනව. ඒ කැලෑ කවුරුන් විසින් විනාශ කර තිබෙනවාදැයි කියන්නට දන්නෙ නැහැ. මෙපමණ කල් දිසාපති තුමාගේ [illegible] යටතේ තිබුණු කැලෑ විනාශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර කර සිටිය. ඒවායේ තිබුණු වටිනා ගස් කපා දමන්නෙ කවුද, කවුරුන් විසින් ඒවා අදිනවාද කියා කියන්නට කවුරුන්වත් දන්නෙ නැහැ. ඇන් දිසාපති තුමාගේ පාලනය යටතේ තිබුණු ඉඩම් ඉවර වී කැලෑ දෙපාර්තමේන්තුව යටතේ තිබෙන ඉඩම්වලටත් ඔය අන්දමටම බලපෑම් කරන්නට පටන්ගෙන තිබෙනව.

සමහර විට පවුල් ගණන් ගිහින් පදිංචි වෙනවා. සමහරු ලොරි ගණන් ගස් කපා ගෙන නිදල්ලේම පටවාගෙන යනව. මෙය මහා පුදුම අපරාධයක්. මහා විනාශ යක්. අපේ කැලෑවලට කර තිබෙන්නේ බරපතළ අපරාධයක් ; විශාල මුදල් නාස් තියක්. පසුගිය රාජාසන කථාවේ කියා තිබෙනවා, අපේ වන සම්පත කොපමණද කියා ගණන් බැලීම සඳහා කාරක සභාවක් පත් කරනවාය කියා. එම කාරක සභාවේ නම, වන සම්පත කොපමණද කියා සොයා බැලීමේ කාරක සභාව නොව, වන සම්පත කෙයි තරම් දුරට විනාශ වී තිබෙනවාද කියා සොයා බැලීමේ කාරක සභාව කියා දැම්මා නම් හොඳයි. පසු ගිය අවුරුදු 7, 8 තුළ කරන ලද විනාශයේ තරම මෙපමණ යයි වචන වලින් කීමට පවා අපහසුයි.

මේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින සියලුම අය ඉඩම් ලැබීමට නුසුදුසු අයයයි කියන්න බැහැ. ඉඩම් ලැබීමට සුදුසු අයත් ඔවුන් අතර සිටිනවා. කිසිත් ඉඩකඩමක් නැති, ජීවන මාර්ගයක් නැති අය සිටිනවා. ඔවුන්ට වෙන කර කියා ගන්නට දෙයක් නැති නිසා මේ ඉඩම් අල්ලාගෙන සිටිනව. නමුත් මේ ඉඩම් අල්ලාගෙන සිටීමට නුසුදුසු අයත් සිටිනවා. ඒ නිසා වහාම මේ පිළිබඳව සොයා බලා සුදුසු වැඩ පිළිවෙලක් යොදන ලෙස මම ඉල්ලා සිටිනවා. බලහත්කාරයෙන් ඉඩම් අල්ලාගෙන සිටින අයගෙන් ඉඩම් ලැබීමට සුදුසු අයට ඉඩම් කොටස් නිරවුල් කර දී සුදුසු වැඩ පිළිවෙලක් යෙදීම අත්‍යවශ්‍ය යෙන්ම කළ යුත්තක්.

අපේ පළාත්වල පාරම්පරිකව පැවත එන ගොවීන් සිටිනවා, වී නිෂ්පාදනය පිළි බඳව හොඳ දැනීමක්, අවබෝධයක්, වුව මනාවක් ඇති අය. වී නිෂ්පාදනය වැඩි කිරී මට රජය බලාපොරොත්තු වෙනවා නම් ඒ ගොවීන්ට වුවමනා සියලුම පහසුකම් දිය යුතුයි. ඔවුන්ට ඇති බාධකයන් රාශියක් ම මම විස්තර කළා. ඔවුන්ට ඇති ප්‍රධානම් බාධකය නම් ගොවිතැන් කිරීමට අවශ්‍ය ජලය නොමැති වීමයි. අවුරුද්දේ දෙකන් නටම වැඩ කිරීම සඳහා ජලය නොලැබී මයි. ඒ නිසා රජය ඔවුන්ට ඒ පහසුකම් සලසා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
(திரு. எல். டி. எஸ். ஏ. குணசேக்கர)
(Mr. L. de S. A. Gunasekera)

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය යටතේ මටත් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මම පළමුවෙන්ම කියන්නට අදහස් කරන්නේ මා නියෝජනය කරන කොට්ඨාශයේ ඇති අඩුපාඩු රාශියක් ගැනයි. මගේ කොට්ඨාශයේ තිබෙන දෙල් ගොඩ ව්‍යාපාරය දැනට අවුරුදු 6 කට උඩ දීයි, ආරම්භ කළේ. එහි පළමුවන, දෙවන, තුන්වන හා හතරවන යන පියවර හත රෙන් තුන් වන පියවර කොහේද කියා මම දන්නේ නැහැ. දෙවන පියවරේ සිට හතර වන පියවර දක්වා ගිහින් තිබෙනවා. දෙවන පියවරේ සිට හතරවන පියවර දක්වා හැතැප්ම 8 ක් තිබෙනවා. මේ හතරවන පියවර යන මාර්ගයේ තිබෙන් නේ පෞද්ගලික ඉඩම්හිමියකුගේ වතුයි. ඒ හැතැප්ම 8 කපා නතර කර දන් අවු රුදු තුනක් වෙනවා. ඒ පාර කපා තිබෙන්නේ හතර වන පියවරට නො වෙයි ; මගේ කල්පනාවේ හැටියට වතු හිමියන් උදෙසායි. 4 වැනි පියවරට අද හැතැප්ම 8 ක් පාර කපා ලක්ෂ ගණනක් රජයෙන් වියදම් කළත්, අද එහි සිටින මහජනයාට යන්නට සිදු වී තිබෙන්නේ පාරක් නැතිව පයින්. ඒ හැතැප්ම 8 න් හැතැප්ම දෙකක් පමණයි වාහනයකින් යන්නට පුළුවන්කම තිබෙන්නෙ. දැනට අවුරුදු 3 ක් තිස්සේ වැඩ කළත්, 3 වැනි 4 වැනි, 5 වැනි 6 වෙනි, 7 වෙනි හා 8 වෙනි සැතැප්මවල බෝක්කු සාදා නැහැ ; පාර සකස් කර නැහැ. මා කීප වරක්ම ඉඩම් කොමසාරිස්තුමාටත්, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමාටත් මේ ගැන දැනුම් දුන්නා. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තුමා කියනවා, කොමසාරිස්තුමා දන්වා



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]
නැහැ, කියා. කොමසාරිස්තුමා කියනවා, මෙය ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකතුමාගේ වැඩක්ය කියා. අද ඔය දෙපාර්තමේන්තු දෙකේ වැඩ කෙරෙන්නෙ මේ විධියටයි.

ගරු ඇමතිතුමා දැන් මෙතන නැතත්, පාර්ලිමේන්තු ලේකම්තුමා සිටිනවා. එතුමා ඔය මා සඳහන් කළ 4 වැනි පියවර ට ගියා. පාර්ලිමේන්තු ලේකම්තුමා එහි ගිය අවස්ථාවේදීත් එතුමා නියෝග කළා, නමුත් අද වන තුරු එය ඉටු වී නැහැ. මේ ව්‍යාපාරය මගින් අක්කර දහසකට අධික ගණනක් මහජනයාට බෙදා දී තිබෙනවා. එමෙන්ම ඒ ව්‍යාපාරය සම්බන්ධව ගරු ඇමතිතුමාටත්, රජයටත්, ඒ නිලධාරි මහත්වරුන්ටත් ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ඒ ව්‍යාපාරයේ සිටින ජනයාට අද මසකට රුපියල් 200ටත් 300 ටත් අතර ගණනක් උපයා ගන්නට පුළුවන් වී තිබෙනවා. එමෙන්ම මහ රජයටත් මේ තේ විකිණීමෙන් විදේශීය ධනය වශයෙන් විශාල මුදලක් ලැබෙනවා. එමෙන්ම මේ ව්‍යාපාරයේ කට්ටිකරුවකු වෙනුවෙන් රජය වියදම් කරන මුළු මුදලම අවුරුදු 7 ක් යන්නට කලින් රජයට ලැබෙනවා. ඒ ව්‍යාපාරයට අවශ්‍ය කරන මුළු මුදලම අවුරුදු 7 කින් ආපසු ලැබෙනවා. ඇමතිතුමාටත් නිලධාරි මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වන්නේ ඒ නිසයි. මේකයි තේ ව්‍යාපාරවල වටිනාකම. තේ ව්‍යාපාරවලින් විදේශීය ධනය ලැබෙනවා. එසේ වුවත් හැම අවස්ථාවකම ව්‍යාපාරවල වැඩ කෙරෙන්නෙ කඩාකප්පල්කාරී විධියට වගේ බවයි මට පෙනෙන්නෙ. මේ 4 වැනි පියවර සඳහා ලක්ෂ ගණනකින් හැතැප්ම 8ක පාරක් කපලත් එහි නිලධාරියාට තවමත් ගෙයක් හදා නැහැ. එමෙන්ම එහි සිටින ජනතාවටත් තවම ගෙවල් හදාදී නැහැ. නමුත් කාලය අවුරුදු 8ක් වෙනවා. ඒ කට්ටිකරුවන්ට ගෙවල් නැහැ. තාවකාලික නවාතැන්වලයි ජීවත් වෙන්නෙ. හය මාසයෙන් හය මාසයට රුපියල් 80 ගණනේ ගෙවල් අළුත්වැඩියා කර ගන්න මුදල් දෙනවා. මෙයින් කට්ටිකරුවන්ටත් කරදරේ; ආණ්ඩුවටත් කරදරේ. මාස හයෙන් හයට රුපියල් 80 ගණනේ දෙන නිසා ආණ්ඩුවටත් කරදරේ. එමෙන්ම ඒ ජනපද නිලධාරියාට සිටින්න ගෙයක් නැහැ. ඔහුට එන්නට සිදුවී තිබෙන්නේ හැතැප්ම 10ක් හෝ 12 ක් ඈත සිටයි. එවැනි කෙනෙකුගෙන් බලාපොරොත්තු විය හැක්කේ මොන විධියේ සේවයක්ද? ජනපද නිලධාරියාට හැතැප්ම 10 ක් නැත්නම් 12ක් ඈත සිට පයින්ම ජනපදයට යන්න පුළුවන්කම තිබෙනවාද? ඒ නිසා ඉඩම් කොමසාරිස්තුමාගේ අංශයෙන් හෝ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකතුමාගේ අංශයෙන් හෝ ඔය අංශ දෙකින් කොයි අංශයකින් හෝ හැකි තරම් ඉක්මනින් වාහනයක් යන්නට පුළුවන් විධියට පාරත් ඒ ගොඩනැගිලි ටිකත් වහාම ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6

දෙල්ගොඩ තේ කම්හල ගැන නිවිතිගල ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.) පළමුවෙන් මතක් කළා. දෙල්ගොඩට තේ කම්හල කොහොම ගියාදැයි සැක බව එතුමාගෙන් කිය වුණා. දෙල්ගොඩට තේ කම්හල ගියේ වෙන කිසිවක් නිසා නොවෙයි; එහි අක්කර ගණනත් කට්ටිකරුවන් ගණනත් වැඩි නිසයි. මඩලගම අක්කර සිය ගණනක් නැත්නම් දෙසිය ගණනක් පමණයි තිබෙන්නෙ. දෙල්ගොඩ අක්කර දහසකට වැඩිය තිබෙනව. අක්කර දාහකට වැඩි ප්‍රමාණයක තේ දළු කැඩෙන නිසා තේ කම්හල එහාට ගියා. එතුමාගෙන් කියවුණා, දෙල්ගොඩ තේවල මිළ අඩුය, අන්දාන වත්තේ තේවල මිළ වැඩිය කියා. මෙරට තේ මිළ සම්බන්ධයෙන් ඊයේ "ඊව්නිං ටයිම්ස්" පත්‍රයේ පළ වී තිබෙන්නෙ මෙහෙමයි; අන්දාන වත්තෙ තේ රාත්තල් 7,780 ක් විකිණී තිබෙන්නෙ රාත්තල සත 83 ගණනෙයි. ඒ වගේම දැරංගල තේ රාත්තල් 9,648ක් රාත්තල රු. 1.05 ගණනෙත්, තවත් රාත්තල් 6,970ක් රු. 1.08 ගණනෙත්, තවත් රාත්තල් 1,791 ක් ශත 84 ගණනෙත්, තවත් රාත්තල් 1,944ක් රු. 1.30 ගණනෙත් විකිණී තිබෙනව. දෙල්ගොඩ තේවල මිළ රාත්තලක් රු. 1.68යි. මා ඒ ගැන පුදුමයට පත් වුණා. අන්දාන වත්ත සුද්දන්ට අයිති එකක්. ටික දෙනකු හැර එහි කට්ටිකරුවන්වත් කැමති නැහැ, තේ කම්හල දෙල්ගොඩට නොදී පෞද්ගලික වත්තකට දෙනවට. ඒ වත්තෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තේ රාත්තලකට රුපියල් 2.50ක සාමාන්‍ය මිළක් ලැබුණා නම්—එතුමාගෙන් කිය වුණා, ඒ කම්කරුවන්ට තේ රාත්තලකට ලැබුණු වැඩිම මිළ සත 25ක් බව—කට්ටිකරුවන්ට ලැබී තිබෙන්නෙ ඉතා අඩුමිළක්. කට්ටිකරුවන්ට ලැබී තිබෙන්නෙ දහයෙන් පංගුවයි. අඩු ගණනේ සත 50ක් වත් ගෙවිය යුතුව තිබෙද්දී ලැබී තිබෙන්නෙ සත 25යි. එයින් ලාභ ගෙන තිබෙන්නෙ කට්ටිකරුවන් නොවෙයි; වතු සුද්දන්; ඉඩම් හිමියන්. නිවිතිගල මඩලගමට තේ කම්හලක් දීම ගැන මා විරුද්ධ නැහැ. මඩලගමටත් තේ කම්හලක් අවශ්‍යයි. එහෙත් විශේෂයෙන් දෙල්ගොඩට තේ කම්හලක් ලැබුණේ ඒ ප්‍රදේශයේ තේ අක්කර ප්‍රමාණය වැඩි නිසාත්, ඒ වගේම කැඩෙන තේ දළු රාත්තල් ගණන වැඩි නිසාත් බව මතක් කළ යුතුයි. රත්නපුර දිස්ත්‍රික්කයේම වැඩිපුර තේ කැඩෙන්නෙ දෙල්ගොඩ ප්‍රදේශයේයි. දෙල්ගොඩ තේ කර්මාන්තශාලාවේ පිහිටීම ගැනත් යමක් කියන්ට ඕනෑ. තේ කම්හල ඒ ස්ථානයේ හදන්ට යෝජනා කළේ කොයි ඉන්ජිනේරු මහත්මයාදැයි මා නම් දන්නෙ නැහැ. එතැන හොඳයි කියා යෝජනා කරන්ට එක්කෙනෙක් ඉඳල තිබෙනව. ඔහු හැර වෙන කිසිම කෙනෙක් දැන් ඒ තේ කම්හල පිහිටුවා තිබෙන ස්ථානයේ එය ගොඩනඟන්ට කැමති වුණාය කියා මා හිතන්නෙ නැහැ. එතරම් අයෝග්‍ය තැනකයි, ඒ තේ කම්හල පිහිටුවන්ට අනුමත කර තිබෙන්නෙ. නමුත් මා එදා ඇසුව මොන හේතුවක් නිසා මේ තේ කම්හල මේ ස්ථානයේ ඉදි කරනවාද කියා. කොමසාරිස්වරයා එදා කියා සිටියා, අපි මේ තේ කම්හල මේ ස්ථානයේ ඉදි කරන්නෙ වතුර ගැනීමේ පහසුකම් උඩය, ඒ වාගේම ජල බලයෙන් වැඩ කිරීමටත් අප බලාපොරොත්තු වන නිසාය කියා. ඒ නිසා, විශේෂයෙන්ම ජල බලයෙන් වැඩ කරන්ට බලාපොරොත්තු වන නිසා මේ ස්ථානය යෝග්‍ය වේයයි මා කල්පනා කළා.

අ. භා. 6.4

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Order, please! Mr. Speaker will now take the Chair.

අනතුරුව ආර්. එස්. වී. පෝලියර් මහතා, සී.බී.ඊ., මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායක තුමා මූලාසනාරූඪ විය.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கா)*
(Mr. L. de S. A. Gunasekera)

ජල බලය ලබා ගැනීමේ බලාපොරොත්තුව උඩ මා එදා කැමති වුණා. තේ කම්හල ඉදි කළා. නමුත් තවමත් ජල බලයෙන් එතන වැඩ කෙරෙන්නෙ නැහැ. ඒ වාගේම බලාපොරොත්තු වූ වතුර ලැබෙන්නෙත් නැහැ. කම්හල වැඩ කරන්නෙ ඩීසල් තෙල්වලින්.

ඊළඟට තේ කම්හල පාලනය කරන මහත්මයාට නැත්නම් අධිකාරීට නිවාසයක් අවශ්‍යයි. ඒ වාගේම ඒ කම්හලේ වැඩ කරන ඉංජිනේරුවරුන්ට හා වෙනත් කම්කරුවන්ටත් නිවාස අවශ්‍යයි. එදා මා කොමසාරිස්තුමාගෙන් ඇසුව කෝ මේ සේවකයන්ට නිවාස කියා. අන්න එතකොටයි කොමසාරිස්තුමාට නිවාස ගැන මතක් වුණේ. ඒ වන විට තේ කම්හලේ කොන්ත්‍රාත්තුව කලම්බු කොමර්ෂල් සමාගමට භාර දී වැඩ නිම කරමිනුයි තිබුණේ. කම්හලේ කොන්ත්‍රාත්තුව දෙන අවස්ථාවේදීම සේවකයන් සඳහා අවශ්‍ය ගොඩනැගිලිත් ඉදි කළ යුතුය කියා කිව්ව නම් අඩු මුදලකින් ඒවා කරගන්න තිබුණා. නමුත් පසුව, මේ මේ ගොඩනැගිලි ඉදි කළ යුතුය, ඒවා සඳහා අප මේ තරම් ගණනක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවාය කියා කිව්ව. ඒ අවස්ථාවේදී කලම්බු කොමර්ෂල් සමාගම කිව්ව, මීට වඩා රුපියල් 20,000ක් වුවමනාය කියා. ඊට පසු රුපියල් 20,000ක් දෙන්න බැරිය කියා තාවකාලික ගොඩනැගිලි හරිගැස්සුව. ඒ තාවකාලික ගොඩනැගිලිවලට ගිය වියදම රුපියල් 1,00,000කට කිට්ටු වුණා. තාවකාලික ගොඩනැගිලි තබා ගෙන දැන් ස්ථිර ගොඩනැගිලි හරිගස්සනව. ඒ වාගේම තාවකාලික ගොඩනැගිලිවලටත් තවත් කෑලි මූට්ටු කරනව. මෙන්න මේ විධියටයි රජයේ මුදල් විනාශ වෙන්නෙ. මුල් අවස්ථාවේදීම, ප්ලෑනක් අනුව මේ ගොඩනැගිලි ඉදි කිරීමත් කොන්ත්‍රාත්තුවටම ඇතුළත් කර තිබුණා නම්, වුවමනා කරන සෑම අංශයක්ම ඒ කොන්ත්‍රාත්තුවට ඇතුළත් කර තිබුණා නම්, අඩු වියදමකින් මේ ගොඩනැගිලි ඉදි කරවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

ගන්න තිබුණා. එසේ කළා නම් කම්හලේ වැඩත් මීට වඩා සාර්ථක අන්දමින් කෙරෙනව. දැන් තාවකාලික ගොඩනැගිලි වලටයි, ස්ථිර ගොඩනැගිලිවලටයි කියා රජයේ මුදල් නාස්ති වෙනව.

ඊළඟට ඉස්සෙල්ලම අධිකාරිවරයෙක් මේ තේ කම්හලට පත් කළා. ඒ මහත්මයා දෙමළ ජාතිකයෙක්. නමුත් මේ ජනපදයෙ එක්කෙනෙක්වත් දෙමළ දන්නෙ නැහැ. මා විරුද්ධ වුණාම ඒ මහත්මයා වෙන ස්ථානයකට මාරු කළා. ඊටපසු දෙවන වරට අමරසිංහ කියා මහත්මයෙක් පත් කළා පස්සෙ දැනගන්න ලැබුණා, ඔහු ක්ලැරන්ස් අමරසිංහද කවුද කියන ඡේක්ස්වාගන් ඒජන්තවරයගෙ නෑදෑයකු බව. එම පත්වීමටත් මා විරුද්ධ බව කීව. මොහු මීට පෙර කොයි වත්තෙද සේවය කර තියෙන්නෙ කියා මා ප්‍රශ්න කෙරුව. අවුරුදු 6ක් එක්තරා වත්තක වැඩ කළ බවට කවුද තෝන කෙනෙකුගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කළා. ඒ ගැන සොයා බැලුව, එම වත්ත පාලනය කරන කොම්පැනියෙන් : ඒ කොම්පැනියෙ අධ්‍යක්ෂක මහත්වරු කියා සිටිය, කවදාවත් එම වත්තෙ එහෙම කෙනෙක් සිටියෙ නැත කියා. පස්සෙ කරුණු සොයා ගෙන යන විට අපට දැන ගන්න ලැබුණ ඉඩමෙ හවුලක් තියෙන තෝන කෙනෙකුගෙන් ලිපියක් ගෙනාවිත් ඉදිරිපත් කර තිබෙන බව .ඊට පස්සෙ තවත් කෙනෙක් පත් කළා. ඔය විධියටයි, කටයුතු සිදු වූයෙ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

පස්සා දොරෙන්.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

ඔව්. හිටපු අධිකාරිට විරුද්ධව නොයෙකුත් චෝදනා ආව. ඒ චෝදනා විභාග කිරීමට රාජ්‍ය මණ්ඩලයෙ අධ්‍යක්ෂකවරුන් කීප අවස්ථාවකම පැමිණියා. සභාපතිතුමාගෙ බලපෑම් උඩ එම අධ්‍යක්ෂවරුන් ගෙනා චෝදනා ඇතුළත් ලියවිලි පවා වෙනස් වී ගියා. එක් අධ්‍යක්ෂවරයෙක් එක අවස්ථාවකදි රත්නපුර තානායමේ ඉඳගෙන ඒ අධිකාරිට විරුද්ධ චෝදනා අනික් අධ්‍යක්ෂවරයත් සමග සටහන් කෙරුව. මෙහාට ඇවිත් බැලුවාම ඒව සේරම වෙනස් වෙලා. අධිකාරිට පක්ෂවයි, ඒව ලියවී තිබුණෙ. පස්සෙ දැනගන්න ලැබුණ හිටපු සභාපතිතුමාගෙ බලපෑම් උඩ එසේ කරන්න යෙදුණාය කියා. මෙම කරුණු මා සඳහන් කරන්නෙ, දෙල්ගොඩ ජනපද වාසීන්ට නොයෙකුත් අවස්ථාවලදි නානා අන්දමේ කරදර හිරිහැරවලට මුහුණ පාන්න සිදු වූ නිසයි.

දෙල්ගොඩ තේ කම්හලෙත්, ඒ වගේම ජනපදයෙත් වැඩ වර්ජනයක් ඇති වුණා. ඒ අවස්ථාවෙ තේ දළුත් නොදී සිටිය. එම වර්ජනය දින 10 ක් පමණ පැවතුණා. ඒ පිළිබඳව සතුටුදායක සහනයක් තවම සැලසුනේ නැහැ. අද නම් දැනගන්න ලැබී තිබෙනව දැන් සිටින අධිකාරි තැන මාරු කර වෙනත් අධිකාරිවරයකු පත් කරන්න යනවය කියා. අපේ පැරණි ගැමි කියමනක් මේ අවස්ථාවෙ මට සිහිපත් වෙනව. "කොටිය මේ කන්දෙ ඉඳල අනික් කන්දට ගියාට උගෙ තිත් මාරු වෙන්නෙ නැහැ" කියන කියමනයි, ඒ. වැරදි කරන කෙනෙක් එක තේ කම්හලක ඉඳල තවත් තේ කම්හලකට ගියාට, කොටියගෙ තිත් මාරු නොවෙනව වාගෙ, ඔහුගෙ වැඩ කටයුතුවල වෙනසක් වන්නෙ නැහැ. වැරදි කරන අයට සුදුසු දඬුවම් දෙන්න ඕනැ.

තවත් කරුණක් කියන්න තිබෙනව. රත්නපුර කච්චේරියෙ සේරසිංහ නමැති එස්. එල්. ඕ. කෙනෙක් හිටිය. ඔහු කලවාන කොට්ඨාශයෙ එස්. එල්. ඕ. වශයෙන් මාරු කළා. නමුත් එයාට එම පත්වීම භාර ගන්න බැහැ කීව. ඒ පාර ඔහුව කොළොන්නට දැම්ම. කොළඹ කන්තෝරුවෙ ඔහු හඳුනන අය සිටිනව. මා සිතනව ඔහු සේරසිංහ නමැති පාදිලි තුමාගෙ නෑදෑයෙක්ය කියා. කොහොම වුණත් අඳුනන අය හමු වෙලා මාරුවක් කර ගත්ත. ඒජන්ත තුමාගෙ බලපෑම් උඩ මේව කෙරෙනව කියා පත්‍රයෙත් දැම්ම. පස්සෙ කොමසාරිස්තුමා ඔහුගෙ වැඩ නතර කළා. "ඉන්ටර්ඩික්ට්" කිරීමක් නොවෙයි;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩට නොපැමිණ සිටි නිසා "වැකේටඩ් ද පෝස්ට්" යනුවෙන් වැඩ නතර කිරීමක් කළ බවයි, පෙනෙන්නෙ. නමුත් ටික දිනක් යන විට ඒජන්තතුමාත් නොදැනුවත්ව ඔහුට පඩි—ඇඩ්වාන්ස්—ගෙවා තිබෙනව. කොහොමද පඩි ගත්තෙ කියා ප්‍රශ්නයක් පැන නැංග. ඒ පාර ගාල්ලට පත්වීමක් දීල යැව්ව. වරද කරන මිනිහට එහෙමයි සලකන්නෙ. තමන්ගෙ ස්වාමිය වන ඒජන්තතුමාට ඔහු කියා තිබෙනව "බොකු බඩවැල් එළියට එන්න පයින් ගහනව" යනුවෙන්. ඒ විධියට කී පුද්ගල යයි, පත්වීමක් දී ගාල්ලට මාරු කර යැව්වෙ. ඒ ගැන විභාගයක් නැහැ.

අ. භා. 6.15

අයගම ව්‍යාපාරය තිබෙන්නෙ මගේ කොට්ඨාශයේ. උස්බිම් ජනපදය ආරම්භ කිරීමට මුලින්ම කියා සිටියෙ 1960 අගෝස්තු 3 වැනිද. ඒ සඳහා ඒ අවුරුද්දෙම අනුමැතිය ලැබුණා. දැන් අවුරුදු හතරක්ම ගෙවී ගොස් තිබෙන නමුත් තවමත් ඒ උස්බිම් ජනපදයෙ ඉඩම් කට්ටි බෙදා දී තිබෙන්නෙ ගොවීන් 120 දෙනකුටයි. 120 දෙනාට ඉඩම් දීලා කැලෑ දෙපාර්තමේන්තුව භාර දුන්නා, ලී කපා ගන්නෙයි කියල. අවුරුදු දෙකක් තිස්සෙ ලී කොන්ත්‍රාත්තුව පස් දෙනෙකුට දී තිබෙනව ආණ්ඩුවේ ලී කපා ගන්න කියා. අවුරුදු දෙකකට පස් දෙනෙක්ම ආණ්ඩුවට දීලා තියෙන්නෙ ලී ලොරි හතරයි. කැලෑ දෙපාර්තමේන්තුව කොයි තරම් දක්ෂ ලෙසත් සාර්ථක අන්දමිනුත් වැඩ කරනවද යන්න එයින් පෙනී යනව. අවුරුදු දෙකක් යන තුරු බැරි වුණා ඒ කට්ටිවල ගොවීන් 120 දෙනාට වුවමනා කරන අක්කර 250 හේ තිබෙන ලී ටික අයින් කර ගන්න. ඊට පස්සෙ ඉල්ලා සිටියා ගොවීන්ට මේ ඉඩම් කට්ටි ටික දෙන්නෙයි කියල. ඒ අයට ඉඩම් දීලා කැලෑ කොටලා, ගිනි තිබ්බටත් පස්සෙ කැලෑ දෙපාර්තමේන්තුව නැවත වරක් කියනව, ගිනි තියන්න දෙන්න බැහැ, ලී අපට ගන්න ඕනෑ, කියල. පුච්චපු ලී තොගය රුපියල් හත් දාස් ගණනකට වෙන්දේසියෙ වික්කා. අවුරුදු දෙකක් ගත වුණා ඉඩම් දීලත්. ඉඩම් පුච්චලත් ඉවරයි. මිනිස්සු ඉඩම් කට්ටිවලට ගිහිල්ලත් ඉවරයි. එහෙත් තවමත් ඉඩම් කොමසාරිස් වරයා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට දන්වලා නැහැ, මෙහෙම ව්‍යාපාරයක් අයගම තිබෙනවය, ඊට පාරක් සකස් කර දෙන්නය කියල.

එදා කොමසාරිස්තුමාට මම කිව්වා, ව්‍යාපාරයක් අලුතින් පටන් ගන්න ඉස්සර වෙලා වුවමනා කරන්නෙ එතනට යන්න පාර හදන එකයි කියල. ඇයි පාර නැත්තෙ ? එතකොට කොමසාරිස්තුමා කෑ ගහන්න එපා කියල රුපියල් පණස් දහක් ඒ අවුරුද්දෙ මුදල්වලින් දුන්නා. එන අවුරුද්දෙ මුදල්වලින් දෙන්නම් තවත්, කිව්වා. මගේ "වෝට්" එකෙන්ම තව රුපියල් 50,000 ක් දෙන්නම් කිව්වා. මුදලක් වෙන් කළේ ඒජන්තතුමාට. දැන් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමා කියනව, මේක කෙරෙන්නෙ ඉඩම් කොමසාරිස්තුමා කීවොත් පමණයි කියල. ඒ නිසා මට දැන් ගන්න බැහැ, කියනව. ඉඩම් කොමසාරිස්තුමාගෙන් ඇහුවම එතුමා කියනව, මේක මට නැහැ, මේක ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කෙරෙන්න ඕනෑ කියල. ඒ සම්බන්ධයෙන් මට ලියමනක පිටපතක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙ කාර්යාලයෙන් ලැබුණා. මෙන්න ඒ ලියමන මා දැන් කියවනව :

"වැඩ 24/36(71) 1

ඉ. වාරි/වි./ලේ.

**අයගම ව්‍යාපාරය**

ඔබගේ අංක සී. බී. 302/64 හා 64.4.2 දින සටහන හා කලවාන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ 64.3.25 දින ලිපිය හා බැඳේ.

අයගම, පල්ලේ කැලේ ගවරගිරිය පාරේ වැඩ මෙතෙක් කර ඇත්තේ රත්නපුර දිසාපති විසිනි. එබැවින් එහි ඇති ඉතිරි වැඩද නිම කළ යුත්තේ ඔහු විසින්මය."

ඉතින් මේ කටයුත්ත සඳහා මුදල් වෙන් කර තිබෙනවාදැයි දැන ගන්න කැමතියි. මේ විධියට ගියොත් මෙහි වැඩ කෙරෙන්නෙ කොහොමද ? මහජනයා අතරමං වන විධියට වැඩ කිරීම සුදුසුද ? මෙහෙම වෙන්න ගියොත් මහජනයාගෙන් අපටත් ගරු ඇමතිතුමාටත් දෝෂාරෝපණය එල්ලවෙනව. මහජනයාගෙන් අපට එරෙහිව


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

දෝෂාරෝපණය එල්ලවන විධියටයි කොමසාරිස්තුමා වැඩ කර තිබෙන්නෙ. වහාම වැඩ පිළිවෙළක් යොදන්නෙයි කියල කොමසාරිස්තුමාට කිව්වම මට කියනව කච්චේරියෙන් එවා නැහැ, කියල, අවුරුදු හතරක් ගත වෙලත් තවම පාරක් නැහැ.

ඊළඟට මෙසේ කියා තිබෙනවා :

"මේ ව්‍යාපාරයට බඩු ප්‍රවාහණය කිරීම දුෂ්කර බැවින් දැනට වුවමනා ජනපද නිලධාරි නිවාසය හා ඕ. එල්. ඩී. ඕ. නිවාසය පමණක් සෑදීමට කටයුතු යොදා ඇත. මෙම ගොඩනැගිල්ල අවශ්‍ය නම් එය තැනිය හැක්කේ බඩු ගෙන යෑමට අවශ්‍ය අත් දමට පාර නිම කළායින් පසුවය. එසේ නොමැතිව පොදු ගොඩනැගිලි තැනීම ආරම්භ කළහොත් ප්‍රවාහණ දුෂ්කරතාවය නිසා වැඩිපුර මුදල් වැය කිරීමට සිදුවේ."

ගරු සභාපතිතුමනි, කච්චේරියෙන් මේ පාර කපන්න ගියොත් සමහර විට අවුරුදු 20 කටත් වඩා කල් ගත වෙන්න පුළුවනි. එම නිසා මේ පාරේ වැඩ වහාම කරන ලෙසට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනට නියෝගයක් දෙන සේ මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ වැඩේ සඳහා සල්ලි නැතැයි කියන්නට එපා. අලුත් වැඩ සඳහා මුදල් දිය යුත්තේ කෙරී ගෙන යන වැඩ සඳහා මුදල් දීමෙන් පසුවයි. ඇමතිතුමාගෙන් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හෝ කෙරී තිබෙන වැරදිවලට ඒ ප්‍රදේශයේ මහජනයා පලි නැහැ. එම නිසා ඉක්මනින්ම මේ පාරේ වැඩ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කරන හැටියට ඉල්ලා සිටිනවා. තවත් කාරණයක් කියන්න තිබෙනවා. මේ පාරේ වැඩ කොන්ත්‍රාත් දෙන්න සිදු වී තිබෙනවා යයි ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතුමා කියා ඇති අතර කොන්ත්‍රාත් දීම සඳහා කොන්ත්‍රාත්කාරයකුද සොයා දෙන ලෙස මන්ත්‍රීවරයාගෙන් ඉල්ලා තිබෙනවා. දෙපාර්තමේන්තු නිලධාරීන්ට වුවමනා වී තිබෙන්නේ මන්ත්‍රීවරුන් කොන්ත්‍රාත්කාරයන් වශයෙනුත්, පියුන්ලා වශයෙනුත් වැඩ කරනවා දකින්නටයි. අයගම උස්බිම් ජනපදය ගැන නොයෙක් අවස්ථාවලදී කරුණු ඉදිරිපත් කිරීම සඳහා පයිල් කිහිලි ගන්නාගෙන ඉඩම් සංවර්ධන කොමසාරිස්වරය ළඟටත්, ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ළඟටත්, ඒ වගේම අධ්‍යක්ෂවරයා ළඟටත්, ලිපිකරුවන් ළඟටත් යන්නට සිදු වී තිබෙනවා. මේ විධියට පයිල් උස්සාගෙන පියුන්ලා මෙන් කාර්යාලයක් කාර්යාලයක් ගාණේ යන්නටද මන්ත්‍රීවරුන් ඉන්නේ ? නමුත් එසේ කළත් වුවමනා වැඩ ටික කෙරෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, රාජ්‍ය වැවිලි මණ්ඩලය මගින් මා නියෝජනය කරන කොට්ඨාශයේ බඹරකොටුව ව්‍යාපාරය නමින් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා පාරක් ලකුණු කළා. මේ පාර ලකුණු කෙළේ රාජ්‍ය වැවිලි මණ්ඩලය මගින් අක්කර 1000 ක ප්‍රමාණයේ තේ වගා කිරීමට අදහස් කර ගෙනයි. මාස ගණනක් ඇතුළත මේ පාර කැපීම සඳහා මායිම් ලකුණු කළා. මායිම් ලකුණු කරන්න ගිය උදවියට ඒ පාර ගැන තේරුමක් නැහැ. ඒ පාර ලකුණු කළ යුතු ආකාරය ගැන ඒ අයට දෙපාර්තමේන්තුවෙන් කලින්ම සටහනක් දී තිබුණාලු. පාර කැපිය යුත්තේ ඒ සටහනේ හැටියටයි කීවාලු. නමුත් ඒ විධියට පාර කපන්නේ මක්නිසාදැයි මායිම් ලකුණු කළ අයට තේරුම් ගන්න බැරි වුණා. පාර ඒ විධියට ලකුණු කළ යුතුයයි දැනුම් දී තිබෙන්නේ ඉඩම් කොමසාරිස් හැටියට සිටි, දැනට නිවාස කොමසාරිස් වශයෙන් සිටින පොන්සේකා මහතාගේත්, එල්ලාවල පවුලේත් ආටිගල පවුලේත්, කළුතර ප්‍රදේශයේ තවත් උප ඒජන්ත කෙනකුගේත් ඉඩම් ඒ ප්‍රදේශයේ තිබෙන නිසා ඒවාටත් යා හැකි වන විධියටයි.

මේ පාර ගැන විරුද්ධ වන විට සතියක් ඇතුළත මේ කොන්ත්‍රාත්තුව එහෙ තියෙන සමිතියකට දීල තිබුණා. මේ සමිතිය මගින් සතියක් ඇතුළත් රුපියල් 23,000 ක වැඩ කරනව. ඒ තරම් වැඩ කරල තියෙන නිසා මේ පාර වෙනස් කරන්නට බැරිය කියා කියන්නට යෙදුණා. පසුව මහා උද්ඝෝෂණයක් කරල, ස්ථිර ලේකම්තුමාටත්, ඇමතිතුමාටත්, ඉඩම් කොමසාරිස්තුමාටත් කරුණු ඉදිරිපත් කරල, ආදායම් පාලක නිලධාරීතුමත්, ඒජන්තතුමත් සමග සාකච්ඡා කරල පාර වෙනස් කරව ගත්ත. ඒ පාර වෙනස් කරව ගන්න දවස්වල කොමසාරිස්තුමා මා සමග කීව; මේ විධියට විරුද්ධකම් ඇති වන්න ගියොත් ව්‍යාපාරය වෙන තැනකට ගෙන යන්න සිදු වේය කියා. මේ පාර තමුන්නාන්සෙට කී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දවසකින් දෙන්න ඕනෑද කියා මම ඇහුව. අපි මේ පාරට විරුද්ධ වුණ නිසාද, වෙන තැනකට ගෙන යන්න ඕනෑය කියන්නෙ කියා මම ඇසුව. එනකොට කීව, නැහැ, දැන් හැතැප්ම එකහමාරක් පමණ පාර තියෙන නිසා එන අධිකාරී මහත්මයට පයින් ගිහිල්ල ඉතිරි ටිකේ වැඩ කරන්න පුළුවන්ය කියා.

කොපමණ කාලයකින් පාර වුවමනාද කියා ඇහුවම මාස 3 ක් ඇතුළත පාර ඕනෑය කීව. මාස 2 ක් ඇතුළත හැතැප්ම දෙකක් පාර කැපුව. ඒ පිළිවෙලට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂවරය දැනටම හැතැප්ම 3 කට වැඩි ගණනක් පාර කපල තියෙනව. කිසි ව්‍යාපාරයක් නැති නම් මම මේ පාර කපන්නෙ මොකටද කියා දැන් අධ්‍යක්ෂවරය කියනව. ඒ බඹරකොටුවට ලැබෙන්න තිබුණු ව්‍යාපාරයට මොනවා වෙලාද දන්නෙ නැහැ. මේ ගැන ඇහුවම මට කියා සිටිය, අගමැතිනියගෙ ඉල්ලීම උඩ ඒ ව්‍යාපාරය බලන්ගොඩ මන්ත්‍රීතුමාට දුන්නය කියා. එවිට මම බලන්ගොඩ මන්ත්‍රීතුමා හමු වී ඇහුවා ඇයි මන්ත්‍රීතුමා මගේ කොට්ඨාශයට දැන් හැතැප්ම 4 ක් පමණ දුරට පාරත් කපා තියෙද්දී, මගේ කොට්ඨාශයට දෙන්න තිබුණු ව්‍යාපාරය තමුන්නාන්සෙ ගත්තෙ කියා. එවිට එතුමා කියා සිටිය, මම එහෙම කළේ නැහැ, වැලිමඩ ආසනයෙද කොහේද කරන්න බැරි වුණු වැඩක් මගේ ආසනයට දුන්නය කියා. ඊට පස්සෙ මම නැවත ඇහුව, කෝ ඒ තිබුණු ව්‍යාපාරය කියා. දැන් කියනව, නුවරඑළියට දීලය කියා. ඒක ඇත්තද නැද්ද කියා මම දන්නෙ නැහැ. නමුත් දැන් පාර කපල වැඩ ඉවර වෙලා තියෙනව. ඒ සඳහා දැන් ලක්ෂය කට වඩා වියදම් වෙලා තියෙනව. නමුත් අර ෆොන්සේකා, එල්ලාවල, ආටිගල ආදී මහත්වරුන්ගෙ පෞද්ගලික වතු හරහා මේ පාර යන්න ඉඩ දුන්න නම් අද මගේ ව්‍යාපාර සෑම දෙයක්ම සාර්ථක වෙලා ඉවරයි. අයගම පාරෙත් වැඩ සාර්ථක වෙලා; දෙල්ගොඩ වතුයාය ව්‍යාපාරයෙත් වැඩ සාර්ථක වෙලා; බඹරකොටුව රාජ්‍ය වැවිලි සංයුක්ත මණ්ඩල ව්‍යාපාරයෙත් වැඩ සාර්ථක වෙලා. නමුත් මේ පාරට විරුද්ධ වූ නිසා ඉඩම් කොමසාරිස්වරයගෙ ඒකාධිපති වැඩ පිළිවෙළ අනුව මේවට අවහිර වුණා. ඉඩම් ඇමතිතුමා මේ තරම් දෝෂාරෝපන වලට ලක් වන්නෙ මේ කොමසාරිස්තුමා නිසා බව මම කියන්න ඕනෑ. අවුරුදු 6 කට වැඩි කාලයක් තිස්සෙ මේ තැනැත්තා ඉඩම් කොමසාරිස්වරයා වශයෙන් තියා ගෙන ඉන්නෙ මොන හේතුවක් නිසාද කියා මම දන්නෙ නැහැ. වෙන නිලධාරී නැද්ද ? ඇත්ත වශයෙන්ම මේ ඉඩම් කොමසාරිස්වරයා රජයේ හැම වැඩකටම අකුල් හෙළමින් කටයුතු කරන බව කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ පල්ලේ පත්තුව, මැද පත්තුව, උඩ පත්තුව කියා කොට්ඨාශ 3 ක් තියෙනව. කලවාන කොට්ඨාශයේ නැත්නම් කුකුල් කෝරලයේ වර්ග සැතැප්ම 247 ක් තියෙනව. එයින් පල්ලෙ පත්තුවෙ අක්කර 20,000 කට වඩා නින්දගම්වලට යටත් වෙලා. මැද පත්තුවෙ පමණයි, මහජනයාට ඉඩම් තියෙන්නෙ. එයිනුත් සාමාන්‍යයෙන් අක්කර තුන් හාර දාහක් පමණ නින්දගම්වලට යට වෙලා තියෙනව. මුළු උඩ පත්තුවෙම ඉඩම් තවම බෙදා වෙන් කර නැහැ. ආණ්ඩුවෙ ඉඩම්ද, පෞද්ගලික ඉඩම්ද කියා බෙදා වෙන් කර නැහැ. ඒ අනුව බලන විට කලවාන කොට්ඨාශයෙ ඉඩම් වලින් තුනෙන් එක් කොටසකට වඩා නැහැ මහජනයාට අයිතිය කියන ඉඩම්. තුනෙන් දෙකොටසක්ම බෙදා වෙන් කර නැහැ. අක්කර 25,000 ක් පමණ නින්දගම්වලට හැර තිබෙනව. පල්ලේපත්තුවෙ නැදුන් විහාරයෙ නින්දගමට අක්කර 12,000 කුත් පොත්ගුල් විහාරයට අක්කර 8,000 කුත් වෙන් වී තිබෙනව. එම නිසා හැකි පමණ ඉක්මණින් මේ ඉඩම් නිරවුල් කර දුප්පත් ජනතාවට බෙදා දෙන්නය කියා මම ඉල්ලනව.

මීට අවුරුදු දෙකහමාරකට තුනකට පමණ කලින් මම යෝජනාවක් ඉදිරිපත් කළා, කුකුල් ගඟ ගිං ගඟට හරවා ජල විදුලිය ලබා ගැනීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කරන්නය කියා. ඇත්ත වශයෙන්ම කුකුල් කෝරළයේ ආදායම් පාලක නිලධාරී මහත්මයාත් මාත් මාස හතකට වැඩි කාලයක් ගත කර මේ යෝජනා ක්‍රමය ගැන සොයා බලා කරුණු ඉදිරිපත් කළා. එදා අපි පෙන්නුම් කළා, ලක්ෂපාන ජල විදුලි බල ක්‍රමයෙන් ලැබෙනවාටත් වඩා වැඩි බලයක් මේ යෝජනා ක්‍රමයෙන් ලබාගන්න පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද ඇස්. ඒ. ගුණසේකර මයා.]

වන්ය කියා. ඒ සඳහා ලක්ෂපානට වඩා එහි වතුර තිබෙන අතර ලක්ෂපානට ගිය වියදමින් දහයෙන් එකකින් වැඩ සම්පූර්ණ කරගන්නත් පුළුවනි. ඒ සම්බන්ධයෙන් තවමත් කිසිම පියවරක් නොගෙන තිබීම ගැන මා කනගාටු වෙනව.

අ. භා. 6.30

ඊ ළඟට මම මතක් කරන්න කැමතියි, නොදියුණු ප්‍රදේශයක් වූ කලවාන කොට්ඨාශයේ එකම තැනකටවත් තවමත් විදුලි බලය ලැබී නැති බව. රත්නපුර දිස්ත්‍රික්කයේ සෑම ආසනයකටම වාගේ විදුලි බලය තිබෙනව. නමුත් විශාලම ආසනයක් වූ කලවාන කොට්ඨාශය නොදියුණු තත්ත්වයක තිබියදීත් එකම කොටසකටවත් විදුලි බලය ලබා දී නැහැ. එම නිසා සෑම තැනකටම දෙනු ලබන විදුලි බලය කලවාන ආසනයේ එක කොටසකටවත් දෙන්නට සලස්වන්නය කියා මා විශේෂයෙන් ඇමතිතුමාගෙන් ඉල්ලනව. එසේ විදුලි බලය නොලැබුණොත් එක එක දෙපාර්තමේන්තුවලින් දෙනු ලබන්නා වූ, රෙදි විවීමේ මධ්‍යස්ථාන ආදි එකම කර්මාන්ත ආයතනයකවත් වැඩ කටයුතු කරගන්න බැරි වෙනව.

ඊ ළඟට මා පොදු වශයෙන් කරුණු කීපයක් සඳහන් කරන්න බලාපොරොත්තු වෙනව. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කථා කරද්දි කිව්වා, මාතර දිස්ත්‍රික්කයේ මීට කලින් අක්කර දෙක තුන ආදි වශයෙන් ඉඩම් බෙදා දුන් නමුත් දැන් දෙනු ලබන ප්‍රමාණය අක්කර අටෙන් එකකට සීමා වී තිබෙනවය කියා. ඒජන්ත උන්නැහෙගෙන් ඇසුවාම කියන වලු ඉඩම් නැත කියා. ඒ වාගේම සල්ලිත් නැතිලු. ඒ නිසා ඒ සඳහා මොකද කරන්නෙ කියා එතුමා ඇමතිතුමාගෙන් ඇසූ බව මට මතකයි. ඊටත් වඩා ලස්සන ප්‍රශ්නය නම් මෙයයි. ඉඩමුත් නැත, සල්ලිත් නැත, ඒ වාගේම මාතර දිස්ත්‍රික්කයේ මහජනයා පිටට යන්නට කැමතිත් නැත, ඒ නිසා මේ ඉඩම් නැති ප්‍රශ්නය සම්බන්ධයෙන් මොකද කරන්නෙ කියා ඒ මන්ත්‍රීතුමා ඇමතිතුමාගෙන් අහනව. ඇත්ත වශයෙන්ම මහජන නියෝජිතයන් වශයෙන් අපි එවැනි ප්‍රශ්න ඇමතිවරයාගෙන් අසනවා නම් එය ලොකුම දුර්වලකමක්. ඒ ප්‍රදේශයේ ඉඩමුත් නැත් නම්, සල්ලිත් නැත් නම්, එකම යුතුකමව තිබෙන්නෙ ඉඩම් තිබෙන ප්‍රදේශයකට යාමට ඒ ජනතාවට අවස්ථාව සලසා දීමයි. එසේ නැතිව කරන්න අදහස් කරන්නෙ කුමක්ද? නිවිතිගල ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.) කිව්ව, කොළඹ දිස්ත්‍රික්කයේ සමහර ආසනවල ඉඩම් ගැනීම සඳහා කෝටි ගණන් වියදම් කර තිබෙනවාය කියා. මම ඒකට විරුද්ධයි. ඇත්ත වශයෙන් අප ඒකට විරුද්ධ විය යුතුයි. පෞද්ගලික අයගෙන්, කෝටි ගණනක් වටිනා ඉඩම් ලබාගෙන බෙදා දීම ගැන විරුද්ධයි. මන්ද? කොළඹ නගරයෙන් අක්කරයක ප්‍රමාණයක් රුපියල් ලක්ෂයකටවත් අද ලබාගන්නට පුළුවන්ද? එහෙම නම් කී දෙනකුට එසේ ලබාගන්නා ලද ඉඩම් බෙදා දෙන්නට පුළුවන්ද? එසේ බෙදා දෙන්නට නම් කොපමණ මුදලක් යට කරන්නට ඕනෑද? ඒ විධියට ලක්ෂ ගණනක්—කෝටි ගණනක්—කොළඹ නගරයෙන් ඉඩම් ගැනීම සඳහා වැය කරනවාට වඩා නරකද නගරයෙන් පිට ප්‍රදේශවල ඉඩම් ලබාගෙන බෙදා දෙනවා නම්? නිදසුනක් වශයෙන් අපේ ප්‍රදේශය ගනිමු. මේ ප්‍රදේශයෙන් ඉඩම් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂයක් වියදම් කළොත් කොයි තරම් දෙනකුට සහනය සැලසෙනවද? ඇත්ත වශයෙන් අක්කර දහස් ගණනක ඉඩම් අරගෙන ඒවා බෙදා දී තවත් ඒ අයට ගෙවල් හදා ගැනීම සඳහාද සහනයන් සලසන්නට, ආධාර දෙන්නට මේ මුදලින් පුළුවන් වෙනව. එහෙම නම් කොළඹ නගරයෙන් ඉඩම් ලබා ගැනීම නුවණට හුරුද යන කාරණය මෙහිදී සිහිපත් කරවනව. අපේ ප්‍රදේශයෙන්, ඉඩම් අක්කරයක් රුපියල් 50 කට 100 කට ගන්න පුළුවනි. නමුත් මාතර සිටින අය මාතර ප්‍රදේශයේම පදිංචි කරවන්න ඉඩම් ලබා ගන්නට ගියොත්, රත්නපුරයෙ සිටින අය රත්නපුර ප්‍රදේශයේම පදිංචි කරවන්න ඉඩම් සොයා දෙන්නට ගියොත්, මේ ප්‍රශ්නය කවදාවත් විසඳන්නට ලැබෙන්නෙ නැහැ.

ඊළඟට වැදගත් කාරණයක් ගැන තමුන්නාන්සෙගෙ සැළකිල්ල යොමු කරවන්න කැමතියි. සමහර විට මේ අදහස මා ඉදිරිපත් කළාම අධිරාජ්‍යවාදීන්ට කත් අදින්නක වශයෙන් හඳුන්වන්නටත් බැරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. ගරු සභාපතිතුමනි, මම හොඳින්ම දන්නවා කෙනෙකු ඉඩමක් වගා කරන්නෙ ඉතාමත් අමාරුවෙන් බව. ඒ අන්දමට වගා කරන ලද ඉඩමක් යම්කිසි පුද්ගලයකු බලාපොරොත්තු වෙනවා නම් කිසිම වැඩක් නොකර ලබා ගැනීමට, මම හිතන්නෙ එය බලවත් වරදක් බවයි. ඇත්ත වශයෙන් මගේ එවැනි ඉඩමක් ලබා ගන්නට කල්පනා කරනවා නම් මම නම් ඊට කිසිසේත් කැමති වෙන්නෙ නැහැ, මම එසේ ගැනීමට කිසිසේත් ඉඩ දෙන්නෙත් නැහැ. මන්ද? ඒ අන්දමට ඉතා දුක්, කරදර, වෙහෙස විඳ වගා කර, එය අනුන්ට දීමේදී ලොකු හිත් වේදනාවක් ඇති වෙන නිසයි. ඒකෙ අමාරුව, විඳින්නට වන වෙහෙස, ඉඩම් වගා නොකළ කෙනෙක් දන්නෙ නැහැ.

අද ඉඩම් හිමියන්ට සිදු වී තිබෙනව, රජය ලබා ගන්නා නිසා ඉඩම් කැබලි කැබලිවලට කඩා විකුණන්නට. කෙසේ වුණත් මේ රටේ ආදායම රඳා පවතින්නෙ තේ, රබර් සහ පොල් යන මූලික වගාවන් උඩ බව මේ අවස්ථාවේදි අමතක කරන්න නරකයි. ඒ අන්දමට විශාල වතු කැබලි කොට විකුණන්ට ගියොත් අපේ මූලික ආදායම නැති වෙන්න පුළුවනි. එම නිසා මෙය ඉතාමත්ම කල්පනාකාරීව කළ යුතු බව මතක් කරනව.

ගරු සභාපතිතුමනි, රජයෙ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තිය නිසා අද බොහෝ දෙනකු ඉඩම් කැබලි කර විකුණනවා පමණක් නොවෙයි, අලුතෙන් වගාවන් ඇති කිරීමට උනන්දු නොවෙනවා පමණක් නොවෙයි, අලුතෙන් ඉඩම් මිලදී ගැනීමට උනන්දුවක් නොදැක්වීම නිසා ඉඩම් මිලදී ගැනීම වෙනුවට මුදල් රැස් කර තබා ගන්නව, එහෙම නැත්නම් ව්‍යාපාරවලට යොදනව. ඉස්සර නම් ගෙවල් හැදීමත් කළා. දැන් ඒකත් නතර කරල. මුදල් තිබෙන අය ගෙවල් හැදුවත් ගෙවල්වල වටිනාකම ලක්ෂයකට වැඩි වුණොත්, ඒකටත් විශාල බද්දක් ගෙවන්නට වෙනව. ඒ එක කාරණයක්. අනික් කාරණය නම් එසේ උපයා ගන්නා ලද මුදල් ව්‍යාපාර සඳහාද යොදවන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනව. මන්ද? ඒ අන්දමට ව්‍යාපාරවල යොදවා සම්භ කර ගන්න මුදල් එක වරටම කඩාගන්නට බලාපොරොත්තුවෙන් සිටිනව. එහෙම නැත්නම් එක පාරටම විශාල "ටැක්ස්" එකක් ගෙවන්නට සිදු වී තිබෙනව. මම දන්නව, මගේ කොට්ඨාශයට යාබදව තිබුණා අක්කර දස දහසකට වඩා විශාල වත්තක්. මේ වත්ත අයත්ව තිබුණේ අපේ ගරු සභාවෙ ලේකම් මහත්මයටයි; දැරණියගල මහත්මයටයි. ඒ මහත්මයට "ටැක්ස්" ගෙවන්න වන නිසා වෙන්න ඇති ඒ ඉඩම විකුණා දැම්මෙ. එම නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, කොළඹ ප්‍රදේශයෙන් නැත්නම් නගරබද ප්‍රදේශයෙන් ඉඩම් ගන්නා විට අක්කරය රුපියල් තුන් දහසකට වැඩි නම් ඒවා රජයෙන් මිලදී නොගන්නා ලෙස. අනික් කාරණය, මේ අන්දමට රජය ඉඩම් අත්පත් කර ගනිද්දි ඒ ඉඩම් අයිතිකරුවන් සාප කරන්නෙ ඉඩම් අල්ලන අයට නොවෙයි. ඇමතිවරයාටයි.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

**අක්කරයක් කීය ගානෙද දුන්නෙ?**

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

**අක්කරයක් රුපියල් 25 කට වැඩි නැහැ.**

මම මේ කැගහන ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමතියි, මේ ව්‍යාපාර ඇති කරන්නේ ඒ ඒ කොට්ඨාශවලටවත් ඒ ඒ දිස්ත්‍රික්කවලටවත් නොවන බව. රජයේ මුදලින් ඇති කරන මේ ව්‍යාපාර මුළු රටටම අයත්. උඩ වලවේ, රාජාංගන වැනි ව්‍යාපාර ඒවා පිහිටි කොට්ඨාශ සඳහා නොවෙයි, ඇති කර තිබෙන්නේ; මුළු රටටමයි. ඒ නිසා සෑම කොට්ඨාශයකම සිටින රක්ෂා නැති අයට ඒවාට යාමට පුළුවන් විය යුතුයි. ඒ ව්‍යාපාර අවට ඇති කොට්ඨාශවල සිටින රක්ෂා නැති අයට පමණක් නොවෙයි, ලංකාවේ සෑම තැනම සිටින රක්ෂා නැති අයට—විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ නගරබදව මුඩුක්කුවල සිටින රක්ෂා නැති අයට—ඒ ව්‍යාපාරවල තැනක් දීම වටිනවා. නැතිනම් කවදාවත් අපේ රට සංවර්ධනය කරන්නට ලැබෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

ඉඩම් බෙදා දීමේදී ඒ ඒ කොට්ඨාශවල තිබෙන ඉඩම් ඒ කොට්ඨාශවල සිටින අයට පමණක් දිය යුතුය කියනවා නම්—රත්නපුරේ ඉඩම් රත්නපුරේ අයට දිය යුතුය, හම්බන්තොට ඉඩම් හම්බන්තොට අයට දිය යුතුය කියනවා නම් —වව්නියාවේ ඉඩම් වව්නියාවේ අයට පමණක් දිය යුතුයයි කිව්වාම අපි ඒකත් දිය යුතුයි. ඒ ක්‍රමය හරියයි අපට කියන්න බැහැ. රජයෙන් ආරම්භ කරන සියලුම ව්‍යාපාර සඳහා ලංකාවේ සියලුම පුරවැසියන්ට ඉල්ලීමට පුළුවන්කම තිබිය යුතුයි. සෑම කොට්ඨාශයකම ඉඩම් ප්‍රශ්නය බල පවත්වනවා. ඒ නිසා මේ විධියට ඒ ප්‍රශ්නය කවදාවත් විසඳන්න පුළුවන් වන්නේ නැහැ.

යම් පුද්ගලයෙක් රජයේ ඉඩමක බලහත්කාරයෙන් පදිංචි වුවොත් ඒ පුද්ගලයාට විරුඬව නඩු දැමීමට පුළුවන් ඉඩම් කොමසාරිස්තුමාගේ නියෝගයක් අනුව පමණක්ය කියනවා. එය වැරදි ක්‍රමයක්. එසේ කළොත් තව අවුරුදු 10 ක් යන විට රජයේ ඉඩම් කිසිවක් ඉතුරු වන එකක් නැහැ. සෑම තැනම ඇති ඉඩම්වල මහජනයා බලහත්කාරයෙන් පදිංචි වෙනවා ඇති. මෙපමණ කල් රජයේ කැලෑ ඉඩම් පාලනය කළේ කොහොමද? අමාත්‍යාංශයේ සථිර ලේකම්තුමා ඒ බලතල හා වගකීම් ඒ ඒ පළාත්වල දිසාපතිවරුන්ට පවරනවා. දිසාපතිවරු ආදායම් පාලක නිලධාරීන්ට පවරනවා. ආදායම් පාලක නිලධාරීන් ගම් මුලාදෑනීන්ට හෝ ග්‍රාම සේවකයින්ට පවරනවා. ඒ විදියටයි, ආණ්ඩුවේ කැලෑ ඉඩම් බලාගත්තේ. කැලෑ කැපීමක් ගැන ගම්මුලාදෑනියා නැත්නම් ග්‍රාම සේවකයා දැන්නුවොත් කියන්නේ පගාව නොදුන් නිසා දැන්නුවාය කියලයි. නොදැන්නුවොත් කියන්නේ පගාව අර ගෙන දැන්නුවේ නැහැ කියල.

මේ රටේ ඉඩම් ආරක්ෂා කරන්නය කියා ඇමතිතුමා නීති හදනවා. ආරක්ෂා කරන්නේ, කැලෑ දෙපාර්තමේන්තුවේ මාර්ගයෙන් කොමසාරිස්තුමාත්, කොමසාරිස්තුමාගේ මාර්ගයෙන් ඒජන්තතුමාත්, ඒජන්තතුමාගේ මාර්ගයෙන් ඩී. ආර්. ඕ. මහත්මයත්, ඔහුගේ මාර්ගයෙන් ග්‍රාම සේවකයාත් මගිනුයි. එහෙම වුණත්, බලහත්කාරයෙන් ආණ්ඩුවේ ඉඩමක ගෙයක් හදාගෙන ඉඩම වගා කර ගෙන මාස දෙකක් නැත්නම් 3 ක් සිටියාට පසුව කියනවා, මේ මනුෂ්‍යයාට ඉන්න හිටින්න තැනක් නැහැ, ඒ නිසා ඒ මනුෂ්‍යයා පිට කරන්න එපාය, කියා. බලහත්කාරයෙන් පදිංචි වී සිටිනවා, ගෙයක් හදාගෙන තිබෙනවා, වගා කර ගෙන තිබෙනවා, එම නිසා ඒ මනුෂ්‍යයා පිට කරන එක වැරදියි, ඉඩම ඔහුට දෙන්නට ඕනෑය කියනවා. අපිම නීති හදනවා; අපිම නීති කඩනවා. ඒ නිසා යම් කෙනෙක් බලහත්කාරයෙන් යම් රජයේ ඉඩමක පදිංචි වුණොත් ඔහුට ඒ ඉඩම දෙන්න එපාය කියා මා ඇමතිතුමාගෙන් ඉල්ලනවා. එසේ නොකළොත් කවදාවත් මේ ඉඩම් ප්‍රශ්නය විසඳන්න බැහැ.

එමෙන්ම ලී ගැන බලන්න. අද ලංකාවේ බොහොම වටිනා ලී වර්ග තිබෙනවා. ඒ කැලෑ හේන්වලට එළි කරනවා. ඒ මගින් දහස් ගණන් ලක්ෂ ගණන් වටිනා ලී දඹු පුච්චනව. එවැනි අවස්ථාවල ග්‍රාම සේවකයා හෝ කැලෑ මුරකාරයා උසාවියට රිපෝර්තු කරනවා, මේ තැනැත්තා කැලෑව විනාශ කර තිබෙනවා කියා. අලාභය රුපියල් 300 යි නැත්නම් රුපියල් 400 යි කියනවා. නමුත් මිල්ල, අළුබෝ, බුරුත වැනි වටිනා ගස් විනාශ කරනවා. උසාවියට ගියාම රුපියල් 10 ක් දඩ ගහලා ඔහු නිදහස් කරනවා. ඒ අයට ඕනෑ හැටිය රුපියල් 10 ක් ගෙවන්න පුළුවන්. ඊළඟට ග්‍රාම සේවකයාට කියනවා, මේ සඳහා සාක්ෂි ඕනෑය කියල. බලහත්කාරයෙන් එය කළා නම් ඒ බවට සාක්ෂිකාරයින් දෙදෙනකු ඕනෑ. ඒ සාක්ෂිකාරයින්ට උසාවියෙන් බටා ලැබෙන්නෙ නැහැ. ඔවුන්ට සාක්ෂි දෙන්න යන්න වෙන්නේ තමන්ගේ අතින් වියදම් කරගෙනයි. ඊට පසු හේන කෙටූ අයත් ඒ තැනැත්තා සමග තරහයි. එක්කෙනෙක් දෙන්නෙක් නොවෙයි දහ පහළොස් දෙනෙක් එක්කයි හේනක් කොටන්නෙ. ඊට පසු ඒ සියලුදෙනාම සාක්ෂිකාරයින් සමග තරහයි. විරුද්ධකාරයින් කීප දෙනෙක්ම ඇති වෙනව. යම්කිසි විධියකින් සාක්ෂි දෙන්න උසාවියට එන්න බැරි වුණොත්, ඔවුන්ට "ඕපන් වරන්ට්" නිකුත් කරනව. මටත් එහෙම වෙලා තිබෙනව.

ගරු සභාපතිතුමනි, මා හිතන හැටියට අද ජර්මනිය අපේ රටේ බුරුත ඉල්ලා එවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. නමුත් මෙතන අපි ඉදගෙන සිටින පුටු පවා හදා තිබෙන්නෙ බුරුම තේක්කවලින්. ඇයි දෙයියනේ මේ රටේ ඕනෑ තරම් වටිනා ලී වර්ග තිබෙනවා. නමුත් ලී වුවමනා කරන දෙපාර්තමේන්තු කියන්නේ මොනවද ? අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ආදී දෙපාර්තමේන්තු කියන්නේ බඩු හදන්නට "බර්මා ටීක්" ඕනෑ කියලයි. මේ රටේ කොතරම් අගනා ලී තිබෙනවාද ? බඩු හදන්නට බුරුම තේක්ක ගෙනෙනතුරු සිටිනවා. මේ රටින් පිටරට ඇදී යන ධනය හුඟක් දුරට නතර කර ගන්ට පුළුවනි, හෙන් කෙටී මෙහි කපා දමන ලීවලින් හා සංවර්ධන ව්‍යාපාර ඇති කිරීමේදී කපා දමන ලීවලින් ඒ භාණ්ඩ සාදනවා නම්. උඩ වලවේ ව්‍යාපාරය සම්බන්ධයෙන් කැලෑ එළි කිරීමෙදි අක්කර 5,000 කට ඉහළ ප්‍රමාණයක බුරුත ලී කපා ඒවට තෙල් දමා පුළුස්සා දැම්ම. රත්නපුරයේ දිසාපති තුමාත්, ඇමතිතුමාත් මාත් කථා කරමින් සිටි අවස්ථාවකදී මා ඇමතිතුමාට පෙන්වා දුන්න, ලී නාස්තිවන්නේ කෙසේද කියා. ඒ අවස්ථාවෙදි මා මතක් කළා, ලී කැපීම කැලෑ දෙපාර්තමේන්තුවට භාර දුන්නොත් නම් උඩ වලවේ ව්‍යාපාරය තව අවුරුදු 10 කින් වත් කෙරෙන්නෙ නැති බව. ඕනෑ නම් අවුරුද්දකට කැලෑ දෙපාර්තමේන්තුව ලී ලොරී තුන—හතරක් ගෙන යයි. අනික් ඒවට මොනව වෙයිද දන්නෙ නැහැ. මා ඒ අවස්ථාවෙදි ඇමති තුමාගෙන් ඉල්ලා සිටිය, ලී ප්‍රසිඬ වෙන්දේසියේ විකුණන්ට කියා. මා එහිදි ඉල්ලා සිටියෙ අක්කර පන්සීය, හයසීය, හත්සීය තරම් විශාල කොටස් කඩා වෙන් කර වෙන්දේසි කරන්ට කියා නොවෙයි. කාටත් ගන්ට පුළුවන් අන්දමට, අක්කර 25 සිට 50 දක්වා කුඩා කොටසක් කඩා වෙන්දේසි කරයි කියායි, මා බලාපොරොත්තු වුණේ. එසේ කළා නම් මීටත් වඩා විශාල මුදලක් ඒ මාර්ගයෙන් සොයා ගන්ට පුළුවන්කම තිබුනා. අපි ඇමතිතුමාට ස්තූතිවන්ත වෙනව, අක්කර හය-හත් සීයේ කොටස්වත් ප්‍රසිඬ වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන්. මා හිතන්නේ ඒ ලීවලින් රුපියල් ලක්ෂ එකහමාරක දෙකක පමණ ආදායමක් රජයට ලැබුණා.

ඊට පසු මා ඉල්ලා සිටියා, සෑම කොටය කම වටප්‍රමාණය අනුව මුදලක් අය කරන්ට කියා. අඩි 4 කට අඩු වටප්‍රමාණයක් ඇති කොටයකින් අඩියකට සත 75 ගණනෙත්, අඩි 4 කට වැඩි වටප්‍රමාණයක් ඇති කොටයකින් අඩියකට රු. 2.50 ගණනෙත් වැටෙන්ට අය කරන්ට කියා මා ඉල්ලා සිටිය. අද ආණ්ඩුවට ඒ ක්‍රමයෙන් ලක්ෂ ගණනක ලාභයක් ලැබී තිබෙනව. ඒ ලී කැලෑ දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගත්තත්, කොළඹ වැනි නගර බද ප්‍රදේශවල ජනයා බඩු භාණ්ඩ සෑදීමට ගෙන යනව. ඔය සංවර්ධන ව්‍යාපාරයේ වැඩ ආරම්භ කරන්ට කලින් අක්කර 5,000 කට වැඩි ඒ බිම් කොටසේ ලී තෙල් දමා පුළුස්සන්නයි, ලැහැස්තිව සිටියෙ. මෙපමණ කලක් ඔය ව්‍යාපාරවල ලී පුළුස්සා දමූ නමුත් කිසිවෙක් ඒක නවත්වන්ට කටයුතු කළේ නැහැ. කැලෑ දෙපාර්තමේන්තුව දන් මැහෝගනි, අරගනි මේ ගනි කියමින් ගස් වර්ග වගා කරගෙන යනව. අක්කර දාහ, පන්සීය, සියය ආදී වශයෙන් කැලෑ කපා එක එක ජාතිවල ලී වවනව. අපේ තිබෙන හොඳ ලී කපා දමා වවන ලීවලින් ප්‍රයෝජන ගන්ට තව අවුරුදු සියයකින්වත් පුළුවන් වෙයි කියා මා හිතන්නෙ නැහැ. ඒ වගේම ඒ වතු ආරක්ෂා කරන්ට මුරකරුවන් තබන්ටත් ඕනෑ. ඒවායේ ලාභ කොයිතරම් කලකින් ලැබෙයිද ? දනට ඉඩම්වල බලයෙන් පදිංචි වී සිටින මිනිසුන් අයින් කරන්ට කොමසාරිස්තුමාට දන් උසාවියෙන් බලය ගන්ඩ සිදුවී තිබෙන්න වගේ ඒ ඉඩම් වලත් මිනිසුන් බලයෙන් පදිංචිවී ඒවා කපා කොටා දම්මොත් එයින් ඇති ප්‍රයෝජනය කුමක්ද ? අපට ඕනෑ තරම් ලී කැලෑවල තිබෙනව. අපි තවත් වවන්ට ඕනෑ නැහැ. කැලෑ කපා ලී වැවීම නොවෙයි කරන්ට තිබෙන්නෙ ; එළි කර තිබෙන ඉඩම්වල—"බැරන් ලෑන්ඩ්" වල—වැවීමයි—කරන්ට තිබෙන්නෙ.

ඊළඟට මා බලාපොරොත්තු වෙනව, කන්තලේ උක් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය ගැන යමක් කියන්න. ඒක සංයුක්ත මණ්ඩලයේ කීප දෙනකුගේ රාජධානියක් කරගෙන තිබෙනව. ඒ සංයුක්ත මණ්ඩලය කටයුතු කරන්නෙ ඔවුන්ට වුවමනා හැටියටයි. ඒකාධිපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

බලයක් තිබෙන ජනාධිපති කෙනෙක් කටයුතු කරන විධියටයි අද මේ සංයුක්ත මණ්ඩලයෙ කටයුතු කෙරෙන්නෙ. එතන කාටවත් කථා කරන්න බැහැ. අහන්නෙ නැතිව මොකවත් කරන්න බැහැ. ගිය අවුරුද්දෙ, 1963 ජූනි මාසයේදී මණ්ඩලය තාවකාලික කම්කරුවන් 3 දෙනෙකුගේ වැඩ තහනම් කළා. මොන හේතු උඩ එසේ වැඩ තහනම් කළාද කියා මා කියන්නම්. මේ තුන්දෙනා අතර අයි. ඩී. විලියම් කියා කම්කරුවකුත් සිටිය. ඔහු වැඩ කළේ මුරකරුවකු වශයෙනුයි. මේ අවස්ථාවේදී සංයුක්ත මණ්ඩලය ජීප්, ඩ්‍රයිවර් ආදිය පදවන්නන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳෙව්ව. විලියම් කියන කම්කරුවාත් ඒ තනතුරක් සඳහා ඉල්ලුම් කළා. ඔහු 6 වැනියාට තේරුණා. පස් දෙනෙක් එදා බඳවා ගත්තා. ඊට පසු වේටිං ලිස්ට් එකේ විලියම් 1 වැනියාට සිටිය. ඊටපසු විලියම් සිටියදී තවත් 4 දෙනෙක් බඳවා ගෙන තිබුණා. මෙතන ඉන්නව මෙත්තානන්දද කව්ද කියන එක්කෙනෙක්. [බාධා කිරීමක්] ඔව්, එයා එල්. එච්. මෙත්තානන්ද ගෙ පුතා තමයි. මේ මෙත්තානන්ද මහත් මයගෙන් විලියම් අසා තිබෙනව, ඇයි, සර්, මම නොවැ වේටිං ලිස්ට් එකේ පළමුවැනියට හිටියෙ; ඒ නිසා මට පස්සෙ තව 4 දෙනෙක් ගත්තෙ කොහොමද කියා. මේ අවස්ථාවේදි කථාවක් ඇතිවී සිල්වද කව්ද කියන මහත්මයෙක් විලියම්ට ගහල තියෙනව. අන්තිමට ගුටිත් කාල ඒ මනුස්සයගෙ වැඩත් තහනම් කළා. එපමණක් නොවෙයි. පොලීසියටත් ගියා. පොලීසියෙනුත් විලියම්ට විරුද්ධව වැඩ කර තිබෙනව. නමුත් උසාවියේදී මේ අය නිදහස් කළා. උසාවියෙන් නිදහස් කළාට පසු නැවතත් රක්ෂාව ඉල්ලුව. මොකද, නඩුව අවසාන වනතුරුය කියා මේ තැනැත්තාගේ වැඩ තහනම් කර තිබුණේ.

තාවකාලික කම්කරුවකුගෙ වැඩ තහනම් කිරීමක් ගැන අපි දන්නෙ නැහැ. තාවකාලික කම්කරුවකුගෙ වැඩ නතර කර නව නම් ස්ථිර වශයෙන්ම නතර කරන්ට ඕනැ. නමුත් තාවකාලිකව තහනම් කර තිබුණු නිසා නඩුව අවසාන වී නැවතත් රක්ෂාවල් ඉල්ලුව. ඊට පසු මණ්ඩලය කිව්ව පොලීසියේ වාර්තාව ගෙන්වා බලන්න වුවමනාය කියා. පොලීසියට වුව මනා හැටියට ඒ අය වාර්තාවක් එව්ව. මේ තුන්දෙනා උසාවියේදි සමාව ඉල්ලුවාය, ඒ නිසා නිදහස් කළාය කියා පොලිස් වාර්තා වේ සඳහන් වුණා. ඒ පොලිස් වාර්තාව අනුව මේ අයට නැවතත් මණ්ඩලයේ රක්ෂාව දෙන්න බැරිය කිව්ව. ඒ අවස්ථා වෙදි විලියම් කියා සිටියා මම සමාව ඉල්ලු වෙත් නැහැ, වෙන මොකවත් කළෙත් නැහැ, ඒ අය සමාදාන වුණාය, අපි නිකම්ම නිදහස් කළාය, කියා. අපි මහෙස්ත්‍රාත් තුමාගෙන් නඩු පිටපත ගෙන්වා ගත්තා. ඒකෙ තියෙන්නෙත් අර විලියම් කියන විධියටයි. උසාවියෙන් සමාව ඉල්ලුවා වුවත් තවත් දඬුවමක් මොකටද? දැන් අවුරුද් දකුත් මාස ගණනක් ගත වෙනව. තවමත් ඒ අයට රක්ෂාව දී නැහැ. පීරිස්ද කව්ද කියා කෙනෙක් ඒකෙ බෞද්ධ වැඩ කරන වාය කියා ඇමතිතුමා රවටාගෙන කටයුතු කරනව. මොරටුවේ පීරිස් කියන මහත්ම යෙක්. ඔහු අර ඩැරල් පීරිස් මහත්මයගෙ මල්ලී. එයා උත්පත්තියෙන්ම කතෝලික යෙක්. අයියත් කතෝලිකයෙක්. මල්ලීත් කතෝලිකයෙක්. නමුත් බුද්ධාගමට වැඩ කරනවාය කියා ඉඩම් අරගෙන මොකක්ද විහාරයක් හරිගස්සන්න මේ ළඟදි ධාතු වඩම්මා තිබෙනව. ඒ ධාතු වඩම්මා තිබෙන්නෙ පාරෙ යන්න බැරි තරමට බීල. ධාතුන් වහන්සේලාත් සමග පාරෙ වැටිල තියෙනව යන්න බැරිව. වහාම මේවා සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා කමිටුවක් පත් කරන මෙන් මා ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනව. කන්තලේ උක් සංයුක්ත මණ්ඩලය අද ඒ අයගෙ රාජධානියක් හැටියට සලකාගෙන ඒ අයට වුවමනා හැටියට වැඩ කරනව.

ඒ වාගේම මේ උක් වගාව ආරක්ෂා කරන මුරකාරයින්ට පතරොන්, බැටරි, ආදිය වෙනම දෙනව. ඒ පතරොම් බැටරි වලින් ඔවුන් ප්‍රයෝජන ගන්නෙ නැහැ. ඒවාට මොනව වෙනවාද කියා දන්නෙ නැහැ. උක් කපන්න ඔන්න මෙන්න කියන අවස්ථාවෙදි එළි කරන්න දෙනව. එළි කරන්න භාර ගන්න කොන්ත්‍රාත් කාරයො වත්ත වටේ විතරක් එළි කර මැද හරිය නිකම් තියනව. බලන්න එන විට ගිනි තියනව. අන්තිමේදි සල්ලිත් දෙන්න වෙනව, මේවට. නමුත් උක් වගාව පිච්චිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉවරයි. එම නිසා කන්තලේ උක් සංයුක්ත මණ්ඩලය ගැන වහාම පරීක්ෂණයක් පවත්වන හැටියට මා ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, මීට වඩා මා කතා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. මා අන්තිම වරට—[බාධා කිරීම්]

**ඩී. ජී. එච්. සිරිසේන මයා.**
*(திரு. டீ. ஜீ. எச். சிறிசேன)*
(Mr. D. G. H. Sirisena)

අන්තිමේ තමයි, හොඳ හරිය.

අ. භා. 7

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

මා අන්තිම වශයෙන් ගරු ඇමතිතුමාගෙනුත් ඒ වගෙම ඉඩම් කොමසාරිස්තුමාගෙනුත් ඉල්ලා සිටින්නේ—[බාධා කිරීම්] මට තමුන්නාන්සේලා පුද්ගලික වශයෙනුත් විවේචනය කරන්න සිදු වුණා. ඒ ගැන බොහොම කනගාටුයි.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ඒ මොකද ?

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

එතුමන්ල අතින් කලවාන කොට්ඨාශය වෙනුවෙන් යම් වැඩක් කෙරී තිබෙනව, නමුත් වුවමනා කරන හරිය කෙරී නැහැ. කියන ලද කිසිවකට කන් දුන්නෙ නැහැ. එසේ නැතිනම් ඔය විධියට පුද්ගලිකව මා එතුමන්ලාව විවේචනය කරන්නෙ නැහැ. මා එතුමන්ලාව විවේචනය කෙරුවෙ එම නිසයි. මීට පස්සෙවත් වැඩ කෙරෙයිද, නැද්ද, යන්න බලා ගන්නයි මා එසේ විවේචනය කර බැලුවෙ.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

විවේචනය කළාම කොහෙත්ම නැහැනෙ.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

විවේචනය කිරීමෙන්වත් සැනසීමක් ලැබෙනව. වැඩ නොකළ නිසා අඩු ගණනෙ විවේචනයවත් කළා. වැඩක් නොකර, විවේචනයත් නොකළොත් ලොකු පාඩුවක්.

ගරු ඇමතිතුමා අරලිය ගහ මන්දිරයට හෝ වෙනයම් උත්සවයකට හෝ පාර්ලිමේන්තුවට හෝ හදිසියෙ එන්න සූදානම් වන වෙලාවලදී යම් යම් නිලධාරීන් තම තමන්ට වුවමනා වුවමනා පයිල්ස් උස්ස ගෙන ඇවිත් "සර්, මේකට අත්සන් කරන්න" කියනව. ඇමතිතුමා විනාඩි දෙකෙන් තුනෙන් යන්න ඉන්න නිසා ඒව එතුමට බලන්න වෙලාවකුත් නැහැ. එම නිසා ඔවුන්ට වුවමනා කරන පයිල් තිබ්බ හැටියෙ ඇමතිතුමා අත්සන් කරනව. ඇමතිතුමාට ඒ ගැන පරීක්ෂා කරන්න වෙලාවක් නැහැ. ඒ අන්දමට පයිල්ස් අරගෙන ආ වෙලාවලදී කරුණා කර ඒව ළඟ තියාගෙන ඒවයෙ තියෙන්නෙ මොනවද කියා පරීක්ෂා කර බලන හැටියට මා එතුමගෙන් ඉල්ලා සිටිනව. එතරම් හදිසි වෙන්න වුවමනාවක් නැහැ. ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලනව එවැනි පයිල්ස් ළඟ තබාගෙන පරීක්ෂා කර බලන හැටියට. [බාධා කිරීමක්] මා ගරු ඇමතිතුමාට චෝදනා කළා නොවෙයි.

**ජී. ජේ. පාරිස් පෙරේරා මයා.** (ජාඇල)
*(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரோரா—ஜா-எல)*
(Mr. G. J. Paris Perera—Ja-Ela)

අවවාද දුන්න.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

ඇමතිතුමාට ඔක්කොටම ඉස්සෙල්ල අවවාද දෙන්න වෙලා තියෙනව. වැඩට දක්ෂ පුද්ගලික ලේකම්වරයෙක් එතුම පත් කර ගන්න ඕනා. එතුමගෙ පුද්ගලික ලේකම්ගෙ දුර්වලකම නිසා එතුමව හැම තැනදිම විවේචනය කරන බව පේනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. රත්නායක මයා.** (වත්තේගම)

*(திரு. ஏ. ரத்னாயக்க—வத்தேகம)*

**(Mr. A. Ratnayake—Wattegama)**

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශය පිළිබඳව දැන් දින දෙකහමාරක් පමණ විවේචනය වී තිබෙනව. තවම විවේචනයට භාජන වී තිබෙන්නේ අමාත්‍යාංශ 4 ක් පමණය කියා මා විශ්වාස කරනව. තව අංශ 16 ක් විතර තිබෙනව, විවේචනය කරන්න. නමුත් අපට තව අංශ දෙක තුනකට වඩා විවේචනය කරන්න අවස්ථාව ලැබෙන එකක් නැත කියා මා සිතනව, කාලය මදිකම නිසා. එම නිසා මා ඉල්ලා සිටිනව හැකි පමණ ඉක්මනට අපේ ස්ථාවර අණ පනත් වෙනස් කර කාරක සභා අවස්ථාවෙ අයවැය ලේඛනය විවේචනය කිරීමට ලැබී තිබෙන කාලය දීර්ඝ කරන හැටියට. අඩු වශයෙන් ලබන 20 වනදා වන තුරුවත් මෙම සාකච්ඡාව පවත්වාගෙන යාමට අපට අවසරය එහෙම නැතිනම් බලය තියෙනව. එම නිසා කලින් ගෙන ඇති නියෝග වෙනස් කර තව වැඩිපුර දින හතක් අටක්වත් මේ සඳහා ඉඩ ලබා දෙන ලෙස මා ඉල්ලනව. ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන්ගෙ කතා කෙටි නොකරන එක ගැන මා තමුන්නාන්සෙට ප්‍රශංසා කරනව. ඒ මක්නිසාද කියනවා නම්, නොයෙක් නොයෙක් පළාත්වලින් එන ගරු මන්ත්‍රීවරුන් තම තමන් නියෝජනය කරන කොට්ඨාශවල තිබෙන අඩුපාඩු ගැනත්, අයවැය ලේඛනයේ ඒ ඒ අයවැය ශීර්ෂ ගැනත් සම්පූර්ණ විවේචනයක් කරන්න බලාපොරොත්තු වන නිසා ඊට අවකාශ ලබා දීම අවශ්‍යයි, කියා මා හිතනව. සමහර අමාත්‍යාංශ මොන විධියකින්වත් විවේචනය කරන්න තරම් අවකාශයක් නොලැබෙනව නම් එය කනගාටුදායකයි. අමාත්‍යාංශ අතර අද ඉතාමත් වැදගත් එකක් තමයි කර්මාන්ත අමාත්‍යාංශය. ඒ වගේම වැදගත් අමාත්‍යාංශ තමයි අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, මංමාවත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ. මේ විධියට ගියොත් ඔය අමාත්‍යාංශ විවේචනය කිරීමට කොහෙත්ම අවකාශයක් නොලැබී යන්න පුළුවනි. මේ අවුරුද්දෙ පමණක් නොවෙයි, මීට පෙර අවුරුදු ගණනාවක්ම මෙහෙමයි වුණේ. ඒ නිසා මේ ගැන සැලකිල්ලක් දක්වන්න අපට සිදු වෙලා තියෙනව.

එපමණකුත් නොවෙයි, දැන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය එය පටන් ගත් කාලයේ වගේ නොවෙයි. දැන් ගරු මන්ත්‍රීවරුන් 157 දෙනෙක් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙ ඉන්නව. ඒ හැම මන්ත්‍රීවරයෙක්ම පාහේ තම තමන්ගෙ පළාත ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනව. එක් එක් අමාත්‍යාංශය මගින් කෙරෙන කටයුතු තම තමන් නියෝජනය කරන ඡන්දදායක කොට්ඨාශ කෙරෙහි බලපාන ආකාරය ගැන යමක් කියන්න හැම මන්ත්‍රීවරයම වාගේ බලාපොරොත්තු වන නිසා ඊට ඉඩ දෙන්න නම් ස්ථාවර නියෝග වෙනස් කර අඩු ගණනේ සැප්තැම්බර් 20 වැනිදා වන තුරු මේ සාකච්ඡාව ගෙන යාමට ඉඩ සලස්සන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනව. මේ අවුරුද්දෙත් ඒක කරන්න පුළුවනි, කල්පනා කරනව නම්. මේ මාසෙ 5 වනදා තමුන්නාන්සෙ ලංකාව හැර යනවය කියා අහන්න ලැබුණා. තමුන්නාන්සේ නො සිටියත් ඒක කරන්න පුළුවනි කල්පනා කළොත්. ඒක කරන්න පුළුවන් නම් තවත් දවස් පහක් හයක් ලබා දෙනව නම් හොඳයි.

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

I do not know whether we can have Allotted Days.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. රත්නායක මයා.**

*(திரு. ஏ. ரத்னாயக்க)*

(Mr. A. Ratnayake)

That is why I suggest that we change Standing Orders to enable us to have more time .

ඉතින් මේ අවුරුද්දෙත් කරන්න පුළුවනි. දූනුත් කරන්න ඉඩ තියෙනව. මේ මොහොතෙම වුණත් පුළුවනි. මේ මන්ත්‍රණ සභාවට ලැබෙන අන්තිම අවස්ථාව වෙන්න පුළුවනි අයවැය ලේඛනය සාකච්ඡා කරන්න වැඩ පිළිවෙලක් යොදන්න.

මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු වෙනුවෙන් අපි විශාල මුදලක් වැය කරනව. මේ අවුරුද්දෙ වැය කරනව තිස් කෝටියක් පමණ. තිස් කෝටියක් කියන්නෙ විශාල මුදලක්. මීට ඉහත අවුරුද්දෙ විසි අට කෝටියක් වියදම් කර තිබෙනව. 1962-63 අවුරුද්දෙ 20,98,00,000 ක් වැය කර තිබෙනව. ඊට එහා අවුරුද්දෙ කෝටි 23 ක් වියදම් කර තිබෙනව. 1960-61 අවුරුද්දෙ කෝටි 24 ක් වියදම් වුණා. 1959-60 අවුරුද්දෙ අට කෝටියක් වියදම් වුණා. ඊට ඉස්සර වෙලා නව කෝටියයි. මේ ආකාරයට ගත වූ දශ අවුරුද්ද තුළ කෝටි 163 ක් වියදම් .කර තිබෙනව.

**ඩී. එස්. සමරසිංහ මයා. (ප්‍රවෘත්ති හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. எஸ். சமரசிங்ஹ—தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. S. Samarasinghe—Parliamentary Secretary to the Minister of Information and Broadcasting)

දශ ලක්ෂ.

**ඒ. රත්නායක මයා.**

*(திரு. ஏ. ரத்னாயக்க)*

(Mr. A. Ratnayake)

දශ ලක්ෂවලින් කියනවා නම් දශලක්ෂ 1,639 යි. මිලියන්ස් 1,639 ක්ය කියන්නෙ කෝටි 163 ටයි.

තමන්නාන්සෙලාගේ කොට්ඨාශවලට හුඟක් සේවය කර තිබෙනවය කියන එක ගැන මා සන්තෝෂ වෙනව. එහෙත් මා නියෝජනය කරන කොට්ඨාශයට පසගිය දශ වර්ෂය තුළ වියදම් කරන ලද කෝටි 164 න් මට පෙනෙන්න තියෙන හැටියට නම්, මොන මොන දේ කරල තයෙනවද කියන්න මට බැහැ. මෙ තරම විශාල මුදලකින් මගේ ප්‍රදේශයට කොයි තරම් ලැබුණද, මොන මොන සේවාවන් කර තිබෙනවද කියන්න මා දන්නෙ නැහැ. මගේ කොට්ඨාශය ළඟම තිබෙන කොට්ඨාශය කුණ්ඩසාලේ කොට්ඨාශයයි. කුණ්ඩසාලේ මන්ත්‍රීතුමා (යූ. පී. වයි. ජිනදාස මයා.) මගේ පළාතේ ළඟම ඉන්න කිට්ටුවන්ත මන්ත්‍රීතුමා. එතුමා ආණ්ඩුවේ හොඳ මන්ත්‍රීවරයෙක්. රට ගැනත් බොහොම හොඳ තේරුමක් තිබෙනව. මේ තරම් විශාල ධනස්කන්ධයක් වියදම් කළත් මගේ පළාතෙ ජනතාවට හෝ මගේ රටට හෝ එයින් මොකක් වුණාදැයි අහන්න සතුටුයි. ඒ මක්නිසාද කියනවා නම්, ගල්ඔය වැනි ව්‍යාපාරවලට වුණත් හුඟක් වියදම් වූ බව ඇත්ත. එවැනි නොයෙක් සංවර්ධන වැඩවලින් මගේ පළාතෙ අයට විශාල සේවයක් සිදු වුණා. ඒවට මගේ කොට්ඨාශයෙන් 5,000ක් පමණ මිනිස්සු ගියා. ඉතින් එයින් එක්තරා සේවයක් සිදු වුණා. එහෙත් මේ කාල සීමාව ඇතුළතදී වුණු දේ ගැන කියන්නත් කනගාටුයි. අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට නම් කියන්න පුළුවනි, මඩවල ඉස්කෝලයක් දමල තියෙනවය කියල. පාඨශාලාවක් විවෘත කිරීමක් ගැන හෝ වෙන මොන වැඩක් ගැන හෝ පෙන්වන්නට පුළුවන්ද ? පාර්ලිමේන්තු ලේකම්වරයකු වූ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා මා නියෝජනය කරන කොට්ඨාශය ගැන මටත් වඩා හොඳින් දන්නවා. ඒ නිසා ඒ පළාතේ පුද්ගලයකුට හෝ ගමකට හෝ කරන ලද සේවයක් ගැන එතුමා කරුණා කර සඳහන් කරනවාද ? එසේ නැත්නම් ඉදිරි කාලයේ දී කරන්නට බලාපොරොත්තු වන සේවයක් ගැන සඳහන් කරනවාද ? මේ රුපියල් 164 කෝටියක මුදලක් වියදම් කිරීමෙන් අපට සිදු වූ සේවා මොනවාදැයි දැන ගන්නට කැමතියි. එම නිසා අයවැය ලේඛනය මගින් යම් යම් වැය ශීර්ෂ වෙනුවෙන් වෙන් කරන ලද මුදල් වැය කරන්නේ මොන ප්‍රතිපත්තියක් උඩද කියා නිතර සෙවිල්ලෙන් සිටීම ඉතාමත් අවශ්‍යයි. මෙය එක්කෙනෙකුට දෙන්නෙකුට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි. මෙය ආණ්ඩු පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

හෝ වේවා, විරුද්ධ පාර්ශ්වයේ හෝ වේවා, කාටත් පොදු කාරණයක්. වෙන් කරන ලද මුදල් වියදම් කරන්නේ මොන ප්‍රතිපත්තියක් උඩද කියා එක්කෝ මේ කාරක සභාව මගින් හෝ එහෙම නැත්නම් වෙන කාරක සභාවක් මගින් හෝ පරීක්ෂා කර බලනු ලැබීම අවශ්‍යයි. ඩොනොමෝර් ආණ්ඩු ක්‍රමය පැවති කාලයේදී නම් කටයුතු කෙරුණේ ඒ විධියටයි. ඒ කාලයේ මුදල් වියදම් කෙළේ ඒ ඒ ප්‍රදේශයේ අවශ්‍යතාව ගැන සලකා බැලීමෙනුයි. එම නිසා වෙන් කර තිබෙන මුදල් සාධාරණ පරිදි මෙන්ම අවශ්‍යතාව පරිදි බෙදී යනවාද කියා නිතර සෙවිල්ලෙන් සිටිය යුතුයි; පරීක්ෂාකාරී විය යුතුයි. එසේ පරීක්ෂා කිරීම පිණිස කාරක සභාවක් පත් කරනවා නම් හොඳයි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන ලද මුදලින් රුපියල් 40 ලක්ෂයක් ඉතිරි වී තිබෙන බව ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය අගෝස්තු මාසයේදී හදිසියේ සොයා ගත්තා. දැන් ඒ මුදල ප්‍රයෝජනවත් වැඩ සඳහා යෙදවීමට එතුමා ක්‍රියා කරගෙන යනවා. මොන මොන කාරණා සඳහා මුදල් වියදම් වුණාද, කොපමණ මුදලක් වියදම් වුණාද, යනාදී කරුණු ගැන සමහර විට ඇමතිවරුන්ටත් අවබෝධයක් නැහැ. 30 කෝටියක් කියන්නේ පොඩි මුදලක් නොවෙයි. මේ ගරු සභාවට පත් වන විට ආණ්ඩුවේ මුළු ආදායම රුපියල් 10 කෝටියයි. ඒ කාලෙත් මිනිසුන් ජීවත්ව සිටියා. 30 කෝටියක් වැනි විශාල මුදලක් වියදම් කරන විට ඒ ගැන පරීක්ෂාකාරී විය යුතුයි.

අනික් අතට වියදම් කරන ලද රුපියල් කෝටි 164ක මුදල ගැන තව දුරටත් සලකා බලමු. එක පවුලකට රුපියල් 4 දහ ගණනේ වෙන් කළත් ඒ මුදලින් පවුල් 4 ලක්ෂයක් පැලපදිංචි කරන්නට පුළුවනි. විදුලි බලය යොදා ක්‍රියා කරන රෙදි විවීමේ යන්ත්‍රයක් සඳහා රුපියල් 5 දහසක් වියදම් කරන්නට වේ යයි කල්පනා කරනවා නම් පවුල් 3 ලක්ෂයකට පමණ ඒ මගින් සහනයක් සලසන්නට පුළුවනි. ඒ පවුල් 3 ලක්ෂයකට ඒ මගින් ජීවනෝපාය සලසා දෙන්නට පුළුවනි. මා ආණ්ඩුවට දෙස් කියනවා යයි සලකන්නට එපා. වියදම් කරන ලද මුදලේ ප්‍රමාණයට ප්‍රයෝජනයක් සිද්ධ වී තිබෙනවා දැයි අප සලකා බලන්නට ඕනෑ. ඒ ගැන සලකා බලා අවශ්‍ය විවේචන කිරීමට ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ද ඉදිරිපත් වෙතොත් බොහොම හොඳයි.

ඉඩම් සම්බන්ධයෙන්ද යමක් කියන්නට කැමතියි. අපේ රටේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වන බව කවුරුනුත් දන්නා දෙයක්. පසුගිය අවුරුදු 25 ඇතුළතදී මේ රටේ ජනගහනය දෙගුණයකින් වැඩි වී තිබෙනවා. නමුත් ඒ ප්‍රමාණයට ඉඩම් වැඩි වුණේ නැහැ. ජනගහනය වැඩි ප්‍රදේශවල උදවියට ආණ්ඩුවේ ඉඩම් දීම අවශ්‍යයි. ඉඩම් තිබෙන ප්‍රදේශවල උදවියට ඉඩම් දීම ගැන පළමුවෙන් සලකා බැලුවාට කමක් නැහැ. නමුත් අනික් ප්‍රදේශවල අයටත් ඉඩම් දිය යුතුයි. උතුරු-මැද හා නැගෙනහිර පළාත්වල ඉඩම් ඒ ප්‍රදේශයේ පදිංචි අයට පමණක් සීමා කිරීම ගැන අප විරුද්ධ වුණා. එහෙම සීමා කිරීම ගැන අපි සතුටු නැහැ. හම්බන්තොට ඉඩම් අක්කර 40,000ක් වෙන් කරන්නට යනවය කීව. හම්බන්තොට ඉඩම් නැති අයට ඉඩම් දීම ගැන අපි සතුටුයි. ඒ අයට ඉඩම් දීල, ඊළඟට ලංකා වාසී අනික් අය ගැනත් කල්පනා කළ යුතු බව මම කියන්න කැමතියි.

ඊළඟට අපි ආධාර දීම ගැන බලමු. මේ වැය ශීර්ෂයේ රුපියල් 30,00,00,000 ක මුදලක් වෙන් කර තිබෙනව. මේ තරම් විශාල මුදලක් වියදම් කරල, ඉඩම් අරගෙන පදිංචි කරන්නෙ කී දෙනාද? 15,000 යි. වියදම් කරන මුදලෙ හැටියට ඒ ප්‍රමාණය කොහෙත්ම මදි බව මගේ අදහසයි. අපි රුපියලක් වියදම් කරනව නම් එයින් ශත සියයක ප්‍රයෝජනයක් ලැබෙන්නට ඕනෑ. මේ වැය ශීර්ෂය යටතේ වියදම් කරන මුදලින් එවැනි ප්‍රයෝජනයක් නොලැබෙන බවයි, මම තමුන්නාන්සෙට කියා සිටින්නෙ. නොයෙකුත් මන්ත්‍රීවරුන් නොයෙකුත් තැන්වල කෙරෙන දූෂණ ගැන විස්තර කරන විට අපට වැටහෙනව, මේ මුදල් බොහෝ තැන්වල අපතේ යනවා ඇත කියා. නොයෙකුත් විධියේ කොන්ත්‍රාත්කරුවන්ට විශාල වශයෙන් මුදල් ගෙවීමෙන් අපතේ යාම් සිද්ධ වෙනවා ඇතැයි අපි විශ්වාස කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ.භා. 7.15

තවත් කරුණක් කියන්න තියෙනව. මගේ පළාතේ ඔය විධියට ඉඩම් අරගෙන පවුල් පදිංචි කරල ගෙවල් සාදා දෙනවය කියා ඒ අයට පොරොන්දු වුණා. රුපියල් 2,000 ක් හෝ 2,250 ක් වියදම් කරල ගෙවල් හදා දෙනවය කියා පොරොන්දු වුණා. මුලදී රුපියල් 75යි දුන්නෙ. ඊට පස්සෙ ගෙවල් හදා ගන්නය කියා රුපියල් 750 ක් දුන්න. උළු සෙවිලි කර දෙනවය කිව. නමුත් මේ වන තුරු ඉතාම සවල්ප දෙනකුගේ ගෙවලට පමණයි, උළු සෙවිලි කර දුන්නෙ. අනික් අයගෙ ගෙවලට උළු සෙවිලි කරල නැහැ. මීගමු වත්ත අරගෙන බෙදා දෙන විට කිව, ගෙවල් හදා උළු සෙවිලි කර දෙනවය කියා. බොහොම දෙනෙක් ඒ පොරොන්දුව පිටයි, ආවෙ. මේ තරම් මුදලක් වියදම් කරලවත් ඒ දුප්පත් මිනිසුන්ට දුන් පොරොන්දුව ඉෂ්ට කරන්න බැරි නම් ඒක කනගාටුදායකයි. ඒ දුප්පත් මිනිසුන්ට උළු සපයා දෙන්නම් කියා වූ පොරොන්දුව—රුපියල් 750 ක උළු දෙන්නම් කියා වූ පොරොන්දුව—ඉෂ්ට කරන ලෙස ඇමතිතුමාගෙනුත්, දෙපාර්තමේන්තුවෙනුත් මම ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ වටේටම විශාල තේ වතු තියෙනව. මුළු ජීවිත කාලයෙම අපේ ගම්බද ජනතාවට ඉඩකඩම් නැති නිසා දුක් විඳින්න සිදු වී තිබෙනව. සමහර ගම්වල වැසියන්ට, මරණයක් වුණොත් මිනිය වළලා ගන්න ඉඩමක් නැහැ. කල්පනා කර බලන්න, කොයි තරම් දුඃඛිත තත්ත්වයක්ද කියා. මරණයක් සිදු වුණාම මිනිය වළලා ගන්න තැනක් නැත්නම්, මිනිය ගෙදර තියෙද්දී ගමේ ඉඩම් තියෙන අයගේ ගෙයක් ගෙයක් පාසා ගොස් අනේ අපට මේ මිනිය වළලා ගන්න ඉඩ දෙන්නය කියන්න සිදු වෙනව නම්, එය කොයි තරම් කනගාටු දායක තත්ත්වයක්ද කියා මම තමුන්නාන්සෙලාගෙන් අහනව. ඒ නිසා මෙය ඉතාමත් වැදගත් කාරණයක් හැටියට සලකන්න ඕනෑ. විශේෂයෙන් උඩරට බොහෝ පළාත්වල—ජනයා තදබද වී ජීවත් වන පළාත්වල—මිනී පිට්ටනියකට වුවමනා අක්කර දෙක හෝ අක්කර 3 වහාම දෙන්න ඕනෑ. අපේ ගම් කාර්‍ය සභාවක් මේ සඳහා යෝජනාවක් කරල, ඉඩමකුත් පෙන්නල කරන්න පුළුවන් සෑම දෙයක්ම කළා; නමුත් තවම ඉඩම් අක්කර දෙක ලැබුණේ නැහැ. ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව, ඒ විධියෙ ඉල්ලීම් ඉක්මණින් ඉටු කරන ලෙස. හැමෝටම ලියනව, ටෙලිග්‍රෑම් ගහනව; නමුත් වැඩක් වන්නෙ නැහැ. ගෙදරක මරණයක් සිදු වුණාම අනේ මගේ දරුවා වළලා ගන්න ඉඩ ටිකක් දෙන්නය කියා ගෙයක් ගෙයක් ගණනේ ඇවිදින්න සිදු වෙනව නම්, අද ලංකාවේ ගම්බද ජනයා එහෙම විපත්තිදායක තත්ත්වයකට පත් වෙලා ඉන්නව නම්, ඒ අය වහාම ඒ තත්ත්වයෙන් නිදහස් කිරීම ආණ්ඩුවේ යුතුකමක් බව මම ගරු ඇමතිතුමාට මතක් කරන්න සතුටුයි. පසු ගිය අවුරුද්දෙ, එහෙම නැත්නම් ඊට එපිට අවුරුද්දෙ තමුන්නාන්සේලා හොඳ තීරණයක් කර ගත්ත, මේ විධියෙ ඉඩම් තදබදය තිබෙන පළාත්වල ඇති ලොකු වතුවලින් සියයට දෙකක් අරගෙන ගම්මුන්ට බෙදා දෙන්නය කියා. නමුත් දැන් 18 මාසයක් ගත වී ඇතත්, එය තවමත් ක්‍රියාවෙ යෙදී නොතිබීම ගැන මම කනගාටු වෙනව. නොයෙක් ඉඩම් පරීක්ෂා කර බලා තිබෙන නමුත්, අපේ කොට්ඨාශයට නම් තවමත් ඒ ක්‍රමය අනුව ඉඩම් ලැබී නැහැ.

තවත් බොහෝ වැදගත් නීතියක් තමුන්නාන්සේලා නීතිගත කරගෙන තිබෙනව. උඩ රට සුළු නගරවල වෙසෙන ජනයා, තමන් පදිංචිව සිටින ඒ ඉඩම්වල, එහෙම නැත්නම් ගෙවල අයිතිකාරයන් නොවෙයි. ඔවුන් වෙළඳාම් කටයුතු ආදිය කරන කඩ ඔවුන්ට අයිති නැහැ. එම නිසා තමුන්නාන්සේලා නීතියක් පැනෙව්ව, ඒ කඩ ආදිය ආණ්ඩුවෙන් මිලට ගෙන ඒවායේ පදිංචිකරුවන්ට අයිති කර දිය යුතුය කියා. බොහෝ තැන්වල ඒ නීතිය අනුව කඩ මණ්ඩි රජයෙන් අරගෙන ඒ නීතිය ක්‍රියාත්මක කර තිබෙනව. එසේ අරගෙන දී ඇති ස්ථාන සම්බන්ධයෙන් මා ළඟ ලැයිස්තුවක් තිබෙන නමුත් මා ඒ ලැයිස්තුව කියවන්න අදහස් කරන්නෙ නැහැ. නමුත් මගේ පළාතේ තිබෙන එවැනි කඩමණ්ඩි දෙකක් සම්බන්ධයෙන් තවමත් ඒ නීතිය ක්‍රියාත්මක වී නැහැ. මඩුල්කැලේ කඩ මණ්ඩිය එයින් එකක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]
මා විශෙෂයෙන් ඉල්ලා සිටිනව, ඒ කඩ මණ්ඩි රජයෙන් අරගෙන යට කී නීතිය අනුව ඒවායේ පදිංචිකරුවන්ට ඒවා අයත් කර දෙන්නය කියා.

ඊ ළඟට මම කියන්න කැමතියි, තද වර්‍ෂා කාලෙට අපේ ප්‍රදේශයේ කුඹුරු, වැස්සට හා ගංවතුරට අසු වී පාලු වී යන බව. කුඹුරු එසේ පාලු වූ අවස්ථාවෙදි ආණ්ඩුවෙ ප්‍රතිපත්තියක් තිබෙනව ඒවායේ ඇළ දෙළ කපා සකස් කර සාදා දෙන්නට. නමුත් දැන් අවුරුදු තුන හතරක් තිස්සෙම ඒ ප්‍රදේශයෙ කුඹුරු මේ ආකාරයට පාලු වී ඇතත් ඒ කුඹුරුවලට කිසිම සහන යක් නොලැබීම ගැන මා කනගාටු වෙනව.

මේ ආදි කරුණු ගැන සලකා බලන විට සභාපතිතුමනි, මගේ ප්‍රදේශය ගැන හොඳ අවබෝධයක් තිබෙන නිසා මට කියන්න පුළුවනි, ඒ ප්‍රදේශයේ පළාත්වාසීන් සිය ගණනක්වත් එක් කරගෙන ගොස් අසුවල් ජනපදයේ පදිංචි කෙරෙව්වාය, අසුවල් ඉඩම අරගෙන බෙදා දුන්නාය, නමුත් වෙන මොනම සහනයක්වත් සලසා දුන්නාය කියන්න පුළුවන්කමක් නැත යන බව. මට නම් පෙනෙන්නෙ නැහැ, මෙපමණ විශාල මුදලක්, කෝටි 164ක්, වියදම් කර තිබෙන නමුත්, ඒ පළාතේ වැසියන්ට මොන ප්‍රයෝජනයක් වත් සිද්ධ වුණාය කියා. ඒ පිළිබඳව මගේ කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනව.

**ඒ. එච්. මාකන්-මාකර් මයා.** (මඩකලපුව දෙවන මන්ත්‍රී)
*(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக் களப்பு இரண்டாம் அங்கத்தவர்)*
(Mr. A. H. Macan Markar—Second Batticaloa)

Mr. Chairman, the first question that I should like to pose is on the policy of this Government in regard to colonization schemes, both major colonization schemes and minor colonization schemes. In the case of the major colonization schemes, such as Allai and Kantalai, allottees or colonists were selected from predominantly Sinhala-speaking areas. I think the majority community were given an adequate number of allotments in these schemes. I find, however, in the case of the colonization schemes coming under the Gal Oya Development Board, that the Muslims of the Eastern Province, especially those in the southern part of the Eastern Province, which is now the Amparai District, have had a raw deal in that they have not been given sufficient allotments in proportion to their numbers. As a matter of fact, the scheme was first mooted on the initiative taken by the All-Ceylon Moors' Association as far back as 1937, and the Ceylon Moors looked forward to this scheme as one which would prove a great boon to the Ceylon Moor population of the Batticaloa South area. I am sorry to say, however, that there has been a great betrayal of the Ceylon Moor Community by the Governments of this country.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

The U. N. P. Government, too ?

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

I am sorry to admit that that is so. I trust that even at this late stage the Ceylon Moor population of that area will be given a reasonable allocation of land on the right bank.

Then we come to the major colonization schemes in the predominantly Sinhala-speaking areas, such as the Chandrikawewa Scheme, the Walawe-ganga Scheme, and the schemes in the Polonnaruwa and Anuradhapura Districts. I feel that, in fairness to the Tamil-speaking population, there should be some measure of reciprocity in that a certain proportion of the lands in these various major colonization schemes should be given to the Tamil-speaking people according to the strength of their numbers. If, say, 80 per cent. of the land in such major colonization schemes in the Sinhala-speaking areas is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

allotted to the Sinhala-speaking people, 20 per cent. should be reserved for the Tamil-speaking people, particularly of the Eastern and Northern Provinces. That is the only way in which we can ensure that certain minority sections of the population do not predominate in any particular area but will get mixed up with the population, whether Sinhala or Tamil-speaking, and bring about a uniform distribution of population throughout the Island. Once a scheme such as I contemplate is implemented the proposal for federalism would die a natural death.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

They must inter-marry also.

මාකන්-මාකර් මයා.
(ஜனாப் மாக்கன் மாக்கர்)
(Mr. Macan Markar)

Certainly.

Then we come to the question of minor irrigation works. In most minor irrigation schemes it is only the long standing residents of a particular district or a D. R. O's division who are given land. However, in the case of Kitulwewa Scheme coming within Eravur Pattu in the Batticaloa District, I find that the Ministry of Land has insisted on a certain percentage of land being reserved for colonists from other districts. This is very unusual but if this is going to be the practice with regard to all minor irrigation schemes then the same principle should apply to all areas without discrimination. I hope the Hon. Minister will act fairly in this matter.

There is a tendency on the part of the Hon. Minister to treat certain sections of the population with favour and discriminate against other sections on political, racial, religious or other grounds. I hope that in future he will treat citizens of Ceylon equally without discrimination.

There was a recent communique issued by the Ministry of Land stating that no more illicit encroachments would be tolerated and that only old encroachments—encroachments that took place some years ago—would be regularized. With regard to this question of illicit encroachment, I find that the trouble is that the kachcheris do not act as fast as they should. We get a number of applications from our constituents, who are landless, for L. D. O. lands for purposes of cultivation. When these applications are forwarded to the kachcheri there is considerable delay in the holding of land kachcheries for the allocation of land. The result is that these people, who are more enterprising than the officers who man Government departments, encroach on these lands, clear them and cultivate them. I think such pioneers should be encouraged instead of being discouraged.

ප. භා. 7.30

However, if it is really the policy of the Government to prohibit and penalize illicit encroachers from now onwards, I trust that this policy will be implemented without any discrimination in the sense that while illicit encroachers in Polonnaruwa District or Anuradhapura District will be allowed, in Batticaloa District they will be disallowed. So long as the rule applies equally to all parts of the country without discrimination, then our position is safeguarded in that our constituents will realize that they are not treated differently from the residents of other areas.

I find that the whole land policy of this Government is directed towards the promotion of small-holdings—peasant proprietors—and that there is very little room left for large farms except, perhaps, through the alienation of the so-called marginal lands which are given to capitalists. I find that there is no scheme whereby large-scale agriculture through mechanized means is promoted. So long as we confine ourselves to small-scale peasant allotments of three acres of paddy land and two

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මාකන්-මාකර් මයා.]

acres highland—and livestock—I cannot say whether we will ever be able to solve the problem of meeting our own food requirements. As a matter of fact, the modern tendency is towards mechanization of agriculture and I honestly feel that at least in certain areas an effort should be made to try out large-scale farms as an experiment so that we may be able to find out whether such modes of agriculture would suit our country and its people.

Then there is a matter particularly concerning the Batticaloa Electorate, and that is the proposal for the extension of the left bank channel of the Senanayake Samudra to the Unnichchai reservoir. I am informed that there is only a distance of seven miles separating the present left bank channel of the Senanayake Samudra from the Unnichchai reservoir, and if only this channel could be extended so as to pass through the Palaugamuwa Tank and the Adaichchalkal Tank and then on to Unnichchai, I am sure the Batticaloa District would be able to double its production of paddy, that is, the cultivators on the western bank of the Batticaloa Lagoon and also those coming under the Unnichchai Scheme would then be able to undertake at least two cultivations a year, that is, the *Munmari* cultivation and the *Kalapokam* cultivation. I trust that the Hon. Minister would see that the left bank channel is extended to Unnichchai as early as possible.

Then there is the Mundeni Aru which flows into and out of the Rugam Tank. During heavy rains this river is in spate with the result that considerable flooding is caused in these areas. Furthermore, owing to this difficulty there is no possibility of constructing anicuts along the length of the Mundeni Aru so as to be able to utilize the waters of this river during the *Kalapokam* cultivation.

I must say that we are very fortunate in having as Divisional Irrigation Engineer an officer, like Mr. K. Velauthampillai, for the eastern region. He is one of those few public officers who is devoted to his duty and shows considerable enthusiasm in getting things done and has always been very sympathetic to the needs of the cultivators. I wish there were many more such officers like Mr. Velauthampillai. At the moment a preliminary investigation is being carried out by him to see whether the excess water from the Mundeni Aru could be diverted to a parallel river valley which is a few miles further to the north, and, if his preliminary investigation indicates that such a scheme is feasible, I hope the Hon. Minister would not place obstacles in the way of the implementation of this proposal. Once the diversion of this excess water has taken place, it would be possible to construct small anicuts all along the river and enable most of the cultivators to do two cultivations a year.

In this connection I am sorry to say that ever since the Hon. Minister assumed office he has avoided giving us any major irrigation schemes in the Batticaloa District. As a matter of fact a number of large schemes have been abandoned and I am sorry that though he is usually fair-minded he should have adopted such a discriminatory and racial policy towards the Tamil-speaking people of the Batticaloa area.

There is another matter which personally concerns the Hon. Minister in that his brother the hon. Member for Polonnaruwa (Mr. A. H. de Silva) is himself interested in it, and it invariably leads to a clash of interests between the residents of Eravur and the residents of Thambankaduwa. I refer to tobacco cultivation in the Thambankaduwa District on the banks of the Maheweli-ganga. From time immemorial it was the residents of Eravur who had gone to Thambankaduwa and cultivated tobacco, the cigar tobacco used in making Jaffna cigars in the *wadies* alongside the Mahaweli-ganga. But ever since the present Minister and subsequently his brother became the Member of Parliament for Polonnaruwa he has naturally wanted to help his own electorate

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and, instead of continuing the old system whereby lands are auctioned or given on tender, he has introduced a system whereby preferential treatment is given to the inhabitants of Thambankaduwa. I have no objection to some preference being given to them, but there has been absolute descrimination on his part. There are two sections Egodapattu and Medapattu. Now, whenever lands adjoining a particular village say, Sungavil, are being alienated in the land kachcheri, first preference is given to the inhabitants of Sungavil. That is fair and reasonable. But the second preference is given to the people who occupy the whole of Egodapattu or to the members of the co-operative society that exists in that particular area. It is only after their needs have been met that the residents of Eravur are given lands. In fairness to the people of Eravur, I must say they are some of the best cultivators in the Island. They are prepared to spend three or four months in the thick jungle, risking their lives on the banks of the Mahaweli-ganga to do tobacco cultivation, but it is a pity that there is no place for brave and adventurous cultivators of this type.

Then there is another case of discrimination by the Hon. Minister in regard to alienation of land to the Muslim residents of Koddaimunai in Batticaloa Town. An application was made for acquisition of a certain extent of land for the benefit of these poor residents who are labourers, but the Hon. Minister said that it is not the policy of the Land Department to acquire land for such a purpose.

ගරු සි. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The Irrigation Council does that.

මාකන්-මාකර් මයා.
*(ஜனுப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

As I was saying I never expected the Hon. Minister to be so discriminatory in the treatment of Muslims in that particular area. I hope he will try somehow or other to give them some alternate land, especially because these people live under slum conditions with four or five families in one house, and that too in the heart of Batticaloa Town, in Koddaimunai. I think they should be given an opportunity to occupy land in the near neighbourhood. Most of them are daily-paid workers and, as I said, they live under very poor conditions.

With regard to the T. P. houses I find that a subsidy of Rs. 2,250 is given in respect of the fisheries houses, which are really permanent buildings built of brick with a permanent roof, and they can last for 10 to 15 years. In the case of the T. P. houses given to peasants, I must say in fairness to the Hon. Minister that he has provided them with permanent roofing which I think, is an advantage, but they would be made more permanent if they could be built with brick. I say this for the simple reason that, when you make a capital investment it is better to spend a little more money and make the buildings permanent which will last for 15 to 20 years, rather than giving these people houses which will last only for 5 or 6 years.

ගරු සි. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I will accept that.

මාකන්-මාකර් මයා.
*(ஜனுப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

I would also like to point out that the T. P. houses are somewhat large and unwieldly; the dimensions are too large. Peasants could live in T. P. houses half that size provided they are made more permanent and durable.

There is one more matter to which I would like to refer and that concerns the Electrical Department. I feel that we have been somewhat

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මාකන්-මාකර් මයා.]

harsh with the electrical engineers by refusing them their demand for a risk allowance of 15 per cent. I understand the Hon. Minister himself is sympathetic but unfortunately the Cabinet is not prepared to toe the line. We should realize that these electrical engineers could earn double their salary if they go elsewhere. Unless we treat the intelligenzia of this country with perfect fairness, I think, their heart would not be in the job. I would, therefore, appeal to the Hon. Minister to use his powers of pursuasion to see that the Cabinet agrees to pay this risk allowance in view of the fact that the engineers do not just sit at their desks or at their drawing boards but actually go and handle machinery and other electrical equipment. So, it is only fair that they should be given this risk allowance of 15 per cent that they are demanding. If we do not treat the intelligenzia of this country with reasonableness I do not think we will ever be able to progress.

"72 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 5,29,909ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

72 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 28,100**

*வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவருஞ் செலவு, ரூ. 28,100*

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 28,100*

"72 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 28,100ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

72 ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

**6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම, රු. 3,000**

*வாக்குப்பண இல. 6.—பொருளாதார அபிவிருத்தி—மீண்டுவருஞ் செலவு, ரூ. 3,000*

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 3,000*

"72 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 3,000ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

72 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදි.

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 5,50,00,000**

*வாக்குப்பண இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப் பொருட் செலவு, ரூ. 5,50,00,000*

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 55,000,000*

"72 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 5,50,00,000ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

72 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදි.

**73 වන ශීර්ෂය.—ඉඩම් කොමසාරිස්**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 49,31,000**

*தலைப்பு 73.—காணி ஆணையாளர்*

